سنهالي

للمسلمين الجدد

سلسلة الهداية (2)

දෙවියන් වහන්සේ කවරෙක්ද ?

(ඉස්ලාමීය දෘෂ්ඨිය)

الله

හොජතුල් ඉස්ලාම්
ආචාර්ය මුහම්මද් ජවාද් බහොනර්

අසීමිත කරුණාවන්ත වූත්
අපරිමිත දයාවන්ත වූත්
අල්ලාහ්ගේ නාමයෙනි

Era of Appearance Foundation
مؤسسة عصر الظهور

E-mail:info@thohor.com
eaf-q8@yahoo.com
www.eaf-q8.com
www.thohor.com
P.O.Box:11111 Al-Dasma-Kuwait

الطبعة الأولى

1429هـ - 2008م

موبايل: 6703601 - 9796703 - 7662770 - (965+)

දෙවියන් වහන්සේ කවරෙක්ද ?

(ඉස්ලාමීය දෘෂ්ඨිය)

හොජතුල් ඉස්ලාම්
ආචාර්ය මුහම්මද් ජවාද් බහොනර්

ප්‍රකාශනය :
දරුල් හුද ප්‍රකාශකයෝ
කොළඹ - 10

A few words on

KNOWING ALLAH

(Sinhala)

DEVIYAN WAHANSE KAVAREKDA
(ISLAMEEYA DRUSHTIYA)

By:
Hojjatul Islam
Dr. Muhammad Javad Bahonar

Price: 70/-

Published By:
Dharul Hudah Publishers
Colombo - 10.

අසීමිත කරුණාවන්ත වූද අපරිමිත දයාවන්තවූද අල්ලාහ් ගේ
නාමයෙනි.

පළමුවන පරිච්ඡේදය

ඉස්ලාමය හඳුන්වා දුන් පරිදි අල්ලාහ්

ඉස්ලාම් හී පණිවුඩය තව්හීද් හෙවත් දේව ඒකත්වය පිළිබඳ විශ්වාසය මත පදනම් වී තිබේ. නියම, අව්‍යාජ, දෙවියාණන් වූද, විශ්වයේ මැවුම්කරුවාණන් වූද; අප විසින් නිවැරදිව හඳුනාගෙන නැමදුම් කළ යුත්තා වූද; සියලු අලංකාරවත් වර්ණවන්නා, මිථ්‍යා ඇදහිලි හා මායා මුළාවන්ගෙන් සම්පූර්ණයෙන් මිදුණාවූත් සියලු අමූලික පුරාවෘත්තයන්ගෙන් තොරවූද; සියලු දූෂණ හා දුර්වලත්වයන්ගෙන් පිරිසිදු වූද; සරල හා සියලු දෙනාටම තේරුම් ගත හැකි වන්නාවූද; සර්ව බලධාරී වූ අල්ලාහ් ගැන මැනවින් අවබෝධ කර විශ්වාසය කිරීම එහි සාරයයි. මිනිස් චින්තනයට හා බුද්ධියටත් දේවත්වය සොයා ඇවිදින මිනිස් ස්වභාවයේ දියුණුවටත් ඉටු වූ ඉමහත් මෙහෙයකි. ඉස්ලාමීය සමාජීය හා සදචාර දර්ශනයේ, ඉස්ලාමීය ලෝක දෘෂ්ඨියේ (World View) පදනම වන්නේද තව්හීද් හෙවත් මෙමඑක දේව විශ්වාසයයි.

අල්ලාහ් - විශ්ව දෙවියා

අල්ලාහ්, ඉස්ලාමය හඳුන්වා දුන් පරිදි සහ සියලු ජනයින් විසින් ඔහුව හඳුන්වනු ලබන පරිදි ''සියළු ලෝකයේ ස්වාමියාය''(ශු.කුර්ආනය 1:1)

එනම් ස්වාමියා, මැවුම්කරුවා සහ සියළු මැවීම් වල පාලකයා ඔහුය. ඔහු අල්ලාහ්ය.

විවිධ දර්ශන වල, නිකායන් වල සහ ආගම් වල අනුගාමිකයන් විසින් ඔහුට ආරෝපණය කරන ලද සීමාවන් මෙසේ අතුරුදහන් විය. උදහරණයක් වශයෙන් යුදෙව්වන්ට ඇත්තේ, වාර්ගික හා ජාතික දෙවි කෙනෙකි. යුදෙව් ආගම ඒකදේවවාදී ආගමක් සහ එම දෙවියන් වහන්සේට පමණක් නමස්කාර කිරීම වශයෙන් පැවතුණද 'ජෙහෝවා' ඔවුන්ගේම දෙවියා වශයෙන් යුදෙව්වන් සැළකූ අතර ඔහුගේ සැළකිල්ල හා කරුණාව තනිවම ඔවුන් වෙත පමණක්ම පිරිනැමෙනු ඇතැයි ඔවුහු බලාපොරොත්තු වූහ. මේ අනුව අනෙකුත් වාර්ගිකයන් සහ ජාතීන් තමන් සඳහා වෙනත් දෙවියෙක් සොයා ගත යුතු තත්ත්වයක් එළඹේ.

ශිෂ්ඨාචාරය, විද්‍යාව සහ දර්ශනයේ මධ්‍යස්ථානය ලෙස පැවති විශ්ව කීර්තියට පත් විද්‍යාඥයින් සහ දර්ශනිකයින්ගෙන් පිරි පුරාණ ග්‍රීසියේද විවිධ වාර්ගික හා ජාතික දෙවිවරු පැවතුණහ. එම දෙවිවරුන්ගේ ප්‍රධානියා ලෙස දෙවිවරුන්ගේ දෙවියෙක්ද සිටින බව සමහරු විශ්වාස කළහ.

ඉස්ලාම් ධර්මය හඳුන්වා දෙන දෙවියා සියලු ජාතීන්ට සහ ලෝකවාසී සියලු ජනයින් සඳහා වූ විශ්වසමස්ත, සදතනික දෙවියාය. ඔහු ලෞකික හෝ ලෝකෝත්තර පමණක් නොවන අතර හුදෙක් එක්තරා ජන කොට්ඨාශයකට පමණක් අයිති දෙවියෙක් ද නොවන්නේය.

අල්ලාහ් අද්විතීය වේ (2:22,117,165,)

දෙවියන්වහන්සේ එකම එක්කෙනෙක් පමණි. ඔහු අල්ලාහ්ය. බහුදේවවාදී විශ්වාසයට මෙය පටහැණිය. විවිධ ක්ෂේත්‍ර වල පාලනය සඳහා වෙන වෙනම දෙවිවරුන් පවතින බව ප්‍රචලිත මිථ්‍යාව ඉන් බැහැර කරයි. සශ්‍රීකත්වයට, මැවීමට, පාලනයට, යුද්ධයට, දඬුවමට, දැනුමට, සම්පතට, බල පරාක්‍රමයට වැනි නොයෙකුත් ක්ෂේත්‍ර සඳහා නිශ්චිත කාර්යභාරය හා තත්ත්වය උසුලන වෙන වෙනම බලවත් දෙවිවරුන් පවතින බවට ඇති විශ්වාසය ඉස්ලාම් මුළුමනින්ම බැහැර කරයි.

ඉස්ලාම් සියලු අරමුණු හා කටයුතු සඳහා එකම දෙවියෙකුව හඳුන්වා දෙයි.

ඔහු අල්ලාහ්ය.

සොරොස්ත්‍රියානු ආගම ද මූලික වශයෙන් ඒකදේවවාදී මූලධර්මයෙන් යුතුවිය. එහි අනුගාමිකයන් කල්යත්ම, දෙවියා සහ සාතන්, යහපත් දෙවියා සහ දුෂ්ඨ දෙවියා - ආදී වශයෙන් ද්විත්වයක් ගැන කතා කර ඇත.

කතෝලික විශ්වාසය අනුව ජේසු තුමා දෙවියන් වහන්සේගේ පුත්‍රයාය. ජේසුතුමාගේ සැබෑ ස්වභාවය හඳුනා ගැනීමෙ තර්කය ඉතා ප්‍රබල එකක් විය. එතුමා තෙමෙම දෙවියන් වහන්සේ ද, නැත්නම් එතුමා දෙවියන් වහන්සේ ගේ ප්‍රත්‍යක්ෂ සාක්ෂියක් ද , දෙවියන් වහන්සේ සමග එතුමාගේ සම්බන්ධ ය කෙබන්දක් ද ? වැනි නොයෙකුත් විද්‍යාත්මක හා දර්ශනික වාද විවාද පැන නැගුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පියාණන් වහන්සේ, පුත්‍රයාණන් වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ ආදී ත්‍රිත්ව සංකල්පයට එළඹන ලදී.(ශු.කු.5:75/:170)

දේව දූතයන් දෙවියන්ගේ දූවරුන් ලෙස සැළකූ මිථ්‍යා දෘෂ්ඨියක් පූර්ව ඉස්ලාමීය යුගයේ අරාබිවරුන් සතුව පැවතුණි.(37:159)

ඉස්ලාම් පවසන්නේ දෙවියන් වහන්සේ එකම දෙවියෙකු බවයි. ඔහුට පුත්‍රයෙකු, දූවක, මවක, පියෙකු හවුල්කරුවෙකු හෝ සහායකයෙකු නොමැත්තේය.(112:1/4)(37:159)

ඔහුගේ කැමැත්ත හා අනුමැතිය නොමැතිව මැදිහත් කරුවෙකු වශයෙන් ක්‍රියා කළ හැකි කිසිවෙකු ද නොමැත්තේය.(2:254)

අල්ලාහ් ට හවුල් කරුවෙකු නැත. එනම් ඔහුට ඔහුගේ කටයුතු වලදී කිසිවෙක් හෝ කිසි දෙයක් සහයෝගය නොදක්වන්නේය. නමුත් අල්ලාහ් යම් නිශ්චිත කටයුතු කරවීම සඳහා යම් උපක්‍රමයක් හා හේතු සාධක මැවීම ඔහුට ම තීරණය කළ හැකිය. උදාහරණයක් වශයෙන්, තාපය සහ ආලෝකය ලබාදීමටද තවත් සමහර ප්‍රයෝජන සඳහා ඉරද මිනිසාට ජීවය ලබාගැනීමට හා භුක්ති විඳීමට ආහාර පාන ද ඔහු මවා ඇත්තේය. නමුත්, මිනිසාට තාපය ආලෝකය හෝ ජීවය ආහාර ලබාදීමට ද ඔහුට උදව් කරන සූර්යයා හෝ ආහාර අල්ලාහ් ගේ සැළසුම් වල හවුල්කරුවෝ නොවෙත්. මේවා ඔහුගේ ඇතැම් නියෝග ඉටුකිරීම සඳහා ම මවන ලද නිශ්චිත මෙවලම් පමණි.

සූර්යයා දේව කැමැත්ත අනුව තාපය හා ආලෝකය ලබාදෙයි. ශුද්ධවූ නබිවරු දිවැසිවරුන් ජනයා සත් මඟෙහි මෙහෙයවන්නේ ඒ දේව සැළැස්ම හා කැමැත්ත පරිදිය. යෝග්‍ය යයි හඟින කල්හී නබිවරයා ඇතැම් ජනයින් වෙනුවෙන්, දෙවියන් වහන්සේ ගේ ආශීර්වාදය සහ ක්‍ෂමාව අයැදි සිටී. නබිතුමා විසින්ම කිසිවෙකු කමා කරනු ලබන්නේ හෝ දඬුවම් පමුණුවනු ලබන්නේ නැත. දඬුවම් පමුණුවීමේ සහ යහඵල පිරිනැමීමේ දේව පරිපාටියට කිසිම ව්‍යාකූලත්වයක් නබිවරයා ඇති නොකරන්නේය.

එහෙයින් අල්ලාහ් හැර ජනයාට පරම ස්වාමියෙකු හෝ ආරක්‍ෂකයෙකු නොමැතිය.

සියලු ජනයෝ අල්ලාහ් ගේ මැවීම් වෙති. ඔවුහු දුර්වල වන අතර ඔහුගේ ආශීර්වාදය අපේක්‍ෂාවෙන් සිටිති. එමනිසා අත්තනෝමතික ලෙස දේවත්වයට අයිතිවාසිකම් පාන අය; මිනිසා විසින් නිර්මිත දෙවියන් සහ තමාම ස්වාධීන අරමුණු සහිත යැයි සළකන අය අල්ලාහ්ට හවුල්කරුවන් හා ආදේශකයන් ආරෝපණය කරන බහුදේව විශ්වාසීන්ම වන්නෝය.(3:64)

අල්ලාහ් සදා ජීවමානයි

අල්ලාහ් ගේ ජීවමාන භාවය (2:255) චලනය, වර්ධනය, ස්වසනය, ජනිත කරවීම, පෝෂණය,.... යනාදිය මගින් හඳුනාගනු ලබන ජීවින් මෙන් නොවන්නේය. අල්ලාහ් සජීවී පැවැත්මේ නියම යථාර්ථයයි. අල්ලාහ් ගේ පැවැත්ම ඔහුගේ සර්ව බලධාරීත්වය හා සර්ව පරමාධිපතිත්වය හා සමානය.

අල්ලාහ් සදානිකයි, අමරණීයයි

ජීවයේ සාරය සහ පැවැත්මේ මූලාරම්භය වන අල්ලාහ් අමරණීයයි. එනම් ඔහු කවදත් පැවතුණේය. තවද , කවදත් අඛණ්ඩව පවතින්නේය. '' ප්‍රථමයාද අවසානයද අභ්‍යන්තරය ද බාහිරයද සැඟවුණු ගුප්ත වූ සියල්ල දන්නා ද ඔහුම වන්නේය.'' (57:3)

අල්ලාහ් සදානික බව අප දැන ගත යුතුයි. එයින් පැහැදිලි වන්නේ ඔහු අතීතයට හෝ වර්තමානයට හෝ අනාගතයට හෝ සීමාවී නොමැති බවයි.

අපි සාමාන්‍යයෙන් ජීවත්වන්නේ කෙටි කාලයකටයි. එනම් අවුරුදු හැටක හැත්තෑවක හෝ ඊට වඩා ටිකක් දීර්ග වූ කාල පරිච්ඡේදයක් පමණි. අපි වායුගෝලයෙන් වටවූද, නිතර භ්‍රමණය වන්නා වූ ද , මාරුවෙන් මාරුවට හිරු උදාව සහ හිරු බැසයාම දකින්නාවූ ද පෘථිවියේ ජීවත්වෙමු. එනම් අපි චලනයේ හා කාලයේ බලපෑමට විෂය වස්තුවූ තත්ත්වයක පවතින්නෙමු. අපි ක්‍රම ක්‍රමයෙන් හැදෙන වැඩෙන ජීවියෙකි. අල්ලාහ් කාලයෙන් ස්වාධීනය. කාලය චලනය හා භ්‍රමණයේ නිර්මාතෘ ඔහුමය. අල්ලාහ් කෙරෙහි කාලය අර්ථ ශූන්‍ය වේ.

අල්ලාහ් පරමාධිපත්‍යයා

අල්ලාහ්ට මැවීම් සියල්ලක්ම කෙරෙහි වූ බලාධිකාරයක්, පරම ආධිපත්‍යයක් ඇත්තේය. (2:255)

ඔහු සෑම දෙයකට ම වඩා විශිෂ්ඨ වන අතර ලෞකික දේවලට නතු වීමක් හෝ සීමාවීමක් නොවන්නේය. ඔහු කාලයේ සීමාවන්ගෙන් එපිට සිටී. කිසිවකින්වත් බලපෑම් කළ නොහැකි,

අන් අයගේ උදව් හා කරුණාව අවශ්‍ය නොවන්නකි. අති ශ්‍රේෂ්ඨ වන්තයා ඔහුමය.

අල්ලාහ් සර්ව බලධාරියාය

අල්ලාහ් සර්ව බලධාරීය. සියලු ඥනයන් සහ උපකල්පනයන් අභිබවා විහිදී යන පරම බලය ඔහු සතුව ඇත්තේය. (2:20)

ඔහුට කළ හැක්කේ කොපමණද ? ඔහුට කළ හැකි වන්නේ කවදද? ඔහුට කළ හැකිද? යනාදී ප්‍රශ්ණයන් අල්ලාහ් ගේ පූර්ව සැළැස්මට අදල කර ගත නොහැකිය. ඔහුගේ රාජ්‍යයට ඉමක්, කොණක් හෝ සීමාවකුත් නැත්තේය. ඔහුට ඔහු පතන ඕනෑම දෙයක් මැවීමෙ සහ කාලය හා ස්ථානය නොසළකා ඕනෑම අයුරක වෙනසක් ඇති කිරීමෙ හැකියාව සහ ශක්තිය ඇත. එසේ හෙයින් ඔහුගේ ආධිපත්‍යය සීමා රහිතය. එය මනුෂ්‍යයාගේ අවබෝධ ශක්තිය අභිබවා විහිදී යන්නේය. වෙනත් වචන වලින් පවසතොත් ඔහු මුළුමනින්ම සීමා බන්ධනයන්ගෙන් තොරය. මෙය ගැඹුරු දර්ශනික විවාදයකට ඇරයුම් කරන මාතෘකාවකි.

අපි, පැවැත්මෙ ඉතා කුඩා කොටසක් පමණක් හිමි ජීවීන් වෙමු. නමුත් අල්ලාහ් ගේ පැවැත්ම අසීමිතය. ඔහුගේ පැවැත්ම අන්ත දෙකක් (මුලක් අගක්) අතර විහිදී ඇත්තක් නොවේ. ඔහුට භෞතික ශරීරයක් හෝ ස්වරූපයක් නොමැත. ඔහු මුළු මහත් පැවත්මම වැළඳගෙන සිටින්නේය. (මෙම විෂයය අපි පසුව සාකච්ඡා කරමු.)

අල්ලාහ් සර්වඥය

අල්ලාහ් සර්වඥය. අතීත හා අනාගත, විවෘත හා සැඟවුණු (ප්‍රසිද්ධ හා අභ්‍යන්තර) සෑම දෙයක්ම ඔහු දන්නේය. ඔහු සෑම ජීවියෙකුගේම සිතුවිලි හා චේතනාවන් පවා දන්නේය (6:59)

එය සීමාසහිත ඥනයන් ඇති, එක මොහොතකදී යම් නිශ්චිත දේවලට පමණක් අවධානය යොමුකළ හැකි මනුෂ්‍ය වර්ගයා ගේ ඥනය මෙන් නොවේ. අල්ලාහ් සියල්ල දන්නේය. සෑම මොහොතකම මුළු මහත් විශ්වය ගැනම ඔහු දන්නේය. ඔහු විසින් නොසළකා හරිනු ලබන කිසිවක් නොමැත. ඔහුට ඥනය ලබා

ගැනීම සඳහා පිටස්තර මූලාශ්‍ර නොමැත. එය සහජයෙන්ම ඔහු සතු දෙයකි. ඔහුට, සෑම දෙයක් ගැනම ඒවා මවනු ලැබීමට පෙරම සම්පූර්ණ අවබෝධයක් ඇත්තේය. ලෝකය එහි නියමයන් හා නීති රීතීන් සහිතව මැවූ මැවුම්කරුවා ඔහුමය.

අල්ලාහ් සියල්ල අසන්නා, සියල්ල දකින්නා

අල්ලාහ් සියල්ල අසන්නාය. සියල්ල දකින්නාය.(58:1) ඔහු අසන්නේය; බලන්නේය. නමුත් මිනිසෙකු මෙන් කන්, ඇස්, ස්නායු යනාදී නිශ්චිත අවයවයන්ගේ මාර්ගයෙන් නොවේ. කුමන හෝ ආශ්චර්යයක, වස්තුවක හෝ දෙයක ස්වභාවය පිළිබඳ ව වූ පරම ඥනය ඔහුට ඇත්තේය.

අල්ලාහ් ස්වීයම යැපෙන්නාම වේ.

සියල්ලක්ම අල්ලාහ් මතම යැපෙන අතර අල්ලාහ් ස්වීයව යැපෙන්නා වෙයි. සියල්ලන්ටම අල්ලාහ් (ගේ පිහිට) අවශ්‍ය වන අතර අල්ලාහ් ස්වීයව සෑපීරී සිටී. කිසිකෙනෙක් ඔහුට උපකාර හා ආශීර්වාද නොදෙන්නේය. ඔහු පරිසමාප්ත හා සම්පූර්ණ වන්නේය. බලාපොරොත්තුව සිටීම, සංශෝධනය කිරීම, හිඟකම, පරිණාමය යනාදිය අල්ලාහ් සම්බන්ධයෙන් අර්ථ ශූන්‍ය වේ. අල්ලාහ් සම්පූර්ණය. බැඳීම් වලින් තොරය. අත්‍යන්තයෙන්ම අවශ්‍යතාවලින් ස්වාධිනය. කුමන තත්ත්වයක හෝ තරාතිරමක සිටියත් සියල්ලන්ටම ඔහුගේ කරුණාව හා ආශීර්වාදය අවශ්‍ය වන්නේය. සියල්ලක්ම ඔහුගේ කැමැත්ත මත රැදෙමින් පවතින්නේය. (2:255)

අල්ලාහ්, සර්ව බලධාරිය, මහා කාරුණිකය

පැරණි ගිවිසුමෙන් හඳුන්වා දුන් පරිදි ජෙහෝවා දෙවියා, රළු සහ සර්ව බළධාරිය; ඔහු, ඔහුගේ යුක්තියට අනුකූල වන්නේද යන්න ගැන පමණක් සැලකිල්ලට ගන්නා අතර ඔහු විසින් පනවා තිබෙන නීතිරීති නියම කිරීම් තුළ සුළු නොසැළකිල්ලකට හා අවනත නොවීමකට සමාව නොදෙන තේජාන්විත බලසම්පන්නාය. මිනිසා ඔහු සමග සෘජුව සම්බන්ධ වීමට දිරීමත් නොවෙන තරමට ඔහු වැදගත් හා ඉතා බැරෑරුම්ය. දැඩි බව, භීතිය සහ බලය කෙනෙකුට ජෙහෝවා සිහිපත් කරයි.

ඒට පටහැනිව, ක්‍රිස්තු ධර්මයේ ජේසුස් අහසින් පහළ වෙයි. ජනයා සමග වාසය කරයි. මිනිසෙකුගේ ශරීරය ද ලබාගන්නා ඔහු සමීපය; මිත්‍රශීලීය; දයාන්විතය.

නමුත් අල්ලාහ් සතුව මේ ගුණාංගයන් දෙකම ඇත්තේය. ඔහු සර්ව බලධාරී සහ බලකරන්නා වන අතර ම ඔහු මහා කාරුණික සහ පරම දයාන්විතය. ඔහු, බල සම්පන්නය. ආරක්ෂකයාය. දඬුවම් ද පමුණුවන්නාය. ඔහු සානුකම්පිතය. ආදරය හා කරුණාව සතුවන්නාය. එක් අතකට, ඔහුගේ ආධිපත්‍යයේ සහ පරිපාලනයේ රාජ්‍යය ලොවේ අන්තයන් දෙක අතරම විහිදී යන්නේය. අනෙක් අතට ඔහු සියලු ජිවින් ට, අතර මැදියෙකු නොමැතිවම ඔහු සමීපත්වයට ළගාවීමටද, ඔහුගේ අනුග්‍රහය අයැද සිටීමට ද, නැඳීමට ද හැකි වන්නේය. ඉස්ලාමයේ දෙවියාණන් අල්ලාහ් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගැනීමට කෙනෙකු අසීමිත ආදරය සහ කරුණාව නිරන්තර බලයෙන් සම්බන්ධ කළ යුතුය.

අල්ලාහ් ගේ ක්‍රියාවන්

අල්ලාහ්, ලෝකය හා එහි පවතින සියලු දේ නිර්මාණය කළේය. ඒවාට පැවැත්මක් ඇතිකර ඔහු ඒවා පාලනය කරයි. සෑම දෙයක්ම ඔහුගේ කැමැත්තෙහි පරිශීලනය මත රැඳී පවතින අතර කිසිම සිදුවීමක් වෙනසක් හෝ විපර්යාසයක් ඔහුගේ අනු දැනුම අනුව මිසක් සිදු නොවන්නේය.

මැවීම් අදියර දෙකකින් සමන්විතවේ. මැවීම් වලට ප්‍රාරම්භයක් ලබාදීම එනම් පැවැත්මක් ලබාදීම ඉන් පළමුවැන්න වේ. අල්ලාහ් මූලාරම්භයේදීම සියලු දේ සඳහා මුල පිරුවේය. (6:102)

මැවීමේ දෙවන අදියරය වන්නේ, ලෝකයේ එම වස්තුව හෝ දෙය භාජනය වන වෙනස්කම් සහ විපර්යාසයන් ය. මෙය, මනුෂ්‍ය කළලයක් , මුලින්ම පුරුෂ සහ ස්ත්‍රී සෛල වලින් මවා පසුව මනුෂ්‍ය රුධිරයෙන් පෝෂණය ලැබ වර්ධනය වීමේ ක්‍රියාවලිය හා සමාන වන්නේය. රුධිරය ද ස්වභාවධර්මයේ ඇත්ත වශයෙන්ම පවතින මූලිකාංග වලින් සංයුක්ත වන්නේය.

කුර්ආනයට අනුව අල්ලාහ් මුලු මහත් විශ්වයේම මැවුම්කරුවාණන් සහ ස්වභාව ධර්මයේ ඉතා සුළු දෙයක් සිට අතිශයින්ම වැදගත් කරුණු දක්වා වෙනස් කිරීමට හා විපර්යාසවලට භාජනය කිරීමට මුලපුරන්නාවූ පරම ප්‍රාරම්භකයා වේ. අන්ධකාරය සහ ආලෝකය, ඇද හැලෙන්නාවූ වර්ෂාව, පොළොව යටින් පළාගෙන මතුවන්නාවූ ධාන්‍ය බීජයන්, හමා යන්නාවූ සුලඟ, ඉදෙන්නාවූ පළතුරු, වතු වල සහ ගොවිපළ වල වැපිරෙන්නාවූ බීජ, භ්‍රමණය වන්නාවූ ග්‍රහයන්, ප්‍රභාමත් වූ සූර්යයා, දීප්තිමත් වූ චන්ද්‍රයා. ගලායන්නාවූ ජලධාරාවන් හමා යන්නාවූ චණ්ඩ මාරුතය, භූමිකම්පාවන් සහ අකුණු, පැළවෙන්නාවූ ශාඛයන්, සරත් ඍතුවේදී ගස් වලින් හැලෙන්නාවූ කොළ, ගසකින් කොළක් වැටෙන්නාවූ හුදු ක්‍රියාව , මල් පැණි රැස්කරන්නාවූ මී මැස්සන්ගේ උත්සාහය යනාදී මේ සියලු දෙයක් තුළම පවතින්නාවූ සෑම දෙයක්ම අල්ලාහ් ගේ පූර්ව සැලැස්ම අනුවම සිදුවන්නේය.

අල්ලාහ්- තරු, කඳු, සාගරයන්, ගොඩබිම්, සිවුපාවුන්, ශාඛයන්, පුෂ්පයන්, ඵලයන්, මිනිස් වර්ගයා, කුරුල්ලන්, තණබිම්, කැළෑවන්, වනාන්තරයන්, භූගත ජල ධාරාවන්, ඇල දොළ, පොකුණු, ගංගා, ඇතුළු ස්වභාව ධර්මයේ පවතින මුළු මහත් වස්තු සම්භාරයම මැව්වේය. (6:13),(6:14),(16: 2-17) (6:95-105)(13: 2-4) (13:13-19)

කුර්ආනය පුරා නැවත නැවතත් දක්නට ලැබෙන මෙවැනි උදහරණයන් මගින් අපට එළඹිය හැකිවන්නාවූ නිගමනයන් මෙලෙස වේ.

1. ඉස්ලාමය, සියළු දෙවිවරුන් ද , නොයෙකුත් වාර්ගිකයන් විසින් විවිධ දේවල් සහ කටයුතු සඳහා පත් කර ගෙන සිටියාවූ අතරමැදියන් ද ප්‍රතික්ෂේප කරයි. ඉරානයේ, ඉන්දියාවේ, ග්‍රීසියේ, රෝමයේ සහ පූර්ව ඉස්ලාමික අරාබිවරුන්ගේ සියළු පැරණි ආගමක් ම පාහේ සියයකටත් වැඩි සංඛ්‍යාවකින් දෙවිවරුන් සහ දෙවඟනන් පවතින බව පිළිගත්තේය. ඉස්ලාමය මේ සියළු දෙවිවරුන් සහ දෙවඟනන් ප්‍රතික්ෂේප කරන අතරම සියළු දේවල් සහ කටයුතු තත්ත්වාකාරයෙන්ම තේරුම් ගැනීම අද්විතීය වූද, සර්ව බලධාරී වූද, සර්වඥ වූද, අල්ලාහ්ට පවරන්නේය.

2. අල්ලාහ් විශ්වය මවා , එයට ක්‍රියාත්මක වීමට ඉඩ හැර පසුව එය අත් හැර දමා ඇතැයි ඇතැම්මු විශ්වාස කළහ. ඒත් ඊට පටහැනිව ඉස්ලාමය දේශනා කරන්නේ; අල්ලාහ් ලොවේ පරමාධිපත්‍යයාය.''අහසෙහි ද පොළොවෙහි ද අය සෑම කෙනෙක්ම ඔහුගෙන් ඉල්ලීම් කරන්නාහ. සෑම මොහොතකම ඔහු ක්‍රියාකරී වන්නේය'' (55:29) ඔහුගේ කැමැත්ත තුළින් මිසක් කිසිවක් සිදුනොවේ. ඔහුගේ කරුණාව, අශීර්වාදය හා අනුග්‍රහය සදාකාලික වේ. ලොවේ කාර්යයන් පරිපාලනය නොකිරීමට අල්ලාහ් තීරණය කරන්නේ නම් මුලු මහත් පැවැත්මම අවසානයට පත් වන්නේය.

අල්ලාහ් හඳුනා ගැනීම සහ විද්‍යාව

ස්වාභාවික දේවල යථාර්ථයන්, නීතීන්, හේතූන් සහ ප්‍රතිඵල කිසිම වටිනාකමක් නැත්තේය. සියලු ක්‍රියාවන් ඉටුකිරීම අල්ලාහ්ටම විශේෂ වන නිසා සහ මෙම නීතිවල කර්තෘ නිර්මාතෘ සහ ආරක්ෂකයා අල්ලාහ් වන නිසා ද හේතූන් සහ ඵලයන් අල්ලාහ්ම වන්නේය. වෙනත් වචන වලින් කියන්නේ නම්, සොබාදහම තුළ යම් දෙයක් උත්පාදනය වීම හෝ යමක් පරිණාමයට හෝ විපර්යාසවලට පත්වීම හෝ ඇතැම් ස්වභාවික ධර්මතා හා නීතිරීති වලට අනුව සිදුවීම වනාහී අල්ලාහ් ගේ පැවැත්ම පිළිබඳ විශ්වාසයට කිසිසේත් හානියක් නොවන්නේය.

දේව විශ්වාසය ඇති නමුත් විද්‍යාත්මක දැනුමක් නොමැති ඇතැම් ජනයෝ, උදහරණයක් වශයෙන් , අල්ලාහ් වැස්ස පහළ කරන බවටත්, එසේ කිරීමේදී කිසිම හේතුවක් හෝ රීතියක් නොමැතිව අහසේ සිදුරක් ඇති විය යුතු බවටත් ඉහළින් රඳවා තිබෙන ජලාශයකින් ජලය මේ සිදුර තුළින් වැටෙන බවටත් උපකල්පනය කරති. ඔවුන්ට 'මුහුදේ ජලය සූර්ය රශ්මියෙන් රත් වූ විට වාෂ්ප වන බවත්, ඝනීභවනය වූ ජල වාෂ්ප සුළඟ මගින් ඉවත් කරනු ලබන බවත්, උෂ්ණත්වය අඩු තැන් වලදී ජල වාෂ්ප ජල බිංදු බවට පරිවර්තනය වී වැස්ස වසින බවත්, උෂ්ණත්වය තවත් අඩු විටෙක ජල බිංදු හිම ස්වභාවයට පත් වී හිමවැසි වසින බවත් පවසනු ලැබූ විට , ඔවුන් එසේ නම් මේ ක්‍රියාදමයේ අල්ලාහ් ඉටු කරන කොටස කුමක්ද? යයි ප්‍රශ්ණ කළ හැක. ඔවුහු මේ

තර්කය අති ශ්‍රේෂ්ඨ වූ බලයට සහ පූර්ව සැලැස්මට පටහැනි බවට තර්ක කරති. ඔවුන්ට කුර්ආනය අනුව පිළිතුරු සපයනු ලැබිය යුතුයි. සෑම දෙයක්ම නීතියකට හා විධි ක්‍රමයකට විෂය වස්තු වන්නේය.

''සූර්යයා සහ චන්ද්‍රයා නියමිත වේලාවකට අනුව ක්‍රියාකිරීමට සළස්වනු ලැබ ඇත. ඔහු අහස එසෙව්වේය. ඔහු සමතුලිතතාවය ස්ථාපනය කළේය.'' (55:5)(55:7))

අල්ලාහ් ට මිනිසෙකුව එක්වරම මැවිය හැකි වුවද ඔහු ළදරුවෙකුගේ මැවීම, යම් නිශ්චිත ක්‍රියාදමයක් හා විශේෂිත උපක්‍රමයක් තුළින් නියම කළේය. ඔහු සෑම දේකටම ඒවාහී ප්‍රමාණය හා පරිමාව ගැන නොසළකා නීතීන් සහ නියමයන් ස්ථාපිත කළේය. මෙ නීතින් සහ නියමයන් නිරවද්‍ය ලෙසටම ස්වභාව ධර්මයේ නීතින් සහ හේතූන් වන්නේය.

මිනිසා ස්වභාව ධර්මයේ නීතින් සහ අභිරහස් සොයා ගැනීමෙන් ස්වභාවික සිදුවීම් වල යථාර්ථ සාරය හා විපර්යාසයන් පිළිබඳ දැනුම් තේරුම් ඇති බවට පත්වන අතර ලබා ගත් දැනුම භාවිතයට යෙදීමෙන් ස්වභාව ධර්මයේ දයාදයෙන් ප්‍රයෝජන ලබමින් ඔහුගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කර ගත හැකිය.

කෙසේ වෙතත්, ස්වභාව ධර්මයේ නීතින් සහ අභිරහස් හඳුනාගැනීම දේව විශ්වාසයට හානියක් කළ නොහැකිය. එමෙන්ම ස්වභාව ධර්මයේ නීතීන් සහ අභිරහස් වල යථාර්ථය අල්ලාහ් ගැන දැන ගැනීමෙ , හඳුනාගැනීමේ එකම මාර්ගය විය නොහැකිය. නමුත් මනා සංවිධානාත්මකව හා විධි ක්‍රමානුකූලව සකස් කරන ලද විශ්වය, ප්‍රාඥයා හා බලධරයා වන අල්ලාහ් දැන ගැනීමෙහි අපට උපකාර විය හැක.

ලොවේ සෑම දෙයක්ම දැනටත් ස්වභාව ධර්මයේ පවතින යම් නිශ්චිත නියෝජන හා හේතු කාරක වල ප්‍රතිඵලයයි. නමුත් සෑම දෙයක්ම භෞතිකව මූර්තිමත් වන්නේ අල්ලාහ්ගේ කැමැත්තට අනුකූලවය. ඔහු උපත ගෙන දෙන්නේය. ඔහු මරණය ඇති කරන්නේය. ඔහු අපට දෛනික ආහාරය සළසන්නේය. වැස්ස එවන්නේ ඔහුය. ඒ මෙ සියළුම සිදුවීම් වලට හේතූන් සහ

නියෝජිතයන් ස්ථාපිත කරන්නා ඔහු වන බැවිනි. ලෝකය එහි සියලුම නීතීන් සහ මූලධර්මයන් සමග මුලපුරවමින් මවනු ලැබුවේ අල්ලාහ් විසිනි.

අල්ලාහ්ට තිබිය නොහැකි ගුණාංග

(නිශේධන ගුණාංග)

මෙ දක්වා අපි, අල්ලාහ්ට තිබෙන්නාවූ සර්ව බලය, සදතනිකත්වය වැනි අල්ලාහ්ට ආරෝපණය කළ හැකි පරිසමාප්ත ගුණාංගයන් පෙන්නුම් කළෙමු. අල්ලාහ් ට ඒකාන්තයෙන්ම තිබෙන්නාවූ ගුණාංගයන් හඳුනා ගැනීමෙන් ඔහුට තිබිය නොහැකි ගුණාංගයන් ගැන අපි ඉබේ ම දැන ගන්නෙමු. අප භෞතික මෙන්ම බැඳීම් වලට යටත් වූ ජීවින් වශයෙන් සාමාන්‍යයෙන්, අපට හැඟෙන අපගේම ප්‍රත්‍යක්ෂඥනයේ සීමාව තුළම විශ්වයේ මැවුම්කරුවාණන් ද තේරුම් ගැනීමට සාමාන්‍යයෙන් කැමැත්තක් දක්වන බැවින් මෙ ගුණාංගයන් විවේචනාත්මක අධ්‍යනයක් තුළින් පැහැදිලිව පෙන්වා දිය යුතුය. නිදසුනක් ලෙස ඔහුව, අවතාරයක් ලෙස මිනිස් ශරීරයකින් යුතුව ලොවට පහළ වන, භෞතික හා ලෞකික භාවයක් ඇත්තෙකු වශයෙන් උපකල්පනය කිරීමට අපි කැමත්තක් දක්වමු. මෙවැනි ගුණාංග අල්ලාහ් ට ආදේශ කිරීමෙන් අල්ලාහ් ට තිබිය නොහැක්කාවූ අසම්පූර්ණ බව හා අවශ්‍යතා වලින් යුක්ත බව යනාදී ගුණාංග ඔහුට තිබේ යයි හඟීමට ඉඩ ඇති බව පැහැදිලි වේ. අප මෙම විෂය ගැන පහත ජේද වල සාකච්ඡා කරමු.

අල්ලාහ්- භෞතික නොවන පැවැත්මක් ඇත්තා වේ.

භෞතික, ද්‍රව්‍යමය දෙයක් ස්පර්ශ හා අත් දැකීමට යම් ලෙසකින් හෝ අනුකූලව වන දෙයකින් සමන්විත වේ. එය සූර්යයා, ගස, වාතය, ආලෝකය, යනාදිය මෙන් අවකාශයෙන් ඉඩක් ලබාගන්නේය. ද්‍රව්‍යයක් එහි ප්‍රමාණය කුමක් වුවත් සීමා සහිත හා නියත වන බැවින් අල්ලාහ් ද්‍රව්‍යමය නොවන්නේය. විශාලතම මහා සක්වල පවා අනියත වන අතර කෙනෙකුට ඊටත් වඩා විශාල මහා සක්වලන් ගැන උපකල්පනය කළ හැකිය. නමුත් අල්ලාහ් සීමා රහිතය. ඔහු පරම සම්පූර්ණ වන්තයාය. ඔහු අසීමිතය. ඔහු එසේ නොවන්නේ නම් ඔහු අසම්පූර්ණ හා අවශ්‍යතාවලින් යුක්ත වූවෙකි.

ද්‍රව්‍යයද (matter) සංයෝගයකි. එය කුඩා අංශු, කොටස්, මූල ද්‍රව්‍ය හා පරමාණු වලින් සමන්විත වන්නේය. එය නැවතත් වෙන් කරනු ලැබිය හැකිය. සංයෝගයක් එය සමන්විත වී තිබෙන මූල ද්‍රව්‍යවල ස්වභාවය මත රඳ පවතින අතර එවැනි සංයෝගයකට එම ස්වභාවයේ අවශ්‍යතාවයද ඇත්තේය. නමුත් සෑම මූල ද්‍රව්‍යයක්ම අවශ්‍යතා වලින් තොර සහ අනෙක් මූල ද්‍රව්‍යයන්ගෙන් ස්වාධීනය. එවැනි අනෙකක් මත රැඳී පැවැත්මක්, අවශ්‍යතාවයක් නොසැළකිල්ලක් අල්ලාහ් ට නැත්තේය. ඒ ඔහු සර්ව ව්‍යාප්ත, සර්වඥ සහ පරමාධිපත්‍යයා වන බැවිනි.

ද්‍රව්‍යයක තවත් ලක්ෂණයක් වන්නේ එහි වෙනස් වන ස්වභාවයයි. සත්ව, ශාඛ, සූර්යයාද සහ කඳු ඇතුලු භෞතික දේවල් විපර්යාසයන්ට ලක්වන තත්ත්වයක පවතින්නේය. සත්ත්වයෝ සහ ශාඛ යම් කාල පරිච්ජේදයකදී වර්ධනයකටත්, පසුව පරිහානියකටත්, මැලවීමටත් අවසානයේදී මරණයටත් ලක් වෙති. අඛණ්ඩව සිදුවන විශාල දහනයන් සහ පිපිරීම් හේතු කොට ගෙන සූර්යයාගේ බර අඩුවේ. භෞතික මෙන්ම හිරු එළිය, ජල ගැලීම්, භූමි කම්පා යනාදී දේශගුණික, කාලගුණික කාරක වල බලපෑමට ලක් වන කඳු ද යම් වෙනස් වීම් වලට හා විපර්යාසයන්ට පත් වන්නේය.

අල්ලාහ් ට වර්ධනයක් අවශ්‍ය වීමට ඌනතාවයක් වත්, කාලයාගේ ගමන හා ස්වභාව ධර්මයෙන් සිදුවන සිදුවීම් වලින් දුර්වල වීමක් හෝ අබලන් වීමක් වත් ඇති නොවන බැවින් අල්ලාහ් ගේ නියම යථාර්ථ සාරයට කිසිම වෙනසක් හෝ විපර්යාසයක් සිදු නොවන්නේය. කෙටියෙන් කියන්නේ නම්, අල්ලාහ් කිසිම ආකාරයකින් ඔහුගේ මැවීම් වල බලපෑමට ලක් නොවන්නේය. එසේ නොවේ නම් ඔහු ඔහුට පරිබාහිර වූ වෙනත් දෙයක බලපෑමට ලක් විය හැකි අතර මෙය අල්ලාහ් ගේ ඒකාන්තයෙන්ම අවශ්‍යතා වලින් තොර වූ තත්ත්වය ද ස්ථිර නොකරන්නේය. එමනිසා අප එළඹෙන නිගමනය වන්නේ, අල්ලාහ් ට භෞතික පැවැත්මක් නොමැති බැවින් ඔහුට ශාරීරික පැවැත්මක් ද නැත්තේය. ඔහු කිසි දිනක, මෙලොවේදී හෝ පරලොවේදී මනුෂ්‍ය හෝ වෙනත් ජීවියෙකුගේ භෞතික ශරීරගත වීමක් නොගන්නේය. එමනිසා ඔහුව බැලීමට නොහැකි වන්නේය.

අල්ලාහ් ට පොළොවෙහි හෝ අහසෙහි කිසිම ස්ථානයක් හෝ කාර්යාලයක් නොමැත්තේය. අල්ලාහ් තමාව පිහිටුවිය යුතු ස්ථානයක් තෝරාගෙන නැත. ද්‍රව්‍යමය නොවන්නාවූ අල්ලාහ් ට යම් නිශ්චිත ස්ථානයක් යෝජනා කිරීම වැරදිය.

අල්ලාහ් ට වාසස්ථානයක් නොමැති වුවද ඔහු සර්ව ව්‍යාප්තය. මෙයින්, නැගෙනහිර සිට බටහිර දක්වාවූ මුලු මහත් ලෝකයේම ස්ථානගත වීමට තරම් ඔහුගේ ශරීරගතවීම විශාලය යන්න අදහස් නොවේ. අල්ලාහ් ද්‍රව්‍යමය නොවන්නේය. නමුත් ඔහුගේ කැමැත්ත, පෙනී සිටීම සහ දැනුම සෑම තැනකම ඒවා විසින්ම හෙළිදරව් වී ඇත. එහෙත් සමහරු අවසාන විනිශ්චය දිනයේදී අල්ලාහ් මිනිසුන් අතර පෙනී සිටින බව විශ්වාස කරති. ශුද්ධවූ කුර්ආනය මෙසේ ප්‍රකාශ කරයි.

''දෘෂ්ඨිය ඔහුව ග්‍රහණය කර නොගනියි. ඔහු (සියළු) දෘෂ්ඨි ග්‍රහණය කර ගනියි.'' 6:104

තවද ඊශ්‍රායෙල් ගේ දරුවන් ස්වාමියාණන් ව බැලීමට මෝසස් (මූසා) ගෙන් ඉල්ලූ විට ඔහු මෙසේ අමතනු ලැබුවේය.

'මූසා! ඔබට කොහේත්ම ඔබේ ස්වාමියාණන්ව බැලිය නොහැක.'

ඉමාම් අලිතුමා මෙසේ පැවසුවේය.

''අල්ලාහ් දැකීමට අපගේ ඇස් වලට නොහැකිය. නමුත විශ්වාසයේ ආලෝකය තුළින් අපගේ චින්තනයට සහ හදවතට ඔහු වෙත සමීප වීමට හැකිය.''

තවද තර්කයේ සහ ඥානයේ දෘෂ්ඨිය අනුව අල්ලාහ් අදෘශ්‍යමානය. ඒ ඔහු භෞතික, ද්‍රව්‍යමය නොවන බවත් ඔහුට භෞතික ශරීර ගතවීමක් නොමැති බවත් අප නිගමනය කරන නිසාය.

යාඥා කරන විට අප අපේ අත් අහස දෙසට එයවූවත් එයින් අල්ලාහ් අහසේ වෙසෙන බව හෝ ඔහු ඔහුගේ සිංහාසනයේ අසුන් ගෙන සිටින බව හෝ අදහස් නොකෙරේ. ඉහළ ලෝකය, ලෞකික දූෂණ හා වංචා වලින් නිදහස් හා පිරිසිදු යයි අප දන්නා බැවින්

මේ ආකාරයට අවශ්‍ය තත්ත්වයන් අප විසින් නියෝජනය කළ යුතුව ඇත. අප අපගේ යාඥවන් දේවස්ථාන වල හෝ අනෙකුත් ශුද්ධස්ථාන වල ඉටුකරන්නේ අල්ලාහ් එවැනි ස්ථාන වල වාසය කරන නිසා නොව දේවස්ථානයන් සහ කඅබාව අල්ලාහ් ගේ නාමයෙන් ගොඩ නගා ඇත්තා සේම ඒවා පාරිශුද්ධ නිසාය.

අල්ලාහ්ට කිසිවක් අවශ්‍ය නොවන්නේය.

දෙවියන් ට පූජා කිරීමෙන් ඔවුන් දෙවියන්ට උපකාර කරන බවත් ඊට පිළිතුරු වශයෙන් ඔහුගේ ආශිර්වාදය ලැබෙන බවත් පූර්ව ඉස්ලාමීක අරබිවරුන් සහ පුරාණ රෝමයේ හා ග්‍රීසියේ සිටි පිළිම වන්දනාකරුවන් සිතූ ආකාරයට, අපගේ නැමදුම්, ශීර්ෂ නමස්කාරයන් , දෝවනයන්, දනයන් සහ පරිත්‍යාගයන් අල්ලාහ්ට කිසිම සේවයක් නොකරන්නේය. මේ සෑම දෙයක්ම අපගේ යුතුකමක්ම වන්නේය. එම නිසා අප ඔහුට ගරු බුහුමන් දක්වා නමස්කාර කළ යුතු අතර අනෙකුත් මානව වර්ගයාට ද සේවය කළ යුතුයි.

කෝපය සහ කරුණාව

අල්ලාහ් ගේ කෝපය; 'ඔහුගේ මැවීම් වල ක්‍රියාවන් නිසා ඔහු කලබලයට හෝ ඇවිස්සීමට පත්වන බව හෝ මනුෂ්‍යයන්ට මෙන් ඔහුගේ ධමනි වල ඇති රුධිරය කැලතී හදිසි කෝපයක් ඇතිවන්නේය' යන අදහසින් තේරුම් ගත නොහැකිය. තවද ඔහුගේ කරුණාව; මවක් තම ළදරුවා කෙරෙහි දක්වන කරුණාවට හෝ කරුණාවන්ත මිනිසෙකු, වියෝවෙන් දුක්වන සහ කාලකණ්ණි කෙනෙකුට දක්වන කරුණාව හා සමාන නොවන්නේය.

මව්වරුන්ට සාමාන්‍යයෙන් තම දරුවන් හැඩීමේදී අනුකම්පාවක් සිතෙන අතර ඔවුහු නිතරම ඔවුන්ට කරුණාව දක්වති. ඔවුහු තම දරුවන්ගේ සිනහවෙන් සහ ළමා වික්‍රමයන්ගෙන් ප්‍රමෝදයට පත් වන අතර දරුවන් කෙරෙහි වඩාත් ඇල්මක් ඇති කර ගනිති. නමුත් අල්ලාහ්ට, බාහිර ලෝකයෙන් එනම්, ඔහුගේ පැවැත්මෙන් පරිබාහිර වූ යම් දෙයකින් සිතට කා වදිනු ලබන තත්ත්වයක් හෝ කණගාටුවක් හෝ සතුටක් හෝ විනෝදයක් ඇති නොවන්නේය. ඇත්ත වශයෙන්ම, කණගාටුව,

මහත්ප්‍රමෝදය, කෝපය, අනුකම්පාව යනාදීය සමග වෙනස්වන්නාවූ කිසිම භෞතික තත්ත්වයකින් අල්ලාහ්ට බලපෑම් කළ නොහැකිය. එය මෙසේ නොවන්නේ නම් අල්ලාහ් ගේ පරම සම්පූර්ණත්වයට හා පරමාධිකාරිත්වයට අනුකූල නොවන අයුරින් ඔහු සිතට කා වද්දනු ලැබිය හැකි හැඟීම් වලට යටහත් පහත් වූ සහ චිත්ත ආවේගාත්මක විය හැකිවේ.

දිව්‍ය කරුණාවට, තම මැවීම් කෙරෙහි ප්‍රදනය කරනුලබන දයාදයන් සහ ඔවුන් වෙත පිරිනමනු ලබන අනුග්‍රහය හා ආශිර්වාද ද එකතු වන්නේය.

දේව කෝපයට, මැවීමක් තම චර්යාව නිසාම විඳීමට සිදුවන මහා ව්‍යසනය සහ වධ දෙන චිත්ත පීඩාව ආදීය ද සතුවේ. නොසැලකිල්ල, මහත් පසුතැවිල්ල, ඊර්ෂ්‍යාව, කපටි ප්‍රයෝගය ආදීය අල්ලාහ් ගේ ස්වභාවයට එකඟ නොවන ගුණාංගයන් වේ.

අල්ලාහ් ගේ පැවැත්ම මෙවැනි ගුණාංගයන්ගෙන් නිදහස් වූවකි. අසීමිත වන්නාවූ අල්ලාහ් ගේ පරම සම්පූර්ණත්වයට කණගාටුව, ශෝකය, පසුතැවිල්ල, නොසැලකිල්ල හා ඊර්ෂ්‍යාව යනාදීය නොමැති බව ඉස්ලාමය අපට උගන්වයි. මූසා නබිතුමා දෙවියන් වහන්සේ ගේ හඬ ශ්‍රවණය කළේ නම්, එයින්, අප සාමාන්‍යයෙන් කරන්නාක් මෙන් වූ ස්වර පද්ධතියකින් එනම් ස්වරතන්තු, ඌර්ද්ධවකණ්ඨය, දිව, මුඛය යනාදීය මගින් අල්ලාහ් ඔහුට කතා කළේ යයි අදහස් නොවන්නේය. ඒ අල්ලාහ් භෞතික හා ද්‍රව්‍යමය නොවන බැවිනි. සියලු හඬ හා ස්වරයන් මැව්වේ ඔහු විසින්මය. ඊටත් වඩා මූසා (මෝසස්) තුමා ශ්‍රවණය කළ ආකාරය, දේව හෙළිදරව්ව අනාවරණය කරනු ලැබීමේ විෂය ක්ෂේත්‍රයට අයත් වන විශේෂ සංකල්පයට අනුකූල වන්නේය. ඒ ආකාරයටම ඉස්ලාමයේ උත්තම වක්තෘන් මුහම්මද් තුමාණෝ ගගනා රෝහණ වී (මිහ්රාජ් දෙව්ලොව ගමන) අල්ලාහ් සමග සම්භාෂණය කළේය. වක්තෘ තුමා, අල්ලාහ් වෙතට ගොස්, අප මනුෂ්‍යයන් ජනයාගේ හඬ ශ්‍රවණය කරන්නාසේ ඔහුගේ හඬ ශ්‍රවණය කළේ යයි අපි කල්පනා නොකරමු. මෙය ද විශේෂ සමීපත්වයට ළඟාවීම හා අදහස් හුවමාරු කිරීම පිළිබඳ ප්‍රශ්ණයකි.

වෙහෙස, වයස සහ නින්ද යනාදියට අල්ලාහ් ගේ ජීවමාන බව අභිබවා යා නොහැකිය. ශුද්ධවූ කුර්ආනයේ අපි මෙසේ කියවමු. ''නින්දට හෝ නිද්‍රාවට ඔහුව අභිබවා යා නොහැකිය.''

''ඔහුගේ රාජධානියට අහස් සහ පොලොව ඇතුළත් වන අතර ඒවා ආරක්ෂා කිරීමෙහි ඔහුට කිසිම වෙහෙසක් නැත්තේය.'' 2:255

එවැනි ගුණාංග අදාල වන්නේ, දුර්වලත්වය, අසාර්ථකත්වය සහ අඩු ලුහුඬුකම් යනාදියෙන් පීඩා විඳින්නාවූ මැවීම් වලට සහ භෞතික වස්තූන්ටය. නමුත් අල්ලාහ් බෙලහීන හෝ අදක්ෂ නොවන්නේය.

අල්ලාහ් පුතෙකු; දුවකු, වල්ලභයෙකු, මවකු හෝ පියෙකු සිටිය හැකි වන්නාවූ මනුෂ්‍යයෙකු මෙන් නොවන්නේය. මේ ආකාරයෙන් වූ පවුල් බැඳීම ද අල්ලාහ් ට අනුකූල නොවන්නේය. එම නිසා අප නිගමනය කරන්නේ දෙවියන් වහන්සේට පුතෙක් (ජේසුස්ව) ආදේශ කර ක්‍රිස්තියානි න්ගේ විශ්වාසයද; එවැනිම අදහසක් ඉස්රා ගැන පවත්වාගෙන යන යුදෙව්වන් ගේ මතය ද ; සුර දූතියන් දෙවියන් වහන්සේ ගේ දූ වරුන් ලෙස සැළකූ පූර්ව ඉස්ලාමික අරාබීන් ගේ මතය ද; දෙවියන් වහන්සේ ජින් කෙනෙකුව සිය භාර්යාව වශයෙන් ගෙන තිබෙන්නේ යැයි සිතන අයගේ මතයද?; අනෙකුත් මෙවැනි සියලු මතයන් ද; මුළුමනින්ම වැරදි හා අවලංගු කළ යුතු ඒවා වන බවයි.

අපි ශුද්ධවූ කුර්ආනයේ මෙලෙස කියවමු.''ඔහු අල්ලාහ්ය. ඒකෝය. අල්ලාහ්, සදකාලිකවම සැමදෙනා විසින්ම උදව් ඉල්ලනු ලබන්නාවේ. ඔහු උපද්දන්නේවත් උපද්දනු ලබන්නේවත් නැත. ඔහුට සමකළ හැකි අන් කිසිවෙක් නොමැත්තේය.'' (112:1-4)

ඒක දේව නැමදුම

මුල් සාකච්ඡාවේදී අපි අල්ලාහ් ඒකීය බව ද ; (ඔහු හැර) සූර්යයා, චන්ද්‍රයා, තාරකා, නොයෙකුත් හැඩ වලින් යුත් පිළිමයන්, සිවුපාවුන්, මනුෂ්‍යයන්... වැනි අන් කිසි දෙයකට ලෝකය

සමවීමෙහි සහ ඒ සඳහා මුල පිරීමෙහි කිසිදු බලපෑමක් නොමැති බව ද තීරණය කළෙමු. අල්ලාහ් ගේ ඒකීය බව පිළිගනිමින්, ඔහුට කිසිම සහකරුවෙකු නොමැති බව තීර්ණය කරමින් අපි ශුද්ධවූ කුර්ආනය අනුගමනය කළ යුත්තෙමු. එය මෙසේ ප්‍රකාශ කරයි.

''අල්ලාහ් ට සමානව අන් කිසිවෙකුට නැමදුම් නොකරන්න.'' (72:18)

'' අල්ලාහ් වෙනුවට වන්දනා කිරීම සඳහා ඇතැම් වස්තූන් තෝරාගන්නා සමහරෙක්, ජනයා අතර වෙති ''(2:165)

''.....හෝ ඔවුනු අල්ලාහ් හැර වෙනත් මැදිහත් වී යාඥාකරන්නෙකුව තෝරාගන්නෙහුද? පවසන්න: ඔවුන්ට කිසියම් දෙයක් කෙරෙහි වූ බලයක් හෝ බුද්ධියක් ඇත්තේද''? (39:43)

තවද අපි අල්ලාහ් හැර ආරක්ෂකයන් තෝරා නොගත යුත්තෙමු.

'' අල්ලාහ් හැර ආරක්ෂකයන් ලෙස තෝරාගනිති. අප ඔවුන් නමදින්නේ ඔවුන් අපව අල්ලාහ් වෙතට ළං කිරීමටය (යයි කියති)'' (39:3)

අපි සාතන්ට හෝ පාපිෂ්ඨයෙකුට හෝ ඔහු (අල්ලාහ් ට එරෙහි වූ හිතුවක්කාරී පාලකයෙකුට හෝ ආදර ගෞරව නොකළ යුතුය.

තවද,

''ඔබටම අප නමදිමු; ඔබගේම පිහිට පතමු.

මෙම ක්ෂේත්‍රයම පහත සඳහන් අධ්‍යයනයන් ඇතුළත් වේ.

1. නැමදුම

2. ප්‍රශංසා කිරීම

3. අවනත වීම

නමස්කාරය සහ කැපවූ භක්තිය, අපි අපව අල්ලාහ් ඉදිරියේ ශීර්ෂ නමස්කාරය (සජ්තාංග නමස්කාරය) කරවීමේ ක්‍රියාවන්හී සමන්විතව ඇත්තේය. නිදසුනක් ලෙස දණ ගසා ශීර්ෂ නමස්කාර කිරීමේදී ඔහුගේ දිව්‍ය බලය හා සම්පූර්ණත්වය ඉදිරියේදී අපගේ සම්පූර්ණ අවනත වීම සහ පරම යටහත් පහත් භාවය සහතික

කෙරෙන වචන අපි උච්චාරණය කරමු. ඒ සමගම ඒවා භෞතික ආශාවන් සහ ලෛංගික පෙළඹීම්වලට එරෙහිව අප ආරක්‍ෂා කරගැනීම සඳහා අපගේ අවධානය ප්‍රාරම්භකයාණන් වෙතට යොමු කරවන්නේය.

සෑම ආගමකම ජනයා සතුව ඔවුන්ගේ යටහත් පහත භාවය ප්‍රදර්ශනය කිරීමේදී (ඇතැම් විට මිථ්‍යා ඇදහිලි සමූහයක් හා සම්බන්ධ වූ) සිරිත් විරිත් හා සම්ප්‍රදයයන් රාශියක් ඇත්තේය. ඉස්ලාමයේ වන්දනාමාන කිරීමේ සංකේතය දෛනික නමස්කාරය (සලාතය ඉටු කිරීම) වන්නේය. එය මිනිසාගේ සම්පූර්ණ ශීර්ෂ නමස්කාරය සහ පරම වහල් භාවය අති ශ්‍රේෂ්ඨවන්තයා (වූ අල්ලාහ්) ඉදිරියේ පෙන්නුම් කරන්නේය.

අල්ලාහ් හැර අන් දෙයක් ප්‍රශංසා කිරීම හා ශීර්ෂ නමස්කාර කිරීම නමස්කාරයක් ලෙස නොසැළකුවද එය ඇත්ත වශයෙන්ම අල්ලාහ් ගේ ඒකීය බවට විරෝධී සංකල්පය (ෂිර්ක්) ලෙස සැළකේ. ඇතැම් ජනයා ඉදිරියේ දණ ගැසීම, ඔවුන් කෙරෙහි වහල්භාවය ප්‍රකාශ කිරීම, සම්පූර්ණ අවනතභාවය සහ යටහත් පහත් භාවය පිළිගැනීම සහ කෙනෙකුගේ කැමැත්ත සහ නිදහස නිෂ්ප්‍රභා කිරීම මෙ සනයට ඇතුළත් විය හැකිය. මුස්ලිම්වරුන් තම ශීර්ෂ නමස්කාරය කරන්නේ අල්ලාහ් ඉදිරියේදී පමණක්ම වන අතර ඔහුව ඔවුන්ගේම ස්වාමියාණන් හා අධිපතියාණන් ලෙස සළකති. අනෙක් සෑම කෙනෙක්ම බෙලහීනත්වයෙන් පෙළෙන මැවිම් ලෙස ඔවුහු සළකන්නේ ඒ සෑම කෙනෙක්ම අල්ලාහ් ගේ කරුණාව හා ආශීර්වාදයේ අවශ්‍යතාවයෙන් යුතුව සහ පරමාධිපතියාණන් ගේ නියමයට හා කැමැත්තට විෂයවස්තු වී සිටින බැවිනි. මුස්ලිම්වරුන් විශ්වයේ ශ්‍රේෂ්ඨතම පුද්ගලයාව එනම් ඉස්ලාමයේ උත්තම වක්තෘන්ව පවා අල්ලාහ් ගේ මැවීමක් හා සේවකයෙකු ලෙස සළකති. ඇත්ත වශයෙන්ම ඔවුන් මෙම සත්‍යය ඔවුන්ගේ දෛනික නැමදුම් වලදී (සලාතයේදී) සහ වෙනත් අවස්ථා රාශියකදී පුන පුනා ප්‍රකාශ කරන අතර ශුද්ධවූ කුර්ආනය පවා මුහම්මද් තුමාණන් අල්ලාහ්ගේ සේවකයෙකු ලෙස හඳුන්වා දෙයි. නිදසුනක් ලෙස, මුහම්මද් තුමාණන් අල්ලාහ් විසින් මානව වර්ගයාගේ මාර්ගෝපදේශකයා සහ නායකයා වශයෙන් පත් කරන අවස්ථාවේ අල්ලාහ් එතුමාණන්ට මෙසේ අමතයි.

''ලෝ වැසියනට අවවාද කරන්නෙකු ලෙස ඔහුගේ (සේවක) වහලා වෙත ෆුර්කානය පහළ කළ ඔහු (අල්ලාහ්) අති ශ්‍රේෂ්ඨය'' (25:1)

''අපගේ ස්ථිරසාර සළකුණු ඔහුට පෙන්වනු පිණිස, පරිශුද්ධ වූ (මස්ජිදුල් හරාම් නම් වූ) දේවස්ථානයේ සිට, අප විසින් එහි අවට ආශීර්වාද කරන ලද (මස්ජිදුල් අක්සා නම් වූ) දුරස්ථ දේවස්ථානය වෙත රාත්‍රියකදී ඔහුගේ වහලා (සේවකයා)ට යැමට සැළැස්වූ ඔහු (අල්ලාහ්) සුවිශුද්ධය''(17:1)

මුහම්මද් තුමාණන් එතුමාණන් ගේ උතුම් බව හේතු කොට ගෙන ජනයා දෙවියෙකු ලෙස නොසැළකීම සඳහා මේවා පහළ විය.

සාමාන්‍යයෙන් වන්දනාමාන කිරීම, ගෞරව කිරීමත් සමගම සම්බන්ධ වී ඇති අතර අපි අපගේ දෛනික නමස්කාර (සලාත) යේදී අල්ලාහ්ට ගෞරව දක්වමු. ස්තුති කරමු; ප්‍රශංසා කරමු; උසස් බව පුදමු;

අඩුපාඩුකම් ඇති දෝෂ සහිත බවින් සහ අපිරිසිදු බවින් ඔහු (අල්ලාහ්) නිදහස් හා පාරිශුද්ධ වන බව අපි දන්නා අතරම ඔහුට ප්‍රශංසා කිරීම, ගරු කිරීම, සුවිශුද්ධ කිරීම සහ ඔහුගේ පරමෝත්කෘෂ්ඨ බව පිළිගැනීම යනාදී නොයෙක් ආකාර වලින් අපි ඔහුට ආදර ගෞරව දක්වමු.

පරම උත්කෘෂ්ඨ ලෙස ගෞරව දැක්වීම ඉටුකරනු ලබන්නේ අල්ලාහ් ට පමණය.(1:1) අල්ලාහ් හැර අන් දෙයක අංග සම්පූර්ණත්වය සහ සත්පුරුෂ භාවය සීමා සහිත හා යහපත් වන්නේ අල්ලාහ් ගේ අපරිමිත සාරය පමණක් වන නිසා ද වස්තුවකට හෝ පුද්ගලයෙකුට සීමා රහිතව ප්‍රශංසා කිරීමක් හෝ ගරුකිරීමක් අප විසින් නොකළ යුතු බව ඉන් අදහස් වේ.

මනුෂ්‍යයෙක්ව වර්ණනාත්මකව ප්‍රශංසා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් උදම් අනන ඉච්ඡා බස් ද සියලු ක්ෂෙත්‍රයන් වල අතිශයෝක්තියකින් මුසා බස් කීමේ පුරුද්දක් ද අපට ඇති වන්නේය. තවද මෙය මුරණ්ඩු , හිතුවක්කාරී, අහංකාරජනයාට ඔවුන්ගේ අසම්පූර්ණ බව තේරුම් ගැනීමට හා පිළිගැනීමට නොහැකි තත්ත්වයකට පත්වීමට දිරිමත් කරන්නේය. මෙයින් ඇඟිල්ලේ තරමට ඉදිම්ම තිබිය යුත්තා සේ ඔවුන් ඔවුන්ගේ සීමාවන් තුළ පමණක් ක්‍රියා කිරීමට නොහැකි තත්ත්වයක්

උදවන්නේය. අධික ප්‍රශංසාව (අල්ලාහ් ට එරෙහි) ව්‍යාජ බලයන් ගොඩ නැගෙන අතර ඒවායේ විපාකය ලෙස සමාජයට මහත් ව්‍යසනයක්ම ඇති වන්නේය. ඒ අනුව ඉස්ලාමයේ සීමා රහිත ප්‍රශංසාවන් සහ ගරු බුහුමන් දැක්වීම අල්ලාහ්ට පමණක් විය යුතු යයි නියම කොට ඇත.

යටහත් පහත් භාවය සහ අල්ලාහ්ට ආධ්‍යාත්මිකව යටත්වීමේ තත්ත්වයේ ප්‍රතිඵලය වන්නේ අවනත භාවයයි. එනම් අප අපව අල්ලාහ් ගේ වහලුන් ලෙස සළකා අල්ලාහ්ට පමණක් නමස්කාර කිරීමෙන් අපි ස්වීයව අල්ලාහ් ගේ අණට කීකරුවන්නෙමු. අවිවාදත්මක හා අව්‍යාජ අවනත වීම ද විශේෂයෙන් අල්ලාහ්ටම විය යුතුය. වෙනත් වචන වලින් පවසන්නේ නම්, අල්ලාහ් හැර වෙනත් ඕනෑම දෙයකට; එය යම් වස්තුවක් හෝ සිවුපාවෙක් හෝ මනුෂ්‍යයෙක් හෝ වේවා අවනත වීමක් තිබිය හැකි වුවද එය කිසියම් නිශ්චිත අවස්ථාවලදී හා සීමා සහිත තත්ත්වයන් යටතේදීය. ඉස්ලාමයේ වක්තෘන් මුහම්මද් තුමාණෝ පවා ස්වාධීන ලෙස කිසිම අණක් නොකළහ.

"ඔහුගේ අණ (වහී නම) දිව්‍ය අනාවරණයෙන් උත්පාදනය වුණේය." 53:4

අනාවරණය කරන ලද්දක් එතුමා විසින්ම වෙනස් කරනු ලැබීමට හෝ ඔහු (අල්ලාහ්) ගේ අවසරය නොමැතිව අණ නිකුත් කිරීමට හෝ නොහැකි විය.

"අහෝ! මුහම්මද් පවසන්න. මාගේම කැමැත්ත පරිදි එය මට වෙනස් කළ නොහැකිය. මා අනුගමනය කරනුයේ මට පහළ කරනු ලැබූ දෙයයි. මම මාගේ ස්වාමියාණන් හට අවනත නොවුයේ නම් බිය ජනක දිනයේ විපාකය ගැන බිය වෙමි." 10:15

එ අනුව අල්ලාහ් හැර වෙනත් දෙයකට අවනතවීම, යම් නිශ්චිත නීතිරීති වලට සීමාවන අතර කිසි කෙනෙකු, යාන්ත්‍රික ලෙස අවනතවීම සහ අන්ධ ලෙස යටහත් පහත් වීම බලාපොරොත්තු නොවිය යුතුය.

එහෙයින් අප නිගමනය කරන්නේ අල්ලාහ් ගේ ඒකීය භාවයට සමාන්තරව ඉස්ලාමය අල්ලාහ්ට අවනතවීමට, ගෞරව දැක්වීමට සහ වන්දනාමාන කිරීමටත් සියලු මැවීම් ඔහු (අල්ලාහ්) ගේ සේවකයින් ලෙස සැළකීමටත් අපට අණ කරන බවයි.

දෙවන පරිච්ඡේදය

අල්ලාහ් අවබෝධ කර ගැනීමේ මාර්ගයන්

පුරාණයේ සිටම මිනිසා ඔහුගේ ඥානය, දැනුම සහ අවබෝධ ශක්තිය මගින් මෙන්ම ස්වභාව ධර්මය තේරුම් ගැනීම තුළින් ද අල්ලාහ් ගැන දැන ගැනීමට හා නොයෙකුත් විධි හා උපක්‍රමයන් යොද ගත්තේය. ඔවුන් මනුෂ්‍යයන් වන නිසා ඔවුන්ගේ බුද්ධි මට්ටම් සහ අවබෝධ කර ගැනීමේ ශක්තිය එක සමාන නොවන හෙයින් , අල්ලාහ් ගේ සමීපත්වයට පත්වීමට බොහෝ මාර්ගයන් පවතින බව උපකල්පනය කළ හැකිය.

අංශු, සෛල සහ පරමාණු ඇතුළුව පවතින්නාවූ සියලුම ස්වාභාවික දේවල එකතුවේ ප්‍රමාණය මෙන් අල්ලාහ්ට සමීප විය හැකි මාර්ගයන් විශාල ප්‍රමාණයක් ඇති බව ද කෙනෙක් සිතන්නට හැකිය. විද්‍යාව යනු හේතුකාරකයන් සහ ප්‍රතිඵල තේරුම් ගැනීම ද ස්වභාවික බලවේගයන් හා පවතින සම්බන්ධතාවයන් තේරුම් ගැනීමද වන බැවින් ඇත්ත වශයෙන්ම විද්‍යාව තුළින් අල්ලාහ් ගැන දැන ගත හැකි වන අතර ස්වභාවය තේරුම් ගැනීම අල්ලාහ් දැන ගැනීමට ඇති ඉතාම වැදගත් මාර්ගයයි. එහෙයින් ''අල්ලාහ් ගේ පැවැත්ම ඔප්පු කිරීමේ මාර්ගයන්'' නියෝජනය කිරීම් වස් කෙනෙකුට ස්වභාවික විද්‍යාව විෂය ක්ෂේත්‍රය තුළ වූ විද්‍යාත්මක පරීක්ෂණ , අත්හද බැලීම ; මානව, සත්ව සහ ශාඛ පිළිබඳ ව වූ කායික විද්‍යාව; ජීව විද්‍යාව; භූ විද්‍යාව; රසායන විද්‍යාව; භෞතික විද්‍යාව; තාරකා විද්‍යාව යනාදියෙන් ප්‍රයෝජන ගත හැකිය. පහත පිටු වල අල්ලාහ් හඳුනා ගැනීම පිළිබඳව වූ මාර්ගයන් කිහිපයක් අපි ඉදිරිපත් කරමු.

1. ලොවේ මැවීම

හේතුඵල වාදයෙන් අපට ඉගැන්වෙන්නේ, සිදුවන සෑම සිද්ධාන්තයක් පිටුපස හේතුවක් තිබෙන අතර හේතුවක් නොමැතිව ඵලයක් හට ගත නොහැකි බවය. හේතූන් හා ඵලයන් විවිධ නිර්මාණයන් අතර සම්බන්ධතාවයන් සොයා ගැනීමට මිනිසා විසින් කරන ලද මුළු මහත් උත්සාහයන් සමූහය විද්‍යාව වන බව අප සිහි තබා ගත යුතුය. විද්‍යාත්මක ප්‍රයත්නයන් විශාල ප්‍රමාණයක් පදනම් වී ඇත්තේ මෙ දර්ශනික මූලයන් මතය.

ඒ හැරුණු කොට හේතුව සෙවීම මිනිසාගේ සහජ ස්වභාවයකි. එනම් මිනිසෙකු චිත්‍රයක්, ගොඩනැගිල්ලක්, යමෙකුගේ පාද

සළකුණු යනාදිය බැලීමෙන් හෝ ශබ්දයක් ඇසීමෙන් හෝ ඔහුගේ තේරුම් ගැනීමේ මට්ටම කුමක් වුවද මේවායේ හේතුව සහ උත්පාදනය කළ කාරකය සොයන්නේ, මේ සැම දේකම සිදුවීම සෙවීමට ඔහුට කලින් නියම කරනු ලැබ ඇත්තාක් මෙනි. ඔහු විශ්වයේ මැවීම සහ එහි මැවුම්කරුවාණන් පිළිබඳ විමතියට පත්වන්නේ ඒ නිසාය.

ස්වභාව ලෝකය, සැබැවින්ම මවන ලද්දක් මිසක්, එය කලින් පැවතුණු දෙයක් විය නොහැකිය. මෙම විෂයය භෞතික විද්‍යාවේ සහ දර්ශනිකවාදයේ මතයේ සිට කෙරෙන ස්වාධීන සාකච්ඡාවකින් සමන්විත වන්නේය. එහිදී අඛණ්ඩ චලනයට හා විපර්යාසයන්ට වස්තු වන භෞතික වස්තුවක් කලින් පැවතුණු හෝ ස්වාධින විය නොහැකි බව තර්ක කරන ලදී. එහෙයින් කුඩා යමක් හෝ සිදුවීම අප විසින් දක්නා ලද විට අප හේතුව සොයන්නා සේම අප මැවීම දකින විට මැවුම් කරුවාණන් කවරේදැයි සොයන්නෙමු

2. චලනය

නිශ්චලව.පවතින්නා වූ කිසිම වස්තුවකට ඉබේම ස්විය කැමැත්තෙන් එය විසින්ම චලනය විය නොහැකි අතර චලනය වූන්නාවූ කිසිම වස්තුවකට ඉබේම නැවතීමට ද නොහැකි බව පැහැදිලිය. ගුවන් යානයක්, වාහනයක්, රෝදයක්, කුහුඹුවෙක් මදුරුවෙක් යනාදී කුමක් වුවද චලනය වෙමින් පැවතිය හැක්කේ ඒවාට ලබා දෙනු ලබන ශක්ති ප්‍රමාණය අනුව පමණය. කුඩාම පරමාණුව සහ සුවිශාල සක්වළ ඇතුළුව මුළු මහත් භෞතික ලෝකයම චලනය වෙමින් පවතින බව අපට නිරීක්ෂණය කළ හැකිය. විද්‍යාමාන වන සියළු වස්තුවකම චලනය, ස්වභාව ධර්මයේ පවතින හේතුවක් නිසා ඇතිවන්නා සේම මුළු මහත් විශ්වයම එහි පවතින පරිණාම විකාශනය, වෙනස්වීම, සහ විපර්යාසයන් සියල්ල සමඟ මේ රීතියට ව්‍යතිරේකයක් නොවන බවට කිසිම සැකයක් නැත.

ඉස්ලාමයේ උත්තම වක්තෘන් මුහම්මද්තුමාණන් ගේ ප්‍රශ්ණයට පිළිතුරු දෙමින් වයසක කාන්තාවක් ඇගේ නූල් කටින රෝදය හා සම්බන්ධ කොට තර්ක කළාය. ඇය ඇගේ නූල් කටින රෝදය

කරකවමින් ම ''චාලක ශක්තියක් නොමැතිව ලෝකය භ්‍රමණය වන්නේ කෙසේද? යි ඇසුවාය. මුහම්මද් තුමාණෝ කාන්තාවගේ හේතු දැක්වීම ස්ථිර කළහ. මෙම චාලන මූලධර්මය ඇත්තෙන්ම දර්ශනිකවාදීන් සහ විද්වතුන් විසින් අල්ලාහ් ගේ පැවැත්ම උසස් මට්ටමකදී පිළිගැනීම සඳහා පාදක කොට ගත් ඉතා වැදගත් මූලධර්මවලින් එකකි.

චලනය වන්නාවූ සෑම වස්තුවකම චලනයන් එය ක්ෂුද්‍ර වුවත් සුවිශාල වුවත්, මේ ලොවේ පවතින චාලක ශක්තියක ප්‍රතිඵලයක් නම්, එම කාරණය; අල්ලාහ් මුළු මහත් විශ්වයේම මෙහෙයුම් බලය වන්නේය යන්නට අනුකූල නොවන බව අපි අමතක නොකළ යුතුයි. සෑම වස්තුවක්ම මේ ලොවේ පවතින්නාවූ හේතුවක ප්‍රතිඵලයක් ය යන හේතුඵල වාදයට මෙය සමාන වන අතරම අල්ලාහ්;නියම මූල ප්‍රකෘති ප්‍රභවය සහ විශ්වයේ හේතූන් වලට පදනම් වූ මූල හේතුවද වන්නේය.

මෙම ගැටලුව, වැඩි දෙනා සමහර භෞතිකවාදීන් පවා නොමග යවනු ඇත. ප්‍රභවය සඳහා අවශ්‍ය කරන කාරකය, ලෙස, අල්ලාහ් සෘජුවම ආරෝපණය කරනු ලබන මතය විශ්වාස කිරීමටත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ හේතූන් හා ප්‍රතිඵල ප්‍රතික්ෂේප කරමින් සිය කැමැත්ත අනුව ක්‍රියාකළ හැකි හා අක්‍රමික වූ ලෝකයක අපි ජීවත්වන බවටත් ඉන් පෙළඹිය හැකිය. මෙම නිගමනය සම්පූර්ණයෙන්ම වැරදිය. අල්ලාහ් ලෝකය මැව්වේය. සියලුම බිහිවීම් අතර සූක්ෂ්ම හා සාමකාමී සම්බන්ධයක් පවතී. සෑම ඵලයක් පසුපසම හේතුවක් පවතින්නේය. හේතුඵලවාදයේ රීතින් එහි සියලුම ස්වරූපයෙන්ම සොබාදහම තුළ දිගටම පවතින්නේය. මෙසේ සෑම චලනයක් සඳහා වූ ද ස්වභාවික චාලක ශක්තිය හඳුනාගනිමින් අප අපගේ තර්ක කිරීමෙන් හෝ ශ්‍රේෂ්ඨ මෙහෙයුම් බලය සහ ලෝකයේ පරම පොළඹවන්නාව අමතක කිරීමෙන් හෝ වැලකෙන්නේ නැත. මූල ප්‍රකෘති හේතුව සහ ලෝකයේ මූලාරම්භකයාණන්ව, ස්වභාවික හේතු ඵල න්‍යායයන් නිරීක්ෂණය කිරීමෙන් අප ප්‍රතික්ෂේප කරන්නේ ද නැත.

අවසාන වශයෙන්, ස්වභාවික විද්‍යාව තුළින් අල්ලාහ් දැන ගැනීම පිළිබඳ ව වූ අල් කුර්ආනයේ ඇතුළත් පාඨ වලින් එකක් පමණක් ගෙන හැර දැක්වීමෙන් අපි සෑහීමට පත්වන්නෙමු.

''ඇත්තෙන්ම අහස් සහ පොළොව නිර්මාණයෙහි ද රෑ දහවල වශයෙන් මාරුවීමෙහි ද නුවණැතියන්ට සළකුණු තිබෙන්නේය. නැගිට සිටිමින් ද හිඳිමින් ද පැත්තට අලවී සිටිමින් ද අල්ලාහ් ව සිහි කරන්නෝ සහ පොළොව නිර්මාණය කිරීම ගැන මෙනෙහි කරමින් ''අපගේ ස්වාමිණි! ඔබ මෙය නිකරුණේ නිර්මාණය නොකළෙහිය. ඔබ සුවිශුද්ධය. ගින්නෙහි වේදනාවෙන් අපව ආරක්ෂා කර ගනු මැනව.'' (3:189, 190)

3. ජීවින්ගේ ස්වභාවය පිළිබඳ සාධකය

(අ) ජීවින්ගේ ස්වභාවය කුමක්ද?

තම දරුවා කෙරෙහි මව දක්වන ආදරය; සෑම සියළු සිදුවීමකම හේතුව දැන ගැනීම සඳහා මිනිසාට සහජයෙන්ම පිහිටි කුතුහලය; ජීවත්වීමට සහ නොමැරී බේරී සිටීමට සතුන්ට ඇති ආශාව; සහජ ලිංගික හැකියාව හෝ ඇතැම් අයට අනුව සාමුහික ජීවන රටාවක් සඳහා මිනිසා දක්වන කැමැත්ත යනාදිය මිනිසාගේ සහ සතුන්ගේ ස්වභාවයේ අන්තර්ගත උරුමයන්ය. මේවා 'සහජ උරුමයන්' ලෙස හැඳින්වේ.

(ආ) දෙවියන් වහන්සේ දැනගැනීමේ ස්වභාවය

තමන්ගේ මෙන්ම අනෙකුත් ජීවින්ගේ පැවැත්මේ හේතුව පිළිබඳව මානව වර්ගයාට ඇති කුතුහලය; ඔහු කෙරෙහි කරුණාව හා ආශීර්වාදය පිරිනමන්නාට ස්තුති කිරීම සඳහා ඔහුට ඇති ආශාව; ශ්‍රේෂ්ඨ සර්ව සම්පූර්ණත්වය කෙරෙහි වූ ඔහුගේ අවධානය සහ තමාට කිසිවක් කර කියා ගත නොහැකිව බලාපොරොත්තු සුන්වූ අවස්ථාවක එමගින් ආරක්ෂාව පැතීම; යනාදිය සහජ ස්වභාවයන්ගෙන් සමහරක් වන අතර අපි ඒවාට 'දෙවියන්වහන්සේ දැනගැනීමේ ස්වභාවය' වශයෙන් හඳුන්වමු.

(ඇ) සහජ නැඹුරුව නොතකා හැරීම

සියළු ජීවින් ජීවිතයේ දයාදයන් සහ අරුමයන් භුක්ති විඳීම සඳහා ඔවුන්ගේ යහපත් සෞඛ්‍ය තත්ත්වය සුරක්ෂිතව තබාගැනීමට සුවිශේෂ උනන්දුවක් දක්වන කාරණයකි. ඔවුහු

තමාගේම ස්වකීයත්වයට ප්‍රිය කරන අතර තමා සජීවී ලෙස සිටීමට හැකි සෑම උත්සාහයක්ම දරති. කෙසේ වෙතත්, අපට අසනීප තත්ත්වයක් ඇතිවූයේ නම්, සෞඛ්‍යමය කරුණු මත පරීක්ෂා කොට සුවය ලබා ගැනීමට නිසි පියවර ගනු ලැබුවහොත් මිස මේ ස්වභාවික ආශාවන් ඉබේම තේරුම් ගත නොහැකිය. මිනිසා තමාට බලපෑම් කිරීමට ස්වභාවික හා සමාජ පරිසරයට ඉඩ දී ඔහුටම හානිදායක වන කිසියම් දෙයකට ඇබ්බැහි වන බව සැබෑය.

එමෙන්ම දෙවියන් වහන්සේ 'දැන ගැනීමේ ස්වභාවය' ට සිත තුළින්ම හානි පැමිණවීම සහ එය ස්ථිරවම තහවුරු කිරීමට අපොහොසත් වීමෙහි ප්‍රතිඵලය ලෙස අභ්‍යන්තර ස්වභාවය වෙනතකට ගමන් කිරීමද නොසැළකිල්ලේ තිරය මගින් මේ අභ්‍යන්තර ස්වභාවය දෘශ්‍යමානවීම අඩුවීම ද ඇති විය හැකිය. නමුත් මිනිසා, තම ඉන්ද්‍රියයන් පිනවනු ලබන්නාවූද, පුරුද්දක් ලෙසට පත්කරගනු ලැබ ඇත්තාවූද, බාහිර අලංකාරයෙන් පමණක් ඇත්තාවූද, ඔහුට විනෝදයක් ලබාදුන්නා වූද, වැදගත් වූ බලවේගයට ඔහුගේ නිසි අවධානය යොමුකිරීමෙන් ඔහු වළක්වන්නානූද, දේවලින් ඔහුගේ බලාපොරොත්තු සුන්වී කිසිත් කර කියා ගැනීමට නොහැකිවූ විටෙක, නියම අව්‍යාජ දයාබරයාණන් කෙරෙහි වූ ඔහුගේ අවධානය මගින්ම ඔහුට එය විද්‍යාමාන කර ගත හැකිය.

එම නිසා අපි , මිනිසා කැමති වූවත් නැතත් දෙවියන් වහන්සේ දැන ගැනීමේ ස්වභාවය සෑම මිනිසෙකු සතුව පවතින බවට නිගමනය කරමු. මෙම ස්වභාවයට ඇතැම් විට යම් යම් බාධාවන් පැමිණිය හැක. නමුත් ඕනැකමින් සියුම් ලෙස සොයා බලන විශේෂිත තත්ත්වයන් වලදී මේ බාධාවන් අතුරුදහන් වී ඒ වෙනුවට මෙමෙ අභ්‍යන්තර අවශ්‍යතාවය, එමගින්ම එය විද්‍යාමාන කර ගන්නේය.

(ඇ) දෙවියන් වහන්සේ දැන ගැනීමේ ස්වභාවයෙන් ඉවත්ව යාමේ හේතුව

මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් ගේ රෝග විනිශ්චය පිළිබඳව වූ පර්යේෂණයකින් පෙන්නුම් කෙරෙන ආකාරයට ඇබ්බැහි වීමේ

පළමු අදියරයේදී ඔවුන්ගේ ඉන්ද්‍රිය පද්ධතිය මගින් බලහත්කාරයෙන් වස, දරා සිටිනු ලබන්නේය. එසේ වුවද නැවත නැවතත් පාවිච්චි කිරීම තුළින් ඔවුහු පුරුද්දට හෝ 'දෙවන ස්වභාවයට' යටත් වන්නාහ.

මිනිසා, පුරුද්දක් ලෙසම ද්‍රව්‍යමය හා දැකිය හැකි ක්‍රියාවන් පසු පස ලුහු බැඳ යයි. ඔහුට ආශීර්වාදය ලබා දුන් ස්වාමියාණන් ගේ පැවැත්ම පිළිබඳව ඔහු සොයා බැලීමේදී ඔහුගේ අවධානය, මතුපිට අලංකාරයන්ගෙන් පමණක් යුක්තවූ හා බාහිරව පවතින්නාවූ කරුණු මත යොමු කරන්නේ ඒ නිසාය. ඔහුගේ මැවුම්කාරයාණන් පිළිබඳව තේරුම් ගැනීමට උත්සාහ කිරීමේදී ඔහු මූලිකමය හා දැකිය හැකි හේතූන් සහ ප්‍රතිඵලයන් ගේ තත්ත්වයේදී නැවති සිටින අතර විශ්වමය හේතුවක් පිළිබඳව අවධානය යොමු නොකරන්නේය.

කෙසේ වුවද අංග සම්පූර්ණ වූද, පරම බලය සතුව පවතින්නාවූද, පැවැත්මක් කෙරෙහි දක්වනු ලබන ලැදියාවක් මනුෂ්‍ය ස්වභාවයට ඇත්තේය. සමහර විට මිනිසා මෙ බලය ප්‍රතික්ෂේප කරන්නේ නම් එසේ කරන්නේ යම් නිශ්චිත හේතූන් නිසා වන අතර එම හේතූන් මෙසේ අපට පෙළ ගැස්සිය හැකිය.

එනම්: ලෞකික හා කාමුක ආශාවන්ගේ බලපෑම; ජීවන රටාවේ පවතින්නාවූ රැවටිල්ල සහ ව්‍යාජ වූද අනවශ්‍ය වූද අහංකාරය හා නොසැළකිල්ල කෙරෙහි අපගමනය වන ඇතැම් ආගමික ජනයින්ගේ හැසිරීම; දේවධර්මවාදීන් යැයි අයිතිවාසිකම් පාන අයගේ දෝෂ සහ වැරදි; අල්ලාහ්ගේ හා ආගමෙහි නාමයෙන් කෙරෙන අනන්ත වූ සමාජමය හා සදාචාරාත්මක අතිසි පරිහරණය; ඇතැම් ස්වභාවික සිදුවීම් වල හේතුඵලත්වය දෙස නොබලා, ඒ සෑම එකක්ම දිව්‍ය කැමැත්ත වෙතට ඍජුව ආරෝපණය කිරීම වැනි වූ, අල්ලාහ් පිළිබඳ පවතින වැරදි සංකල්පවල ප්‍රතිඵලයන් වන සාවද්‍ය නිගමනයන් යනාදියයි. මැවීමෙහි ක්‍රියාවලියෙහි ප්‍රාරම්භයේදීම, සියලු භෞතික සිදුවීම් වල ක්‍රියාකාරීත්වය සඳහා දිව්‍යමය පූර්ව සැළැස්ම විසින් සුදුසු උපාය විධි ක්‍රම සහ නියෝජිත කාරකයන් පත් කරනු ලැබ ඇති බව ද සෑම ප්‍රතිඵලයකටම හේතුවක් පවතින බව ද එවැනි ජනයා

නොදැන සිටිති. කෙසේ වෙතත් ඔහු (දෙවියන් වහන්සේ) ගේ අධිෂ්ඨානය හා කැමත්ත රහිතව කිසිත් සිදු නොවන්නේය.

දෙවියන් වහන්සේ ගේ දැන ගැනීම පිළිබඳ ව වූ මිනිස් ස්වභාවයේ විෂය ක්ෂේත්‍රය තුළ මෙම කරුණු යම් අයුරක අශුභවාදයක් හා අපගමනයක් ඇති කළ ද වාචිකව අල්ලාහ්ව නිෂේදනය කරන අය ඔවුන්ගේ හෘදය සාක්ෂිය මගින් අති උත්තරීතර පැවැත්ම එනම් අල්ලාහ් ව පිළිගනිති. එහෙයින් ඇත්ත වශයෙන්ම, මානව පැවැත්ම පිළිබඳ මතවාදීහූ (Existentiolists) පවා දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප නොකරන අතර ඔවුහූ සැබැවින්ම මෙසේ පවසති. "දෙවියාණෙනි (අව්‍යාජ දෙවියාණන් වූ ඔබ) කල්පිත දෙවියන්ගෙන් මේ ලොව ආරක්ෂා කර දෙනු මැනවි"(ජීන් පෝල් සාර්ටේ ගේ අනුගාමික දර්ශන ගුරුකුලයෙන් උපුටා දක්වන ලදී)

(ඉ) දෙවියන්වහන්සේ දැන ගැනීම සඳහා වූ අත්‍යවශ්‍ය පදනම; මානව ස්වභාවය

දෙවියන් වහන්සේ ගැනද මිනිසා සහ මැවුම් කරුවාණන් අතර ආදරය හා දයාව ප්‍රකාශණය වීම ගැන ද දැන ගැනීමට ඉතාමත්ම අත්‍යවශ්‍ය පදනම වන්නේ, මිනිසා ඔහුගේ මානව ස්වභාවය දෙසට හැරීමයි.

සියලු තර්ක වල කාර්ය භාරය වන්නේ මිනිසාව ඔහුගේ හෘද සාක්ෂිය තුළින් ඔහුගේ අවධානය අව්‍යාජ නියම මානව ස්වභාවය කෙරෙහි යොමු කරවීමයි.

සුප්‍රසිද්ධ දර්ශනිකවාදියෙකු වූ ද ගණිතඥයෙකු වූද පැස්කල්ට අනුව මැවුම්කරුවාණන් ප්‍රත්‍යක්ෂ කරනු ලබන්නේ හදවතින් මිසක් මනසෙන් නොවන බව මිනිසා තවම තේරුම් ගෙන නොමැත. එමනිසා මිනිසාගේ සාරය සහ ස්වභාවය පිළිබඳවවත් මිනිසා සහ මැවුම්කරුවාණන් අතර පවතින අනිවාර්ය සම්බන්ධතාවය පිළිබඳවවත් වචන කිහිපයක් ප්‍රථමයෙන් සඳහන් කිරීම වඩාත් සාධාරණ වන බව පෙනේ. එවිට අපි, අල්ලාහ් කෙරෙහි ආදරය සහ දයාව වැඩි කරන්නාවූ මනුෂ්‍ය ස්වභාවය මත අවධානය කේන්ද්‍ර ගත කිරීමට අපගේ හෘද සාක්ෂියට සුදුසු පසුබිමක්

ලබාදෙන්නාවූ, අනෙකුත් තර්කයන් වල කොටස් පරීක්ෂා කර බැලීමට, වඩාත් යහපත් තත්ත්වයකට පත්වන්නෙමු. මනුෂ්‍ය ස්වභාවයට පසුව අපි දිව්‍ය කරුණාව ප්‍රකාශණය වීම, දිව්‍ය යුක්ති ධර්මතා පටිපාටිය, සම්භාවිතා ගණනය කිරීම සහ අනෙකුත් විෂයයන් කිහිපයක් අධ්‍යයනය කරමු.

මනුෂ්‍ය ස්වභාවය පුබුදුකිරීම සඳහාවූ මාර්ගය

විශ්වයේ අන්‍යෝන්‍ය සම්බන්ධතාවය සහ පරිපූර්ණත්වය කෙරෙහි වූ එහි සාමාන්‍ය චලනය පිළිබඳ ව අප විසින් යොමු කරනු ලබන අවධානය, දෙවියාණන් වහන්සේ දැනගැනීමේ අපගේ ස්වභාවය පුබුදු කරන්නේ කෙසේද?

සෑම මැවීමක්ම තම පැවැත්මෙහි තත්ත්වය දියුණු කරගැනීමට සහ අවසානයේදී ලබා ගත හැකි වන පරිපූර්ණත්වය ළඟා කර ගැනීමට කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් යම් නිශ්චිත මාර්ගයක් ඔස්සේ පූර්ව සැලසුම අනුව ගමන් කිරීමට බැඳී සිටින බව විශ්වය පිළිබඳව කෙරෙන සමීප අධ්‍යයනයකින් අපට සොයා ගත හැකිය. පස යට පතිත කරන ලද ධාන්‍ය බීජය, වපුරන ලද බීජය, මවකගේ ගර්භාෂය තුළ වැඩෙන කළලය යන සියල්ලක්ම යම් නියත නීතින්ට අනුව පරිපූර්ණත්වය කරා යන ගමන අනුගමනය කළ යුතුව ඇත. වෙනස්වීම් වලට සහ විපර්යාස වලට ලක් වීමේ ක්‍රියාවලියේදී, එකිනෙකාට සහාය වීමට ද එකට එක්වී තම ගමන අඛණ්ඩව කරගෙන යාමට ද ඔවුන්ට අනෙක් ජීවීන්ගේ අවශ්‍යතාවයක් ඇති වන්නේය. නිදසුනක් ලෙස, පළතුරකට පැවැත්මක් ඇති කිරීමට ද එය ඉදීමට සැළැස්වීමට ද ජලය, වාතය, ආලෝකය, සහ අනෙකුත් බොහෝ රසායනික මූල ද්‍රව්‍යයන්, එකිනෙක සමඟ අන්‍යෝන්‍ය සහයෝගිතාවයකින් ක්‍රියා කළ යුතුය. අනන්ත හා අප්‍රමාණවූ ස්වභාවික නියෝජිත කාරකයන් සහ තත්ත්වයන් ගේ ප්‍රයෝජන ලබමින් සිවුපාවුන් ද අඛණ්ඩව ජීවත්වන අතර ඔවුහු ඔවුන්ගේ වාරයේදී අනෙකුත් ජීවීන්ට ප්‍රයෝජන සළස්වති.

සැබැවින්ම, මුළු විශ්වයම විශාල තනි පවුලක් බඳුය. එහි සෑම සාමාජිකයෙකුම, සෑම තනි පුද්ගලයෙකුගේ ඵල ප්‍රයෝජනය

සඳහා සහ මුළු පද්ධතියම ක්‍රමවත්ව පවත්වාගෙන යාමට වැඩ කළ යුතුය. මෙම පොදුවූ චර්යා පද්ධතියට නිසි අවධානය හා යොමු කරනු ලැබීමෙන් මනුෂ්‍ය ස්වභාවය අගතියෙන් හා පක්ෂපාති බවෙන් ද අයෝග්‍ය චේතනාවන්ගෙන් ද, පුද්ගලික පරමාර්ථයන්ගෙන් ද විවිධත්වයට පමුණුවන අදහස් වලින් ද නිදහස් හා ස්වාධීන වන්නේ නම් එයට, විශ්වය ඥනාන්විතවූ චේතනාවකින් මවා ඇති බව ද, එහි ද්‍රව්‍ය මූලයන් අතර නියත පැහැදිලි සම්බන්ධතාවයක් හා සහයෝගීත්වයක් පවතින බවද , සෑම ද්‍රව්‍ය මූලයක්ම යම් නියත අරමුණක් කෙරෙහි යොමු කරවා ඇති බව ද නිර්ණය කර ගත හැකි ලෙස ප්‍රබෝධය ලබන්නේය.

ඇත්ත වශයෙන්ම දෙවියන් වහන්සේ සෙවීමේ ස්වභාවය මිනිසා තුළ සහජයෙන්ම පිහිටා ඇත. කිසිම මානව හදවතක් මෙම හැඟීමෙන් තොරවූවක් නොවන්නේය. මුළු මහත් විශ්වයේම අඛණ්ඩ චලනය සම්බන්ධයෙන් එහි පරිපූර්ණ මූලාරම්භකයා සහ එහි නියම හා ප්‍රධාන පොළඹවන්නා පිළිබඳව මිනිසා තමාගෙන්ම හා අනායාසයෙන්ම ප්‍රශ්ණ කළ නොහැකිද? පරිපූර්ණත්වය නොසොයොන හා නියම ක්‍රමයකට ස්වභාවික ආශාවක් නොමැත්තා කවුද? කාරුණික හා බලධාරී වූ මැවුම් කරුවාණන් කෙරෙහි සිය කැමැත්තෙන් කරන ආදර ගෞරව දැක්වීම හා කෘතඥ පූර්වක භාවයක් පෙන්වීමට ඔහු නොහඟින කල් හී ඔහුගේ පැවැත්මේ අභිරහස්ද ඔහුගේ ශරීරයේ ව්‍යූහයද ඔහුගේ අවයව වල විස්තර ද මෙම අවයවයන් අතර පවතින්නාවූ සම්බන්ධතාවය ද නිරීක්ෂණය කරන්නා වූ ඔහු කවරේද?

සැබැවින්ම, මිනිසා, අවට පවතින කාරකයින් ගෙන් ද, පුරුදු වලින් ද, යම් නිශ්චිත ඉගැන්වීම් වලින් ද ඔහුට බලපෑම් කරනු නොලැබුවේ නම් ඔහු ගැනම බැරෑරුම් ලෙස සිතයි. ඔහුගේ අවධානය මහා කාරුණික වූ විශ්වාසයක් කෙරෙහි ඇදගනු ලබන බව ඔහු නිසැකවම තේරුම් ගනියි. සෑම දෙයක්ම මවන ලද බවත් ඒවා සර්ව බලධාරීයාණන්ගේ සැළකිල්ල හා කරුණාව යටතේ ජීවත්වන බව ඔහු සිතා ගනියි.

මනුෂ්‍ය ස්වභාවය අවදි කරවන්නාවූ අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමුකිරීම

මිනිසා සිය කැමැත්තෙන් තොරවම අප්‍රමාණ වූද අත්‍යවශ්‍ය වූද

හේතු වලට නීතිරීති වලට විෂය වස්තු වන්නේය. මාළුවෙකු ජලයෙන් වට කරන ලද ජලජ පරිසරයක සිටින්නාසේම මිනිසා ද අසීමිත වූ බලයකින් වටකරනු ලැබ සිටින්නේය.

මිනිසා, ඔහු මෙම ලොවේ ඉතාම කුඩා කොටසක් බව සිතයි. ඔහුට ද කිසියම් අවශ්‍යතාවයක් ඇති බව ඔහු තේරුම් ගනියි. මෙම අවශ්‍යතාවයන් සපුරා ලන්නේ කෙසේ දැයි ස්වභාවයෙන්ම ඔහු තමාගෙන්ම විමසයි. ඔහු තම හෘද සාක්ෂිය තුළින් අවශ්‍යයෙන්ම විය යුතු මූල ප්‍රකෘතිය පිළිබඳව; සිතෙහි අදහස් පහළ කරගන්නේ, ප්‍රත්‍යක්ෂ වන ලෝකයටත් වඩා සර්ව ප්‍රකාරයෙන්ම ඉතා බලවත් වූ ශ්‍රේෂ්ඨ බලයක් පිළිබඳව දැනුවත් වීමෙනි. එම බලය සෑම දෙයක් කෙරෙහිම තම ආධිපත්‍යය පිහිටුවාගෙන ඇත්තේය. එම බලයට ඔහු අවශ්‍ය නොවන නමුත් එමගින් යම් නිශ්චිත රීතීන් හා බලයට කිසිවෙකු (ගේ සහාය) අවශ්‍ය නොවේ. නමුත් අනෙක් සියල්ලන්ටම එම බලය අවශ්‍ය වන්නේය.

මෙය මිනිසාගේ හෘද සාක්ෂියේ හඬයි. මනුෂ්‍ය ස්වභාවයේ විලාපයයි. මිනිසා අහිතකර ප්‍රගුණ කිරීම්වලින් සහ පුද්ගලික අරමුණු වලින් ඔහුව ආරක්ෂා කරගන්නේ නම් නිසැකයෙන්ම මෙම අභ්‍යන්තර පෙලඹවීම මගින් ඔහුට මෙම ලොවේ බළධාරීවූ මැවුම්කරුවාණන් කරා මග පෙන්වනු ලබන්නේය. එම නිසා අල්ලාහ් ගේ පැවැත්ම පිළිබඳව ඔහු, ඔහු සමගම සංවාදයක් කරන්නේ නම්, ඔහු ඉබේම මෙසේ පවසයි.;

''අහස් ද පොළොව ද නිර්මාපකයාණන් වන අල්ලාහ් පිළිබඳව සැකයක් තිබිය හැකිද?''

අනතුරකදී මනුෂ්‍ය ස්වභාවයේ සූපරීක්ෂාකාරී සාවධානය

බිහිසුණු මෘගයන්ගේ පහරදීම් වලට ලක්වන්නාවූ හෝ සාගරයේ සැඩ රළ පහර වලට එරෙහිව සටන් කරන්නාවූ හෝ ජලගැල්මකදී ජීවිතය බේරා ගැනීමට දඟලන්නාවූ හෝ බලාපොරොත්තු තැබිය නොහැකි රෝගයකින් පෙළෙන්නාවූ හෝ අනතුරකට ලක්වී ඇද වැටෙන්නාවූ, ගුවන් යානයකදී අවුල් තැවුල් සිතැතිව බලාපොරොත්තු ශුන්‍ය වීම අත් විඳිමින් සිටින්නාවූ හෝ අවස්ථාවකදී මෙන් ඉමහත් විපත්තිදායක හා බැරෑරුම් ලෙස

දුෂ්කර වූ මොහොතක අදෘශ්‍යමාන වූද ප්‍රත්‍යක්ෂ නොවන්නාවූද නමුත් බලධාරී වූද දයාන්විත වූද බලවේගයකට ආයාචනා කරන්නේ කවුද? සෑම අවස්ථාවකදීම, මනුෂ්‍ය හදවත, ස්වීය කැමැත්තෙන් තොරව සෑම තත්ත්වයකදී අල්ලාහ් ගේ පැවැත්ම තේරුම් ගන්නා නමුත් මිනිසා භයානක දුෂ්කරතාවලට මුහුණ පාන අවස්ථාවලදී මෙම හැඟීම වඩාත් ප්‍රබල ලෙස පහළ වන්නේය.

බලයේ අහංකාර ගර්වය, මනුෂ්‍ය ස්වභාවය ප්‍රත්‍යක්ෂ වීමෙන් වළක්වයි.

මාතෘ ප්‍රේමය සහජයෙන්ම පහළවන හැඟීමකි. එනම් එය උගන්වනු ලැබූ හෝ ප්‍රගුණ කරන ලද දෙයක් හෝ නොවේ. එමෙන්ම අපට උපකාර කළ කෙනෙකුට ආදරය කිරීමද මිනිසා සෑම වෙලේම හඟින දෙයකි. නිසැකයෙන්ම මෙම හැඟීම මනුෂ්‍ය වර්ගයා සහ ඉතිහාසය තරම් ඉපැරණි වන අතර ඉතිහාසය පුරා සියලු ජාතීන්, ඔවුන්ගේ කාලය සහ ස්ථානය කුමක් වුවද මනුෂ්‍ය වර්ගයාට පිළිසරණක් වන්නාවූ ද සියලු බලයන්ට වඩා ශ්‍රේෂ්ඨ වන්නාවූද බලය පිළිබඳව අදහස සිතෙහි පහළ කර ගත්හ.

කෙසේ වෙතත් බලයේ ඉහළ තත්ත්වයට ළඟාවෙන්නා වූ ද ඔවුන් යම් ඇයුරක අධි බලයක් භුක්ති විඳින බව ස්ථිර කරන්නා වූද ජනයා බොහෝ විට අහංකාර ගර්වයේ ගොදුරක් බවට පත්වී ජීවය හා පැවැත්ම ගෙන දෙන්නාවූ ඔවුන්ගේ බලධාරියා වන මැවුම්කරුවාණන් අමතක කරන්නාහ; නමුත් ඔවුන්ගේ බලය බොඳවී ඉවත් වී යන විට ඔවුන්ට විශිෂ්ඨ වූ බලය සිහිවන්නේය. කෙලිබඩු සමඟ ක්‍රීඩා කරමින් සතුටුවන ළමයෙකු මොහොතකට ඔහුගේ කාරුණික මවව අමතක කරන අතර නුපුරුදු සිදුවීමක් සිදුවීමේදී වහාම ඇය වෙතට දිවයයි. මෙලෙසම මෙම ජනතාවද බලය ලෞකික වශයෙන් වැඩිවීම මගින් ඉච්ඡාබංගත්වයට පත්වූ විට ඉබේම ආධ්‍යාත්මික බලය වෙත ආයාචනා කරති. ඔවුන්ගේම මවටත් වඩා ඉමහත් ලෙස දයාන්විත බලය සිහි ගන්වමින් ''අල්ලාහ්'' යයි හඬ නගති.

විද්වතෙක් මෙසේ පවසා ඇත.''අල්ලාහ් කෙරෙහි විශ්වාසය ලබාගැනීමේ මාර්ගයෙහි, මිනිසාට ඇති ඉතාමත්ම වැදගත් ප්‍රශ්ණය වන්නේ , ඔහුගේ ස්වභාවය ආවරණය කර ගෙන ඇති තිරයන් සහ බාධාවන් ඉවත් කිරීමෙහි සාර්ථකත්වය ලැබීමයි.

ඇත්ත වශයෙන්ම කිසිවෙකු අල්ලාහ් ගේ පැවැත්ම නිෂේධනය නොකරන අතර සමහරුන්ට ඔවුන්ගේම අභ්‍යන්තර හැඟීම් තේරුම් ගැනීමට නොහැකිව එහි විපාකය ලෙස ඔවුහු අල්ලාහ් ව අමතක කරති. කෙසේ වෙතත්, ඔවුහු ඔවුන්ගේ හෘද සාක්ෂිය මගින් අල්ලාහ් ගේ පැවැත්ම පිළිගනිති.

එහෙයින් මේ ක්ෂේත්‍රය තුළ වූ සියලුම තර්ක විතර්ක වලින් සහ සංවාද වලින් කරනු ලැබුවේ හෘද සාක්ෂියේ හඬ කෙරෙහි අවධානය යොමුකරලීමයි. මෙය ගණිතමය ගැටලුවක් පිළිබඳව ඉදිරිපත් කරනු ලබන තර්කනයන් හා සමානය. ගැටලුවක සම්බන්ධතාවයන් සහ විසඳුම සොයා ගැනීම සඳහා වන තර්කනයන් එක් පැත්තකින් මූලික ස්වසිද්ධීන් පිළිගැනීම සඳහා මනුෂ්‍ය ස්වභාවය මත පදනම් වන අතර අනෙක් පැත්තෙන් පොදු හා නීති ප්‍රකාරවූ මූල ධර්මයන් මත පදනම් වන්නේය. එනම්,''අවිසංවාදී මූලධර්මය'' තදන්මය්‍ය මූලධර්මය'' සහ ''හේතුඵලතාව මූලධර්මය'' යනාදීය ඔහුගේ සහජ ස්වභාවයෙහි කොටසක්ව පැවතියේ නම් මිස මිනිසාට කිසිම ගැටලුවක් ඔප්පු කළ නොහැකිය.

විශිෂ්ඨතම ස්ථිර ආධාර අනුබලය

මිනිසාගේ පිරිසිදු හෘදය සාක්ෂියේ උපදින්නා වූ ද ඉනාමත් පැහැදිලි විද්‍යාත්මක මූල ධර්මය වන ''හේතුඵලත්වය' මත පදනම් වන්නාවූද අසීමිත නමුත් දයාන්විත බලය කෙරෙහි වූ විශ්වාසය ; මිනිසාගේ හදවතහෙි විශේෂ බලාපොරොත්තුවක් මුදුන් පත් කරන්නේය. මෙම විශ්වාසයත් සමග මිනිසාට කිසිදිනක සම්පූර්ණ අසරණභාවයක් හැඟෙන්නේ නැත. අවසානයේදී ඔහු අනෙකුත් ජීවීන් කෙරෙහි සුභවාදී ආකල්පයක් ඇති කරගැනීමට පෙළඹෙන අතර ඔවුන් සමග යහපත් සම්බන්ධතාවයක් ද පවත්වාගෙන යන්නේය. එවිට ඔහු මෙ ලෝකයේ බලාපොරොත්තු සුන් කරවන සහ බියකරු සිදුවීම් වලින් කිසි දිනක භීතියට පත්නොවන්නා සේම මරණයට පවා ධෛර්යමත්ව මුහුණ දෙන්නේය. මෙම ස්ථිර විශ්වාසය යටතේ මිනිසා අනෙකුත් සියලු මානව වර්ගයා; ඔවුන්ගේ වර්ගය, වර්ණය, තත්ත්වය සහ ජාතිය කුමක් වුවද; ඔවුන් සමග යම් ආකාරයක ශක්තිමත් අදෘශ්‍යමාන බැමි වලින්

බැඳී සිටින බව හඟින්නේය. මුලු මහත් ජීවීන් අතර ඔහු ඉතාම කුඩා කොටසක් වන බව ඔහු නිරීක්ෂණය කරයි. නොයෙක් වෙනස් වූ සිදුවීම් වල වේගයට එරෙහිව ඔහු හුදෙකලා නොවන බවට ඔහු ස්ථිර කර ගනියි. අල්ලාහ් කෙරෙහි විශ්වාසය කරමින් නමස්කාර කරන්නාගේ හදවත අපේක්ෂාවේ ආලෝකය මගින් දීප්තිමත් කරනු ඇත. ජීවීන්ගේ මූල ප්‍රකෘතිය සමඟ සම්බන්ධතාවය තහවුරු කර ගැනීමෙන් මිනිසා ජීවිතයේ වඩාත් සංකීර්ණතම දුෂ්කරතාවයන් ඉතා පහසුවෙන්ම ඉවසා දරාගනු ඇත.

මිනිසාට මෙම ස්ථිර පිටුවහල නොපවතින්නේ නම් ඔහුගේ භීතියේ සහ ත්‍රාසයේ ප්‍රමාණය මනිනු ලැබිය හැකි වේද? නිසැකයෙන්ම, ඔහුට අනෙක් ජනයින්ගෙන් ඔහුව ආරක්ෂා කර ගැනීම නැතහොත් ඔවුන්ට පහර දීම පිළිබඳව නිතරම සිතිය යුතු වෙයි.

4-දිව්‍ය කරුණාවේ සාක්ෂ්‍යය

අ) දිව්‍ය කරුණාව යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

වැසි කුණාටු වලින් ජල ගැල්මක් ඇති කරන ලද විටෙක, එය කඳුවලින් පහළට ගලා ගෙන එයි. එම ගමන් මාර්ගයෙහි හසුවන කුමක් වුවද එමගින් ඉවතට ගෙන යනු ලබයි. එය පොළොව මට්ටමට ළඟා වන තෙක් ගොයම් සහ ගොඩනැගිලි බෙහෝමයක් විනාශයට පත් කරන අතර පසුව එය පොළොව තුළට බැස යයි. නැතහොත් ගඟකට හෝ පොකුණකට බැසයයි.

ජල ගැල්මක විනාශකාරී බලය අඩුකිරීමට එහි ගමන් මඟ හරහා වේල්ලක් බැඳ එක්රැස් වන ජලයෙහි ප්‍රබල ජලධාරාව, විදුලිය නිෂ්පාදනය කිරීමට සහ අසළ පිහිටි ගොවිපළවලටත් වතුවලටත් ජලය සැපයීමට උපයෝගී කරගනු ලැබීම අප නිරීක්ෂණය කරන විට අපගේ විනිශ්චය කුමක් වේද? සුදුසු ස්ථානයක වේල්ලක් බැඳ තිබීමෙන්; විදුලි බලාගාරයක් ස්ථාපනය කොට තිබීමෙන් සහ ජල සැපයුම් පද්ධතියකට උපක්‍රම යොද තිබීමෙන්; අපි ඇත්ත වශයෙන්ම මෙහි අරමුණක් සහ කරුණාවක් තිබෙන බව සොයා ගන්නෙමු. වෙනත් අයුරකින් පවසන්නේ නම්, කිසියම් නිශ්චිත ඉලක්කයක් හා අරමුණක් ළඟාකර ගැනීම සඳහා

ස්වාභාවික සම්පත් හා බලයන් නිසි ලෙස තම ප්‍රයෝජනය උදෙසාම යොදගැනීමට නිශ්චිත අධිෂ්ඨානයක් පවතින බව අපි තේරුම් ගනිමු.

මෙම යෝජනා ක්‍රමයන් සහ ඒවායේ ප්‍රතිඵල ; එනම් විදුලිය නිෂ්පාදනය කිරීම, තාක්‍ෂණික වාරිමාර්ගය, යනාදිය නිරීක්‍ෂණය කිරීමෙන්, නිසි අධිෂ්ඨානයක් සැළසුමක් සහ ගණනය කිරීමක් මෙහිදී මැදිහත් වී ඇති බව අපි තීරණය කරමු. දැන් මෙම විශ්වය සහ එහි මැවීම් වල ශ්‍රී විභූතිය නැරඹීමෙන් යම් නිශ්චිත අධිෂ්ඨානයක් සහ කරුණාවක් සහ අරමුණක් පැවති ඇති බව අප විසින් නිගමනය නොකළ යුතුද? මැවීම් වල පවතින පිළිවෙළකට සැකසුණු ක්‍රමවත් භාවය සහ ඒවා මැවීමේදී ඉලක්ක කොට ගත් චේතනාව යන ස්වභාවික සිද්ධාන්තයෙහි අංගයන් කෙරෙහි අපි සාමාන්‍යයෙන් කල්පනා නොකරමු. නැවත නැවතත් නිරීක්‍ෂණය කිරීම මගින් අප එවැනි පුරුද්දකට පෙළඹී සිටින අතර එම සිද්ධාන්තයේ අරමුණ සහ ක්‍රමවත් භාවය පිළිබඳව අප සාමාන්‍යයෙන් ඕනෑකමකින් සිතා බලන්නේ නැත. නමුත් අප සාවධානව බලන්නේ නම් හා සැලකිලිමත්ව කල්පනා කරන්නේ නම්, සෑම වස්තුවකටම හා සෑම ජීවියෙකුටම අධිෂ්ඨානයක් හා කරුණාවක් ද යම් නිශ්චිත ඉලක්කයක් කරා චලනයක් ද පවතින බව නිසැකයෙන්ම අපි නිරීක්‍ෂණය කරමු.

ආ) උද්භිද ලෝකයේ පවතින දිව්‍ය කරුණාවේ සලකුණු.

ශාකවල සෛල සහ ඒවාහී සංයුතිය පිළිබඳ විශ්ලේෂණය; මදයේ ව්‍යුහය; ශාක පටක සහ ඒවාහි සංයුතිය; මුල්වල ව්‍යුහය එමගින් ඛණිජ ලවණ අවශෝෂණය කරගන්නාවූ ආකාරය; ශාක වල සාර ද්‍රව්‍ය පරිවහනය කරනු ලැබීම; හරිත ප්‍රද (ක්ලෝරොෆිල්) වල ක්‍රියාකාරිත්වය ; ආලෝකය , තාපය, සහ තෙතමනය ආදියෙහි විශේෂිත බලපෑම; විවිධ ශාකවල ශ්වසනය හා ප්‍රජනන ක්‍රියාවලියේ පවතින වෙනස්කම්; ප්‍රවේණි නියමය; එලයන් පළතුරු බවට පරිවර්තනය වීමේ ක්‍රියාවලිය; මුහුදු පැළෑටි සහ මාංශ භක්‍ෂක ශාක වර්ගයන් යනාදී එකිනෙක සඳහා පවතින සිය ගණනක් වූ පැහැදිලි නීතීන් සහ තත්ත්වයන් පිළිබඳ අධ්‍යයනය, අසීමිත බලයක් හා බලපෑම් කළ හැකිවන්නාවූ අධිෂ්ඨානයක් පවතින බව අපට තහවුරු කරනු ඇත.

ගුරුත්වාකර්ෂණ නියමය ක්‍රියාත්මක වෙද්දීත් ශාක විසින් ජලය සහ ඛණිජ ලවණ අවශෝෂණය කරනු ලබන බව ද ශාක වල සාර ද්‍රව්‍ය පරිවහනය කරනු ලබන බව ද එය මුලේ සිට ශාඛවලටත් පසුව කොළවලටත් ගෙනයනු ලබන බව ද ඔබ කිසි දිනක අවධානය යොමු කෙළෙහිද? කාබනික වායුව ස්වාධීනව අවශෝෂණය කර ගැනීම සඳහා හරිත ප්‍රද උගනවූ ඇතැම් හතු වර්ග කොලපාට ශාක සමඟ සහ ජීවනයෙන් සිටීමට පෙළඹෙයි. අනෙකුත් සමහර ශාක වර්ග වීස්, පාන් පළතුරු වැනි කාබනික ද්‍රව්‍ය වල වියෝජනයෙන් හෝ ශාක හා සත්ත්වයින්ගේ මෘත ශරීර වල අවශේෂ කොටස් වල වියෝජනයෙන් හෝ පෝෂ්‍ය පදර්ථයන් ලබා ගනියි. අනෙකුත් පරපෝෂිත වර්ග වෙනත් ජීවීන් මත ජීවත් වෙයි. ප්‍රමාණවත් මුල් නොමැති අසම්පූර්ණ ශාකයන් වන හතුවර්ග මුහුදු පැළෑටි සමඟ අන්‍යෝන්‍ය සහයෝගීතාවයෙන් යුතුව, ඔවුන්ගේ පැවැත්ම උදෙසා සහ ජීවනයෙන් ජීවත් වෙයි. පැවැත්ම සඳ හා වූ මෙම උත්සාහය සහ ඥනාන්විත සහයෝගීතාවය වර්ධනය වී ඇත්තේ කෙසේද? මෙවාහී යම් නිශ්චිත අධිෂ්ඨානයක් හා කරුණාවක් නොමැත්තේද?

ඇ) සත්ත්ව ලෝකයේ පවතින දිව්‍ය කරුණාව පිළිබඳ දෘෂ්ඨිකෝණයක්

''කුඹියෙක් වැනි කුඩා කෘමියෙකුගේ ජීවය සහ ඔවුන්ගේ ඉතාමත් ක්‍රමවත් වූ හා සංවිධානාත්මක වූ ඉන්ද්‍රියයන් පිළිබඳ අවදනය යොමුකිරීම මිලියන සංඛ්‍යාන ජනයාව, අල්ලාහ් කෙරෙහි යොමු කරවන්නේය'' යි සුප්‍රසිද්ධ කීට විද්‍යාඥයෙකු වන ජෝන් හෙන්රි ෆේබර් පවසයි. ෆේබර් විසින් ක්‍ෂුද්‍ර ජීවියෙකු යයි සඳහන් කරන ලද (වයිරස් වැනි) කුඹියෙකුට වඩා 200 හෝ 300 ගුණයකින් හෝ ඇතැම් විට මිලියන කිහිපයක ගුණයකින් කුඩා වූ ජීවී මූල බීජයන් පවතින බව අපි දනිමු. කෙසේ වෙනත් අනෙකුත් ජීවීන් සතු ලක්‍ෂණ: එනම් සංවේදීතාවය, චලනය, ආහාර, ජීර්ණ පද්ධතිය, ස්වසණ ඉන්ද්‍රියයන්, පරිසරයට අනුව අනුවර්තනය වීම, වර්ධනය සහ ආරක්‍ෂක ක්‍රියාමාර්ගය යනාදී ලක්‍ෂණ වලට සමාන ලක්‍ෂණයන් මෙම ක්‍ෂුද්‍ර ජීවීන්ට ද තිබෙන්නේය. වයිරසයකට වඩා දහස් ගුණයකින් පමණ විශාල

වූ බැක්ටීරියාවල ප්‍රජනනය පැය භාගයකට වරක් සිදුවන අතර වයිරස් වල එය සෑම මිනිත්තු එක හමාරකට වරක් සිදුවන්නේය. නව ජීවියා තම වාරයේදී ද්විත්ව ප්‍රජනනයක් සිදු කරනු ඇත. ඔවුන්ගේ ජීවන තත්ත්වයන් එතරම් පාලනයකට ලක් නුවුයේ නම්, ඔවුන් විසින් මුලු ලෝක පෘෂ්ඨයම මේ අනුව අත්පත් කරනු ඇත. මෙම අරුම පුදුම කරුණු වලින් අඟවනු ලබන්නේ මේ ලොවේ ඉලක්කයක් සහ අධිෂ්ඨානයක් පැවතිය යුතු බවයි.

නොයෙකුත් විද්‍යාත්මක අධ්‍යයන ක්ෂේත්‍රයන් හී මූලාරම්භය වශයෙන් පවතින ශුක්‍රාණු සහ ඩිම්බ වල අද්භූත ලෝකය, වර්ණ භේදවල සහ ජානවල ව්‍යූහය, ඒක සෛලීය ජීවීන්ගේ විශ්මය ජනක අභ්‍යන්තර ක්‍රියාවලීයන්, මුහුදු හතු, හිරි ගල් තාරක මත්ස්‍යයන් , කබලක් සහිත ගොලුබෙල්ලන් වැනි සතුන්, පණුවන් පුරුක් හා සන්ධිපාද ඇති සතුන්, මත්ස්‍යයන්, උභය ජීවීන්, උරගයින්, පක්ෂීන් ක්ෂීරපායී සතුන් සහ සෑම කාණ්ඩායමකම ජීවිතයෙහි පවතින්නාවූ යම් පිළිවෙළක් සහිත ක්‍රමය යනාදිය, ජීවයෙහි සහ සියලු ජීවීන්ගේ ප්‍රාරම්භකයා වන සදාතනික බලයෙහි පැවැත්ම ඒකාන්තයෙන්ම පිළිගැනීමට අපට මග පාදන්නේය.

ඇ) විශ්වයේ එක් අන්තයක සිට අනෙක දක්වා පවතින දිව්‍ය කරුණාව

පුස්තකාලයක පොත් දහස් ගණනකින් පාඨකයාට ඕනෑම විශේෂිත පොතක් පහසුවෙන්ම තෝරාගත හැකි වනු පිණිස ඒවාහී සූචි පත්‍රිකාවන්; පොත් වල විෂයයන්, හෝ කර්තෘගේ නම, හෝ පොතේ ප්‍රමාණ සහ කාණ්ඩය හෝ අනුව වර්ගීකරණය කොට අංකනය කර ඇත. මුද්‍රණාලයක විවිධ වර්ණවලින් යුක්තව හා කිසිම වරදක් රහිතව, පුවත් පතක විශාල පිටුවක්, පැයකට පිටු 300,000 බැගින් මුද්‍රණය කිරීමට හැකිවන ආකාරයට කුඩා ලෝහමය කැබැලි වල තිබෙන්නාවූ අකුරු හෝඩිය සකස් කරනු ලැබේ. මෙම පුස්තකාලයේ හෝ මුද්‍රණාලයේ සැලැස්මක් ඉලක්කයක් සහ අධිෂ්ඨානයක් පවතින බව අපි නිරීක්ෂණය නොකරන්නෙමුද?

අපි ලෝකයේ ඉතා පැහැදිලි සම්බන්ධතාවයන් නිරීක්ෂණය කරන්නෙමු; එනම්: අපගේ ඉන්ද්‍රියයන් ගේ අවශ්‍යතාවයන් සහ

ආහාර පදර්ථයන් අතර; පෘථිවිය, චන්ද්‍රයා , සූර්යයා, සාගරයන්හි ජලය සහ කාබනික වායු, උෂ්ණත්වය සහ පරිසරයේ සංයුතිය සීරු මාරු කිරීමට ඒවා විසින් කරනු ලබන බලපෑම් අතර; ස්වභාව ධර්මයෙහි නයිට්‍රජන්, කාබන් සහ සල්ෆර් (ගෙන්දගම්) චක්‍ර ගත කිරීම, එනම් සරල මූල ද්‍රව්‍යයක් අනෙකුත් ස්වභාවික මූල ද්‍රව්‍යයක් සමඟ අළුතින් යමක ඇති කරමින් සංයෝජනය වීම සහ විවිධ ක්‍රියාකාරීත්වයන් සහ රසායනික ප්‍රතික්‍රියාවල ප්‍රතිපලයක් වශයෙන් මුලින් පැවති මූල ද්‍රව්‍යයන් බවට වියෝජනය වී බෙදී යන මුලු මහත් ක්‍රියාදමය අතර; කුඩා මල් බීජයක වර්ධනය සහ එහි වර්ධනය හා ප්‍රජනනයට අවශ්‍ය වන පරිසර කාරකයන් අතර ; යනාදී වශයෙනි. මෙනේරි බීජය සන පරිමාවට වඩා ලක්ෂ ගුණයකින් කුඩා වූ ක්ෂුද්‍ර අංශුවේ සිට පෘථිවිය හෝ සෞර ග්‍රහ මණ්ඩලය හෝ අත් පත් කරගෙන සිටින අවකාශය මෙන් දහස් ගුණයකින් විශාල අවකාශයක් අත්පත් කරගෙන සිටින්නාවූ අපරිමිත සුවිශාල දෙයක් දක්වා ලොව පුරා උදහරණ දහස් ගණනින් අපට පෙන්වා දියහැකිය. මේ උදහරණ සියල්ලක්ම අත්භූත සිදුවීම් වලින් සහ පැහැදිලි නීතීන්ගෙන් පිරුණු ලෝකය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීමට මිනිසාට උපකාරී වේ.

ස්වභාව ධර්මයේ අනන්ත අප්‍රමාණ වූ දේ අතර පවතින්නාවූ සම්බන්ධතාවයන් හා මිනිසාගේ මැවීම කෙරෙහි සිත යොමු කිරීමෙන් බුද්ධිමත් හා ඥනාන්විත වූ මනස, පහසුවෙන්ම දිව්‍ය කරුණාවේ සළකුණු ද අදෘශ්‍යමාන සැලැස්ම හා අරමුණ ද ප්‍රත්‍යක්ෂ කර ගනී. අපට අපගේ දැනුමෙහි විෂය ක්ෂේත්‍රය පුළුල් කර ගත හැකි නම් සහ සියලු ජීවින්ගේ ස්වභාවය හුරු පුරුදු වන්නේ නම් මෙම කරුණාවෙහි සහ මෙම අධිෂ්ඨානයෙහි වඩාත් යහපත් සළකුණු අපට ප්‍රත්‍යක්ෂ ලෙසම තහවුරු කර ගැනීමට හැකිවනු ඇත. වෙනත් ආකාරයකින් පවසන්නේ නම්, මිනිසා ලෝකය ගැනවඩාත් වැඩියෙන් ද ැන ගන්නා තරමටම ඔහු, මේ ලොවේ නිර්මාපකයාණන් පිළිබඳව වඩාත් හොඳින් දැන ගන්නේය.

''අල්ලාහ් ගේ වහලුන්ගෙන් ඔහුට බියබැතිමත් වන්නේ විද්‍යඥයෝය.'' 35:28

5) නිසි පිළිවෙළ පිළිබඳ ව වූ විතර්කනය
විවිධ වර්ණ ගල් කැට

ළමයෙකු විවිධ වර්ණ වලින් යුත් ගල්කැට අහුරක් බිමට අත හරින්නේ යැයි සිතන්න. එවිට ගල් කැට නන් දෙසට විසිරී අහම්බෙන් ඇති වන සැලැස්මෙහි කිසිම අධිෂ්ඨානයක්, අරමුණක් හා මනා සැලැස්මක් නොමැති බව නිරීක්ෂයෙකුට පෙනීයයි.

දැන් එම ගල් කැටම, ලස්සන චිත්‍ර නිරූපනයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන කලාකරුවෙකුගේ අතට පත්වූ බව සිතමු. පළමුව ඔහු ඔහුගේ අරමුණ පිළිබඳ තීරණය කරගෙන මනසින් දළ සැලැස්මක් සකස්කර ගනී. සෑම ගල්කැටයකම වර්ණයට සහ ප්‍රමාණයට ගැලපෙන සුදුසු තත්වයක් තෝරාදීමෙන් ඔහු එම ගල් කැට කලාත්මක නිර්මාණයක් සෑදෙන ලෙසට සකස් කරයි. මෙම මනහර විශ්මිත නිර්මාණය මතු වී පෙනෙන්නේ ඔහු එම ගල් කැට අතර කිසියම් පිළිවෙළක්, සම්බන්ධතාවයක් හා සංරචකයක් ස්ථාපිත කළ බැවිනි.

දැන් ස්වභාව ධර්මය නම් දර්ශනයේදී ඔබ නිරීක්ෂණය කරන ජීවීන් සමාන වන්නේ, කිසිත් නොතේරෙන ළමයෙකු විසින් විසුරුවන ලද ගල් කැට වලටද? නැත්නම් කලාකරුවෙකු විසින් කලාත්මකව සකස් කරන ලද ගල්කැට වලටද?

සෑම සත්ත්වයෙකුටම අරමුණක් ඇත.

සාමාන්‍යයෙන් ස්වභාව ධර්මයෙහි සියලුම ජීවීන්ට ඔවුන්ගේ ගමන් මාර්ගයෙහි යම් අරමුණක් ඇත. ඔවුහු මේ අරමුණ ලුහුබැඳ යන අතර එය ඉෂ්ඨ කරගැනීම සඳහා සෑම උත්සාහයක්ම දරති. බීජයක් ශාකයක් වීම සඳහා විකාසනය වේ. කළලයක් ජීවියෙකු වීම සඳහා වර්ධනය වේ යනාදී වශයෙනි. විෂය මූලික හා විද්‍යාත්මක පරීක්ෂණ වල නිරීක්ෂණයන් අනුව ඇත්ත වශයෙන්ම චලනය, ජීවියෙකුගේ සහජ ලක්ෂණයක් වන අතර ඝන වස්තූන් පවා එමගින් නොයෙකුත් ලක්ෂණ පෙන්වන තත්ත්වයකට පත්වේ. තවද එම චලනය අක්ෂයක් දිගේ සිදුකරනු ලබන අතර ඕනෑම අක්ෂයක් යම් යම් කොටස් වලින් සමන්විත වන බැවින් චලනයට ලක්වන දෙය ඕනෑම මොහොතක, පටන් ගනු ලබන ස්ථානයෙන් ද අවසන් වන ස්ථානයෙන් ද බැහැරව පවතින බව තහවුරු වී ඇත.

මේ දක්වා , විද්‍යාව ජීවීන්ගේ ඇතැම් ප්‍රාථමික ඉලක්ක හා අරමුණු ද ගමන් මාර්ගයෙහි කොටසක් ද සොයා ගෙන ඇත. එම නිසා ඒකාන්තයෙන්ම සෑම ජීවියෙකුම යම් නිශ්චිත ඉලක්කයක් හා ගමනාන්තයක් කරා චලනය වන බව අපට ස්ථිරවම ප්‍රකාශ කළ හැකිය.

සත්ත්වයින් අතර සම්බන්ධතාවය

ස්වභාව ධර්මය නම් දර්ශනයෙහි ජීවීන්ගේ තත්ත්වය, කිසිත් නොදන්නා ළමයා විසින් විසුරුවන ලද විවිධ වර්ණයන්ගෙන් යුත් ගල් කැට වලට කිසිසේත් සම්බන්ධතාවයක් නැත. නමුත් ඔවුන්, යම් නිශ්චිත රටාවක් සැකසීම සඳහා සංවේදී කලාකරුවෙකු විසින් කලාත්මකව සකස් කරන ලද ඒවාට සමානවේ.

ධාන්‍ය බීජයක වර්ධනය පිළිබඳ සමීප අධ්‍යයනය මගින් එය පැලෑටියක් වනතෙක් අනන්ත වූ දේවල් උපකාර කර ඇති බව ද; මූල ධර්මයක් වශයෙන් ජීවියෙකුගේ ක්‍රියාකාරකම අනෙකා විසින් කරන ලද උත්සාහයන් මගින් සම්පූර්ණ වන බව ද; ජීවීන් අතර තර්කානුකූල හා අනුගත වූ අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පවතින බව ද; පෙන්වා දෙයි. ධාන්‍ය බීජයක වර්ධනය සඳහාවූ අවශ්‍යතාවයන් පස, වාතය හා අනෙකුත් දේවල්හිදී ධාන්‍ය බීජය තුළදී එමගින්ම ප්‍රවේසමෙන් කල් තියා ලබා දෙනු ලබන අතර එකී ජීවියෙකු නිර්මාණය වීම සඳහා වෙනත් ජීවියෙකුගේ නිර්මාණය සිදු කරනු ලබන්නේය. එනම් , පොළොවෙහි පවතින මූල ද්‍රව්‍යයන්; වාතයේ පවතින වායු; සූර්යයා, එහි පවතින තාපය සහ ආලෝකය; යනාදිය අනෙක් ජීවීන්ගේ නිර්මාණය වීම හා ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මවනු ලැබ ඇත්තේය. කෙටියෙන් පවසන්නේනම් , කුමන හෝ ජීවියෙකුගේ නිර්මාණය සිදුවන්නේ, අනෙක් ජීවීන්ගේ නිර්මාණය හා ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහාය.

විද්‍යාව: මේ දක්වා, කිසිම ජීවියෙකු කිසිම විටෙක අහම්බෙන් නිර්මාණය වී නොමැති බවත්, ඉලක්කයක් හා අරමුණක් නොමැතිව අනෙක් ජීවීන් සමඟ අසල් වැසියෙකු වශයෙන් තබා නොමැති බව ද ඔප්පු කර ඇත. අප, 'ස්වභාව ධර්මය' හෝ 'නිර්මාණාත්මක ලෝකය' වශයෙන් හඳුන්වන දෙය මිශ්‍ර කරන

ලද සංයෝගයක් නොවේ. තවද එය, එකිනෙකට ස්වාධීන හා එකිනෙකට ආගන්තුකයෙකු ලෙස පවතින කොටස් වලින් සමන්විත සම්මිශ්‍රණයක් බඳුවූ රටාවක් ද නොවේ. නමුත් එය එකිනෙක මත රැඳී සිටින අවයව භූත වූ කොටස් වලින් සමන්විත රටාවක් වන අතර එවැනි රැඳී සිටීමක් හා සම්බන්ධතාවයක් නිසා එකක් අනෙකාට බලපෑම් කරන්නේය.

පරමාදර්ශී බලපෑම හා ප්‍රතිඵලය

ජීවීන්ගේ සංයුතිය හා ඔවුන් එකිනෙක කෙරෙහි දක්වන සම්බන්ධතාවයන්, එකෙකු ඔහුගේ අවසාන ඉලක්කය කරා යන ගමන් මාර්ගයේදී අනෙකාට උපකාර කරයි. වෙනත් වචන වලින් පවසන්නේ නම්, සංයුතියේ හා සම්බන්ධතාවයේ ගුණය මෙන්ම සෑම ජීවියෙකුම එකිනෙකා කෙරෙහි ඇති කරන බලපෑම හා ප්‍රතිඵලයෙහි ද ගුණය වන්නේ යම් නිශ්චිත ජීවියෙකුට තමා සහ අනෙක් ජීවියා අතර පවතින සම්බනධතාවය තුළින් ද මේ නිශ්චිත සැලැස්ම තුළ වර්ධනය කරගන්නාවූ බලපෑම් හා ප්‍රතිඵලය තුළින් ද තමාගේ ඉලක්කය කෙරෙහි වූ මාර්ගය අනුගමනය කළ හැකි වන අයුරු පැවතීමය.

ක්‍රමානුකූල පිළිවෙළෙහි නියමය

අප ඉහතින් සඳහන් කළ දෙය මෙසේ සම්පිණ්ඩණය කොට දැක්විය හැකිය; බීජයක සිට ශාකයක් දක්වා වූ විකාසනයෙහි අධ්‍යයනයට ද මිනිසාගේ භ්‍රෑනයෙන් සොයාගෙන ඇති ජීවීන් ගේ අභිරහස් පිළිබඳ අධ්‍යයනය ද ලෝකය 'ක්‍රමානුකූල පිළිවෙළෙහි නියමය' (Law of Order) මත පදනම් වී ඇති බව ඔප්පු කරන්නේය.

ක්‍රමානුකූල පිළිවෙළ යනු කුමක්ද?

ක්‍රමානුකූල පිළිවෙළ යනු දේවල් ශ්‍රේණියක් අතර පවතින්නාවූ තේරුම් ගත හැකි අනුගතව හා අන්‍යෝන්‍ය ගැලපීමේ සම්බන්ධතාවයයි. මෙම ගැලපීම හා සම්බන්ධතාවය මගින් සැලැස්මක් අරමුණක් හා බලවත් අධිෂ්ඨානයක් පෙන්නුම් කරයි. එම නිසා විවිධ දේවල් රාශියක් ක්‍රමානුකූලව එක්රැස් වී තිබෙන විටෙක අපි, එකක් අනෙකක් කෙරෙහි ඇති කරන බලපෑමෙහි

සම්පූර්ණ වූ ප්‍රතිඵලයක් ලබාගන්නා අතරම මේ දේවල් ක්‍රමානුකූල පිළිවෙළකට සකස් වී ඇතැයි ද කියමු.

ක්‍රමානුකූල පිළිවෙළහි ස්වභාවය පිළිබඳ විශ්ලේෂණය

ක්‍රමානුකූල පිළිවෙළ ගැන කතා කිරීමේදී අප පහත සඳහන් කරුණු සිතේ තබා ගත යුතුය.

1. ක්‍රමානුකූල පිළිවෙළ වනාහී දේවල් රාශියකට නිරතුරුව පරීක්ෂා කළ හැකි විය යුතු අතර එක් තනි වස්තුවක් පිළිබඳව නොවිය යුතුයි.

2. මේ දේවල් වලින් සම්මිශ්‍රණ නිර්මාණයක්- එක් තනි රටාවක් ගොඩ නැංවිය යුතුය. ඔවුන් වෙන් කළ හැකි හා ස්වාධීන නොවියයුතුය.

3. එකක් හෝ ඔවුන් සෑම එකක්ම එකම අරමුණක් ළඟා කරගැනීම සඳහා යම් නිශ්චිත ගමන් මාර්ගයක් අනුගමනය කළ යුතුය.

4. මෙවායේ සම්මිශ්‍රණ නිර්මාණයෙහි ගුණය, අවසාන අරමුණ ස්ථිර කළ යුතු හා එය ළඟා කර ගැනීමට පහසුකම් සළසන්නක් විය යුතුය.

ද්‍රව්‍යයන් රාශියක් සඳහා මේ මූලධර්ම හතර තේරුම් ගනු ලැබූ විටෙක අපි මෙවායේ සම්මිශ්‍රණ නිර්මාණයෙහි ක්‍රමානුකූල පිලිවෙළක් ඇතැයි කියමු. සෑම ජීවියෙකු පිළිබඳව වූ අවධානය එම ජීවීන්ගේ ඉලක්කයන් හා ගමන් මාර්ගයයන්ට අනුකූලව එකකට යාබදව හා අනුගාමිව අනෙකා සිටින සේ සම්බන්ධ කොට ද ස්ථාන ගත කොට ද ඇත්තාවූ අනන්ත අප්‍රමාණ වූ ජීවීන්ගෙන් සමන්විත වන ස්වභාව ධර්මය නම් දර්ශනයෙහි මෙම මූලධර්මය විද්‍යාමාන නව බව අණාවරණය වේ. එමනිසා එක ජීවියෙකුගේ ක්‍රියාකාරීත්වය, යම් නිශ්චිත ඉලක්කයක් හා අරමුණක් ළඟා කර ගැනීමට අනෙකට ආශිංසනයක් වන්නේය.

නිර්මාණාත්මක ලෝකයෙහි යම් නිශ්චිත කාර්යභාරයක් ඉටු නොකරන කිසිම සිද්ධාන්තයක් සොයා ගනු ලැබිය නොහැකිය. මෙම ක්‍රමානුකූල පිළිවෙළ, මිනිසා ගේ ද ශාක වල ද අහස් හිද

ගිණිය නොහැකි තාරකා වල ද පරමාණු වල ද ඇතුළු සැම දෙයකම පැවැත්මෙහි ඔබට දැකිය හැකිය.

මූලධර්මයක් වශයෙන් විද්‍යාව යනු ස්වභාව ධර්මයෙහි පවතින ක්‍රමානුකූල පිළිවෙළ අවබෝධ කර ගැනීමට කරනු ලබන ගවේෂණයක්ම මිස අනෙකක් නොවේ. එය, ජීවීන් අතර පවතින තේරුම් ගත හැකි සම්බන්ධතාවය ද ඔවුන් විසින් කරනු ලබන බලපෑම හා එහි ප්‍රතිඵලයෙහි ගුණය ද සොයා ගැනීමට උත්සාහ දරයි. ලෝකය ක්‍රමානුකූල පිළිවෙළකින් තොරවූවේ නම් විද්‍යාව කිසි වැදගත්කමක් නැති මුළුමනින්ම අර්ථ ශූන්‍ය දෙයක් වනු ඇත. වෙනත් වචන වලින් පවසන්නේ නම් විද්‍යාව යනු ක්‍රමානුකූල පිළිවෙළකට සැකසුණු ස්වභාවික නියමයන් ද? ජීවීන්ගේ පදනම වන සම්මිශ්‍රණයක් වූ නිර්මාණාත්මක සංරචිතය පිලිබඳ නීති නියමයන් ද සොයා ගැනීම වන්නේය. එහෙයින් ලෝකය ක්‍රමානුකූල පිළිවෙළ හා ජීවීන්ගේ සංවිධානාත්මකභාවය කෙරෙහි විද්‍යාව අවධානය යොමු කරන බව අපට නිගමනය කළ හැකිය.

කාර්මික ක්ෂේත්‍රයේ ක්‍රමානුකූල පිළිවෙල

ස්වභාව ධර්මයෙහි අප පැහැදිලිව වටහා ගන්නා සුහද පැවැත්ම ක්‍රමානුකූල පිළිවෙළ ලෙස හැඳින්වේ. දැන් අපි මෙම ක්‍රමානුකූල පිළිවෙළ වාහන වල ද නැව්වල ද ගුවන් යානා වලද , මුද්‍රණ යන්ත්‍රවලද විශාල කර්මාන්ත ශාලා වල ද විද්‍යුත් ක්ෂේත්‍රයෙහි ද සියලු කර්මාන්ත ක්ෂේත්‍රවල ව්‍යුහයෙහි ද පවතින බව නිරීක්ෂණය කරන්නෙමු. මේ සියළුම තාක්ෂණික හා කාර්මික ක්ෂේත්‍ර වල පවතින ක්‍රමානුකූල පිළිවෙළ ඒවාට පැවැත්මක් ලබා දුන් පුද්ගලයින්ගේ ඥනයේ සහ බුද්ධියේ ප්‍රතිඵලය බව මෙම නිරීක්ෂණයන් තහවුරු කරයි. දැන් අපට පොදු හා දර්ශනික නිගමනයකට එළඹිය හැකිය; පැහැදිලි ගණනය කිරීම් මත පදනම් වූ පැහැදිලිව පෙනෙන සැම ක්‍රමානුකූල පිළිවෙළක් සාධාරණ සම්මිශ්‍රණ නිර්මාණයක් හා සංරචිතයක් පිටුපසට ඒකාන්තයෙන්ම ඥනය, බුද්ධිය සහ යම් සංරචිතයෙකුගේ අධිෂ්ඨානය පවතින්නේය. මෙය කිසිවෙකු විසින් ප්‍රතික්ෂේප නොකරන්නා වූද අවිවාදයෙන් පිළිගනු ලබන්නා වූ ද පොදු මූලධර්මයෙකි. අපි අපගේ මූලික සාකච්ඡාව වන ස්වභාව ධර්මයට නැවත ආපසු හැරී බලමු.

ස්වභාව ධර්මයෙහි ක්‍රමානුකූල පිළිවෙළ

කර්මාන්ත ක්ෂේත්‍රයක අප නිරීක්ෂණය කරන ක්‍රමානුකූල පිළිවෙළ ස්වභාව ධර්මයෙහි ජීවීන්ගේ නිර්මාණයේදී සහ සංරචිතයේදී දක්නට ලැබෙන නමුත් එය මුලින් සඳහන් කළ දේට වඩා විශිෂ්ඨ ලෙස පැහැදිලි වන්නා වූද විශ්මය ජනක වන්නාවූද වන්නේය. ඇත්ත වශයෙන්ම මිනිසා විසින් සාදන ලද කර්මාන්ත ක්ෂේත්‍රය සමග ස්වභාව ධර්මයේ ක්‍රමානුකූල පිළිවෙළ මෙලෙස සංසන්දනය කිරීම ද සාධාරණ නොවේ. එය කුඩා ළමයෙකුගේ සෙල්ලම් කාරයක් උසස් තත්ත්වයේ නවීන සුඛෝපභෝගී වාහනයක් හා සංසන්දනය කිරීමට සමාන වන්නේය. එම නිසා ස්වභාව ධර්මයේ ක්‍රමානුකූල පිළිවෙළ ඉතාමත් පැහැදිලි හා අත්‍යුත්කෘෂ්ඨ වන අතර එය මිනිසාගේ බුද්ධිය සහ ඥනයේ ප්‍රතිඵලය ලෙස පවතින සියලු ආකාරයේ ක්‍රමානුකූල පිළිවෙළක්ම විශිෂ්ඨ ලෙස අභිබවා සිටින්නේය. කෙසේ වෙතත් අපගේ කාර්මික ක්‍ෂෙත්‍රයේ පවතින ක්‍රමානුකූල පිළිවෙළ බිහිවූයේ බුද්ධිය, අධිෂ්ඨානය හා ඥනය තුළින් බව අපි සැකයෙන් තොරව ප්‍රකාශ කරමු.

අවසාන නිගමනය

අත්‍යවශ්‍යම ප්‍රශ්ණය වන මෙම පොදු හා දර්ශනික මූලධර්මය අපි සැකයෙන් තොරවම ඔප්පු කර ඇත්තෙමු. එසේනම් දැන්, ස්වභාව ධර්මයේ ක්‍රමානුකූල පිළිවෙළ පිටුපස පවතින්නාවූ අපරිමිත බුද්ධිය, ඥනය සහ සර්ව බලධාරිවූ අධිෂ්ඨානය ප්‍රත්‍යක්‍ෂ කර ගැනීමට අප අපොහොසත් වන්නේ කෙසේද? සාධාරණ මූල ධර්ම වල ලක්‍ෂණයක් වන්නේ ඒවාහී පොදු බවයි. බුද්ධිය, විශිෂ්ඨ වූ මානව කර්මාන්ත ක්ෂේත්‍රය නිරීක්‍ෂණය කිරීමෙන් 'සංවිධායකයෙකු නොමැති ව ක්‍රමානුකූල පිළිවෙළක් පැවතිය නොහැකිය' යන පොදු මූලධර්මය පිළිගනී. මුළු මහත් ජීව සන්තතිය ඇතුලු ස්වභාව ධර්මයේ සංයුක්ත වන සියලුම කොටස් මෙම මූලධර්මය මගින් ප්‍රත්‍යක්‍ෂ ලෙස ආවරණය වී ඇත්තේය. ඇත්ත වශයෙන්ම අපේ බුද්ධිය, ස්වභාව ධර්මයේ ක්‍රමානුකූල පිළිවෙළ තුළින් සංවිධායකයාණන් වන අල්ලාහ් ව සොයාගෙන ඇත්තේය; ඔහුට අපරිමිත වූ විචක්‍ෂණය, අධිෂ්ඨානය හා බලය

ඇත්තේය. ඔහුගේ ශුද්ධවූ දේවත්වය ඉදිරියේ අපි සිරස නමා සජ්තාංග නමස්කාර කර, මහානුභාව සම්පන්න කුර්ආනයේ පහත සඳහන් පාඨය නැවත නැවතත් උච්ඡාරණය කරන්නෙමු.

"අහස් හිද පොළොවෙහි ද රාජ්‍යය ඔහු ගේය. ඔහු තමාට පුතෙකුව නොගත්තේය. ඔහුගේ රාජ්‍යයෙහි ඔහුට කිසිම සහායයෙකු ද නැත්තේය. සියලු දැය නිර්මාණය කර, ඔහු ඒවාට නියමිත ප්‍රමාණයන් ද ලබා දී ඒවා ක්‍රමානුකූල පිළිවෙළකට සැකසුවේය." (25:2)

අවශ්‍යතාවය සහ භාව්‍යතාවය

ලොවේ, අප දකින සැම දෙයක්ම අනෙකක් මත රඳ පවතින්නේය. එනම් ජීවියෙකු නිර්මාණය කිරීමෙහි ලා අවශ්‍ය වන ශ්‍රේණින් ලෙස පෙළ ගැසී පවතින හේතු කාරකයන්, ප්‍රතිඵලයන් සහ තත්ත්වයන් යනාදියයි. මෙම සාධකයන් අඛණ්ඩව නොපවතින්නේ නම් එම ජීවියා ගේ ජීවනය ද නොනැවතී සිදුවිය නොහැකිය.

මානව ජීවියෙකුගේ ජීවිතය නොනැවති කරගෙන යාම; මවකු, පියෙකු, පෝෂණය, වර්ධනය ඔහුගේ ජීවිතයට බලපෑම් කරන සිය ගණනක්වූ අනෙකුත් කාරකයන් සහ තත්තවයන් මත රඳ පවතින්නේය. ඇත්ත වශයෙන්ම ස්වභාව ධර්මයෙහි කිසිම සිද්ධාන්තයක් ස්වයං පෝෂිත හා ආත්ම විශ්වාසී නොවන්නේය. ස්වාධීනව බිහිවීමට හෝ ජීවත් වීමට නොහැකි එවැනි ජීවීන් දර්ශනිකවාදීන් විසින් 'භාව්‍යය' යැයි නම් කරනු ලැබේ.

දර්ශන විද්‍යාත්මකව 'භාව්‍යය' යනු එක් පැත්තකින් එහි සාරයෙන්ම පැවතීම අවශ්‍ය නොවේ. අනෙක් පැත්තෙන් එහි පැවැත්ම සම්පූර්ණයෙන්ම විය නොහැක්කක්ද නොවන්නේය. වෙනත් වචන වලින් කිවහොත් භාව්‍යය යනු නිශ්චිත තත්වයක් අඛණ්ඩව ලබාදුන්නොත් එය දෘශ්‍යමාන වන අතර අවශ්‍ය තත්ත්වයන් නොමැති විට දෘශ්‍යමාන නොවේ. එමනිසා භාව්‍යය එහි සාරයෙන් පැවතීම යනු අනෙක් ජීවීන් ගැන නොසළකා, අවශ්‍ය හා නිශ්චිත නොවන්නා වූ ද , විය නොහැකි හා යථාර්ථව තේරුම් ගත නොහැකි නොවන්නාවූ ද එකකි. ස්වභාව ධර්මයේ අප

දකින්නාවූ කුමක්වුවද කුඩා පරමාණුවේ සිට සුවිශාල සක්වල දක්වා එකම ගුණයකින් යුතුව පවතින්නේය. එනම් ඒවා හි පැවැත්ම අනෙක් දේවල් මත රඳ පවතින අතර ඒවාහි දෘෂ්‍යමානත්වය සඳහා අනන්ත අප්‍රමාණ වූ කාරකයන් මැදිහත්වී ඇති බවයි.

අප මානව වර්ගයා හා භෞතික ලෝකය, පමණක් පැවතියේ නම් අප විසින් නිසැකයෙන්ම සෑම දෙයක්ම 'භාව්‍ය' බව සොයාගනු ඇත. එනම් සෑම දෙයක්ම වෙනත් පවතින දෙයක් මත එහි සාරයෙන්ම රැඳී පවතිනු ඇත. කිසි දෙයක් ස්වාධීනව නොපවතිනු ඇත. සෑම අවස්ථාවක්ම එයට හිතකර තත්ත්වයන් යටතේ විද්‍යාමාන වී, පැවතීම සත්‍යයක් වන නමුත් එහි පැවතීම වෙනත් දෙයක පැවතීම මත රැඳී පවතින අතර එය විසින්ම තමාගේ පැවැත්ම දිගටම ගෙන යා නොහැකි බව අප අමතක නොකළ යුතුය.

සත්‍ය වශයෙන්ම, හේතු ව නිරන්තරයෙන්ම ඵලයට පෙර සිදුවන අතර සාමාන්‍යයෙන් සෑම දෙයක්ම, ඒවාහී නිර්මාණය කෙරෙහි ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටුකළාවූ වෙනත් දෙයක් මත රැඳී පවතින්නේය. මෙම සහ බන්ධන සම්බන්ධතාවය ලොවේ සෑම තැනම පිරී පවතින අතර ඒවා ඒවාහී අනුගත සම්බන්ධතාවයේ යුතුකම සම්පූර්ණයෙන්ම ඉටුකරන්නේය. අප නිරීක්ෂණය කරන ආකාරයට මෙම සහ බන්ධන සම්බන්ධතාවය, භාව්‍ය වූද අනෙක් දේවල් මත රැඳී පවතින්නා වූ ද දේවලට අනුකූලතා දක්වන්නේය. එනම් ශාකයක් වැඩුනේ බීජයකින් නම් එම බීජය එයට නියමිත වාරයේදී වෙනත් ශාකයකින් බිහි කරන ලද්දක් වන්නේය. යනාදී වශයෙනි. ස්වභාව ධර්මයේ සෑම ජීවියෙකුම වෙනත් ජීවියෙකුගේ අවශ්‍යතාවයකින් යුතුව සිටින බැවින් එහි සංවිපාකය වශයෙන්, අවශ්‍යතාවයන් හා නැංගුරම් උත්පාදනය කරනු ලබන්නාවූ නැංගුරම් පොළක් වන්නාවූ ද අවශ්‍යතාවලින් හා භාව්‍යයෙන් ස්වාධීන වන්නාවූ ද ඔහුගේ නිර්මාණයට වෙනත් කිසිම සුපිරි හේතුවක් තිබිය නොහැකිවන්නා වූ ද පරම පැවැත්ම, අප විසින් සොයා ගත යුතුය. එමනිසා අපගේ භෞතික ලෝකයේ පවතින සියලු භව්‍ය දේවල් අනිවාර්යයෙන්ම 'අවශ්‍ය' පැවැත්මකින් මූලාරම්භ කෙරෙන්නේය.

අවශ්‍යතාවය යනු ස්වයං පෝෂිත දෙයක් වන අතර එහි සාරය පරම පැවැත්ම හා සමාන වන්නේය. නොපැවැත්මෙහි සම්භාවිතාවය එහි ස්වභාවය සමඟ අනුකූල නොවන්නේය. එය එමඟින්ම දිගටම පවතින්නේය. එහි පැවැත්ම හෝ විද්‍යාමාන වීම සඳහා කිසිම හේතුවක් හෝ තත්ත්වයක් බලපෑම් කළ නොහැකිය.'අවශ්‍යතාවය' පරම වූද, ස්ථිර වූද, සියලු වැරදි දෝෂ සහ නොපැවැත්මෙන් ස්වාධීන වූද වන්නේය. මෙම ගුණාංග එනම්: අවශ්‍යතාවය, සමෘද්ධිමත් බව සහ ස්වාධීනත්වය ආදිය අනුගමනය කිරීමෙන් එයට හේතුව වශයෙන් ද ව්‍යාප්ත කාරකය වශයෙන් ද අනෙකුත් ජීවීන්ගේ දෘශ්‍යමානත්වය සඳහා වූ මූලාරම්භය වශයෙන් ද පත්වන්නේය.

නිර්මාණයෙහි සහ සියලු සිද්ධාන්තවල හේතුව සහ කර්තෘ අල්ලාහ් ම වුවද ස්වභාවික කාරකයන් ද, විද්‍යාත්මක මූලධර්මවල භාවිතය ද නිෂේධනය නොකළ යුතු බව නැවත වරක් මතක තබා ගත යුතුය. මේ සියලු හේතු කාරකයන් සහ මූලධර්මයන් නිර්මාණාත්මක සැලැස්මෙහි අංගයන් වන අතර අල්ලාහ් සදකාලික මැවුම්කරුවාණන් වන්නේය.

7. සම්භාවිතය ගණනය කිරීම

1. එකේ සිට දහය දක්වා අංකනය කරන ලද වීදුරු බෝල දහයක් තෝරාගෙන දෙකෙළෙවර විවෘත වූ සිලින්ඩරයක් තුළට, එකකට පසුව අනෙකක් ලෙස අහඹු ලෙස දමන්න. පූර්ව අධිෂ්ඨානයක් හෝ ගණනය කිරීමක් නොමැතිව වීදුරු බෝල එකකට පසුව අනෙකක් අංකනය කර ඇති අනු පිළිවෙළටම ලැබීමේ ආකස්මික අවස්ථාව ගැන සාධාරණ මිනිසෙකුට කොතරම් දුරට අවබෝධ කර ගත හැකිද?

වීදුරු බෝල වලින් 'එක' වශයෙන් අංකනය කරන ලද බෝලය ප්‍රථමයෙන්ම ලැබීමේ සම්භාවිතාවය දහයට එකක් ඇති බව අපි දනිමු.'එක' ට පසුව 'දෙක' ලෙස අංකනය කරන ලද බෝලය අනුපිළිවෙළින්ම ලැබීමේ සම්භාවිතාව සියයට එකකි. මෙ ආකාරයෙන් අංකනය කරන ලද අනුළිවෙළටම වීදුරු බෝල ලැබීමේ සම්භාවිතාව බිලියනයට එකක් වනු ඇත.

පොතක් මුද්‍රණය කිරීම

2. පොතක් මුද්‍රණය කිරීමට භාවිතා කරන ලද අකුරු සියල්ලම මිශ්‍ර කළ පසුව එම පොතම නැවත මුද්‍රණය කිරීම සඳහා අහඹු ලෙස අකුරු ඇහිඳ ගෙන පිළිවෙළින්ම නැබීම සඳහා මිනිසෙකුට ඇති සම්භාවිතාවය කොපමණද?

යතුරු ලියනය

3. යතුරු ලියනයන් සමඟ සෙල්ලම් කරන කුඩා ළමයෙකු ගැන සිතන්න. අහඹු ලෙස යතුරු ලියනයේ බොත්තම් එබීමෙන් ඔහුට දීර්ඝ පාඩමක් හෝ සම්පූර්ණ කවියක් නිර්මාණය කිරීමට හැකිවනු ඇද්ද?

පොතක පිටු

4. පැස්කල්ට අනුව, පිටු සියයක් ඇති පොතක, පිටු වෙන්කොට ඒවා මිශ්‍ර කොට පසුව කුඩා ළමයෙකුට හෝ අකුරු නූගත් මිනිසෙකුට එම පොත නැවත සකස් කර දෙන ලෙස ඉල්ලීමක් කළ විටක, ඔහු පළමු වතාවේදීම පළමු පිටු තෝරාගැනීමේ සම්භාවිතාවය සියයට එකකි. එමනිසා පිටු අනුපිළිවෙළට සකස් කිරීම සඳහා ඔහුට ඇති සම්භාවිතාවය මල්ටි බිලියනයකට එනම්: 10 ඉලක්කමට දකුණු පසින් බිංදු 99ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවට එකකි. එවිට එවැනි සම්භාවිතාවයක සිදුවීම බොහෝ විට අභිශූන්‍ය (බිංදුව) වන අතර කිසිම තර්කානුකූල පුද්ගලයෙකුට මෙවැනි සිදුවීමක් සිදුවේ යැයි පිළිගත නොහැකිය.

අණුවල සම්භාවිතාවය ගණනය කිරීමේ දෘෂ්ටිකෝණයක්

සෑම සජීවී සෛලයකටම අත්‍යවශ්‍ය සංයෝගයක් වන ප්‍රෝටීනයෙහි මූල ද්‍රව්‍යයන් පහක් සංයෝග වී ඇත. එනම්: කාබන්, හයිඩ්‍රජන්, ඔක්සිජන්, ඇසෝට් සහ සල්ෆර් (ගෙන්දම්) වේ. විද්‍යාඥයන්ට අනුව දුෂ්කර අණුවකට මේ ආකාරයේ පරමාණු 40,000ක් සංයෝග වේ. සෑම මූල ද්‍රව්‍යක්ම (මේ දක්වා සියයට අධික මූල ද්‍රව්‍යයන් ප්‍රමාණයක් සොයා ගෙන ඇත) අහඹු ලෙස එහි මෙහි විසුරුවා හරින ලද පසුව එකිනෙකට වෙනස් වූ මූල ද්‍රව්‍යයන්

පහක් සංයෝග වී ප්‍රෝටීන බවට පත්වී, ජීවියෙකු ලෙස පරිවර්තනය වීමේ සම්භාවිතාවය අභූත හා හාස්‍ය ජනක එකකි. මෙය විද්‍යාඥයන් පසෙක තබා, සාමාන්‍ය සාධාරණව මිනිසකුට පවා කොහේත්ම පිළිග23 ත නොහැකි වන්නේය.

ස්විට්සර්ලන්ත විද්‍යාඥයෙකු වන චාර්ල්ස් ඉයුජීන් ගේයි(Charles Eugene Gauy), එවැනි සිදුවීමක සම්භාවිතාවය 10^{48}කට එකක් බව ගණන කර ප්‍රකාශ කළේය. වෙනත් වචන වලින් පවසන්නේ නම් එවැනි සිදුවීමක් එනම් වෙනස් වූ මූල ද්‍රව්‍යයන් පහක් එකට එකතුවීම, ස්වභාව ධර්මයෙහි සිදුවීමට අවශ්‍ය තත්ත්වයන් හමුවන තෙක් කෙනෙකුට අවුරුදු බිලියන ගණන් බලා සිටිය යුතුව ඇත. කෙසේ වෙතත් එම මූල ද්‍රව්‍යයන් පහ වෙනත් ආකාරයට සංයෝග වීම නිසා ඒ වෙනුවට මරණය ගෙන දෙන වස වර්ගයක් පවා ඇති විය හැකි බව අප අමතක නොකළ යුතුය.

ප්‍රෝටීන ඇමයිනෝ අම්ලයෙන් සමන්විත වන්නේය. ඉංග්‍රීසි ජාතික රසායන විද්‍යාඥ ලීත්(Leeth) පවසන ආකාරයට සරල ප්‍රෝටීන දමයක් එකිනෙකට වෙනස් වූ හැඩයන් 10^{48} ආකාරයකට නිර්මාණය විය හැකිය. එසේ නම් පවතින ප්‍රෝටීන බලාපොරොත්තු නොවූ අහම්බෙන් සිදුවූ සිදුවීමක ප්‍රතිඵලය විය හැක්කේ කෙසේද? තව ද මූල ද්‍රව්‍යයන් අජීවී වන අතර ප්‍රෝටීන සජීවී බවට පත්වන්නේ එවැනි ක්‍රමානුකූල පිළිවෙළක් හා තත්ත්වයන් මතුවීම නිසා පමණි.

ඔබ හා මා හුදු උදාහරණ ලෙස ගැනෙන ස්වභාව ධර්මයෙහි පවතින සෑම වර්ගයකටම අයත් ජීවීන් පැහැදිලි, ක්‍රමානුකූල පිළිවෙළක් හා ගණනයන් ඇතිව නිර්මාණය කරනු ලැබ ඇත්තේ ප්‍රඥ සම්මපන්න වූද අති ශ්‍රේෂ්ඨ වූ ද අධිෂ්ඨානයක් විසින් බව විද්‍යාඥයෙක් වඩාත් හොඳින් නොදන්නෙහුද? පිළිතුර ඇත්ත වශයෙන්ම ධනාත්මකයි. ඩාවින් විසින් එය මෙසේ පවසා ඇත. ''සියළු ජීවීන් සමග වූ මේ සුවිශාල ලෝකය අහඹු සිදුවීමකින් සිදුවී නොමැති බව සෑම සාමාන්‍ය මනසක්ම නිසැකයෙන්ම දනී. එවැනි ඥානවන්ත සංවිධානාත්මක ව්‍යුහයක් ස්ථාපිත කිරීමෙහි ලා ආකස්මික අහඹු අවස්ථාවක් අසමර්ථ වනු ඇත.''

ස්වයංක්‍රීය ක්‍රමයන් කිහිපයක් අනුකරණය කරමින් මිනිසා විසින් සාදන ලද සර්ව සම්පූර්ණ නොවන රේඩාර් යන්ත්‍රයක ව්‍යුහය, ඉංජිනේරු විද්‍යාඥයන් විසින් සැළසුම් කරන ලද්දක්ද? නොඑසේ නම් අහම්බෙන් නිෂ්පාදනය වූවක්ද? එවැනි උපකරණයක් මනසේ ප්‍රතිඵලයක් නම් පක්ෂියාගේ දිශාව සොයා ගැනීමේ ප්‍රයත්නයක් වූ ද එමගින් පක්ෂියාට කිසිම බාධකයක නොගැටී අඳුරේ පියාසර කිරීමට හැකිවන්නා වූද වවුලා ගේ අංග සම්පූර්ණ රේඩාරය ගැන කෙනෙකුට සිතිය හැකිද? එය ආකස්මික අහඹුවක ප්‍රතිඵලයක්ද? වවුලාගේ රේඩාරය කිසි දිනක අලුත් වැඩියා කිරීමට අවශ්‍ය නොවන බව ද එය තුලන රූප පෙන්නුම් කිරීමට පවා සමත් වන බව ද මතක තබා ගන්න.

හැරින්ස්ටන් විශ්ව විද්‍යාලයේ ජීව විද්‍යාව පිළිබඳ මහාචාර්ය එඩ්වින් ක්‍රැන්ක්ලයින් ගෙන් උපුටා දැක්විය යුතු අවස්ථාව මෙයයි. ''ලෝකය, එහි පවතින එකිනෙකට වෙනස් වූ ද විශ්මය ජනක වූ ද මුළු මහත් ජීව සන්තතිය සමඟ අහඹු ආකස්මික සිදුවීමකින් විද්‍යාමාන වීමේ සම්භාවිතාවය ; විශාල හා නිරවද්‍ය වූ විශ්ව කෝෂයක් එහි අන්තර්ගත දේ පිළිබඳ රසවත් වගුවක් ද සමඟ අහඹු ආකස්මික ලෙස මුද්‍රණාලයකින් නිෂ්පාදනය වීමේ සම්භාවිතාවය තරම් දුර්වල එකකි.''

ඔව්, විද්‍යාඥයන් ගේ ශ්‍රේෂ්ඨ දැනුම, දිව්‍ය කරුණාව වඩාත් තහවුරු කරන බව අපි පිළිගනිමු. ස්වාභාවික සිද්ධාන්තයන් සහ ඒවාට අදල වැදගත් ගැටලු අධ්‍යයන කිරීම තුළින් ඔවුහු ස්වභාව ධර්මයේ ලෝකය ඉක්මවා පවතින මුලු මහත් ජීවී සන්තතියේ මැවුම්කරුවාණන් වන අති ශ්‍රේෂ්ඨ ප්‍රඥව අවබෝධ කර ගනිති.

විද්වතුන් ගේ වදන්

අල්ලාහ් ව දැන ගැනීම පිළිබඳ විද්‍යාඥයන්, විද්වතුන් හා විද්‍යාවේ නොයෙකුත් ශාඛාවල විශේෂඥයන් කිහිප දෙනෙකු විසින් ප්‍රකාශ කරන ලද අදහස් සමූහයක් කිසිම විවේචනයකින් තොරව මේ කොටසේ අපි උපුටා දක්වන්නෙමු. අපගේ අරමුණ ඉටු කිරීමෙහි ලා මෙම අදහස් පිළිබඳ අධ්‍යයනය කිරීම හා විශ්ලේෂණය කිරීම මහත් සේවයක් බව ප්‍රත්‍යක්ෂ දෙයකි.

නිර්මාණාත්මක ලෝකයේ අභිරහස් පිළිබඳ දැනුම මිනිසා වැඩි වැඩියෙන් ලබාගන්නා තරමටම ඔහු වැඩියෙන් මැවුම් කරුවාණන්ට අවනත වන අතර මැවුම්කරුවාණන්ගේ සර්ව බලධාරී හා සර්වඥ වූ පැවැත්ම ද තහවුරු කරන බව අපට දැක ගත හැකි වනු ඇත. මේ අදහස් වලින් කිහිපයක් පහත පෙළ ගස්වා ඇත.

1. ද්‍රව්‍යයක් පරමාණු වල සහ අණුවල ඒකරාශී වීමක් වන අතර පරමාණු සහ අණුක වල පවා ඒවා සමන්විත වී ඇති සංයුක්ත කොටස් වලින් යුක්ත වන්නේය. එනම් ප්‍රෝටෝන, නියුට්‍රෝන සහ ඉලෙක්ට්‍රෝන වශයෙනි. එමෙන්ම විදුලි බලය හා බල ශක්තිය යම් නිශ්චිත නියමයන්ට විෂය වස්තු වන්නේය. ඒවාහි පැවැත්ම ආකස්මික අහඹුවක් නොවන්නේය. නිසැකයෙන්ම ලෝකය, මනා ලෙස සංවිධානය කරන ලද ලෝකයක් වේ. එය නීති නියමයන් අනුගමනය කරන අතර එය ආකස්මික අහඹු සිදුවීමට විෂය ගත නොවන්නේ, ද්‍රව්‍යයක් විසින්ම තමාව හෝ තමාව පාලනය කරන නීතීන් උත්පාදනය කර ගත නොහැකි බැවිනි. ජීවීන් සංවිපාකයන් ලෙස අභෞතික කාරකයක නිර්මාණයක්ව පවතින්නේය.

එහෙයින් අපට එළඹිය හැකි වන තර්කානුකූල හා අවශ්‍යයෙන්ම විය යුතු නිගමනය වන්නේ මැවීම විශ්වයෙහි තත්වාකාරයෙන් තේරුම් ගෙන ඇති බව පමණක් නොව එය බලවත් හා ඥනවන්ත පැවැත්මක අධිෂ්ඨානය සහ රටාව යටතේ තේරුම් ගෙන ඇති බවය.

ජෝන් සී කොතරන් *(ගණිතඥ හා රසායන විද්‍යාඥ)*

2. සෞර ග්‍රහ මණ්ඩලයේ අප නිරීක්ෂණය කරන ක්‍රමානුකූල පිළිවෙළ ආකස්මික අහඹු සිදුවීමකට ආරෝපණය කිරීම කළ නොහැක්කකි. එම නිසා අපට ඉතිරිව ඇත්තේ පවතින ක්‍රමානුකූල පිළිවෙළහි හා මූලාරම්භක හේතුව වන පැවැත්ම තහවුරු කිරීම පමණකි.

ලැප්ලේස් *(තාරකා විද්‍යාඥ)*

3. ස්වභාව ධර්මයේ යම් ආකාරයක ක්‍රමානුකූල පිළිවෙළක් හා විධිවිධානයන් පවත්වාගෙන යනු ලබද්දීත් අප දෙවියාණන් ගේ

පැවැත්ම නිෂේධනය කරන්නේ නම් ඇත්ත වශයෙන්ම අපි තර්කයට හා සාමාන්‍ය මනසකට එරෙහිව පරස්පර විරෝධී දෙයක් පිළිගන්නෙමු.

ඩබ්. ඕ. ලැන්ඩ් බර්ගර් *(ජීව රසායන විද්‍යාඥ හා මනෝ විද්‍යාඥ)*

4. මිනිසා ඔහුගේ බුද්ධිය හා සහජයෙන්ම ඇති පෙළඹවීම තුළින් භෞතික ලෝකයේ තර්කානුකූල අනුපිළිවෙළක් පවතින බව සොයා ගෙන ඇත්තේය. ලෝකය ආකස්මික අහඹු සිදුවීමකින් ඇතිවූ බව සිතා ගැනීම ඔහුට දුෂ්කර වන්නේය. භෞතික වස්තූන්ට බුද්ධිය හා අධිෂ්ඨානයක් නොමැති බව ද ඔහු සොයා ගෙන ඇත්තේය. (දෙවියන් වහන්සේ) ඔහුගේ පැවැත්මෙහි සාධකය තුළින්ම මිනිසා, මිනිසාගේ තේරුම් ගැනීම හා බුද්ධිය ඉක්මවා නිර්මාපකයාණන්ගේ පැවැත්ම සඳහාවූ අවශ්‍යතාවයක් හඟින්නේය....... මිනිසාගේ ක්‍රියාකාරීත්වයේ සහ බුද්ධියේ මැදිහත්වීමකින් තොරව විශේෂ හා ක්‍රමානුකූල අනුපිළිවෙළක් මගින් විශ්වය පාලනය කරනු ලබන්නේය. ජීවයේ ප්‍රාතිහාර්යයට අධිස්වාභාවික මූලාරම්භයක් තිබේ. එම නිසා මිනිසා සහ අනෙකුත් ජීවීන්ගේ මැවීමෙහි මූලාරම්භය දෙවියන් වහන්සේ වන අතර ඔහු ලොවේ පවතින ක්‍රමානුකූල පිළිවෙළ නඩත්තු කරන්නේය.

පෝල් සී. ඇබර්සෝල්ඩ් *(ජීව විද්‍යාඥ)*

5. ලෝකය ස්වභාව ධර්මයේ බලවේගයන් මගින් ස්ථාපිත වී ඇති බව ද එය නියත නීතීන් මගින් පාලනය වන බව ද අප දකින විට එයට සංවිධාකයෙකු හා පාලකයෙකු සිටිය යුතු බව අපි දැනුවත් වන්නෙමු. ස්වභාව ධර්මයෙහි මෙම නීතීන් සහ ක්‍රමානුකූල පිළිවෙළ, ග්‍රහලෝකවල මෙන්ම චන්ද්‍රිකාවල චලනය කල්තියා දැක ගත හැකි වන තරමට ඉතාමත් පැහැදිලි, පෘථුල හා වැදගත් වන්නේය. එසේම විද්‍යුත් ආරෝපණ වල සහ රසායනික ප්‍රතික්‍රියාවල පවතින ක්‍රමානුකූල පිළිවෙළ බොහෝ ස්වාභාවික සිද්ධාන්තයන් ද වීජ ගණිතමය සමීකරණ මගින් ප්‍රකාශ කළ හැකි වන පරිදි ඉතාමත් නියත වන්නේය.

අප, මානව අත් දැකීම් වල දකින රීතීන් හා ක්‍රමානුකූල

පිළිවෙල, සත්‍යයේ හා අමූර්තනයේ ලෝකයෙහි පවතින ක්‍රමානුකූල පිළිවෙළෙහි ප්‍රතිඵලයක් වන්නේය.

ලෝකයේ පවතින ක්‍රමානුකූල පිළිවෙළ වෙනත් වචන වලින් පවසන්නේ නම් ව්‍යාකූලත්වයන්ගෙන් තොරවූ ලක්ෂණය, සියලු සිදුවීම් ඥනාන්විත බලයකින් පාලනය කරනු ලබන බවට ප්‍රත්‍යක්ෂ සාක්ෂියක් වන්නේය.

මාර්ලෙයින් බී. ක්‍රයිඩර් *(භෞතික විද්‍යාඥ)*

6. කනෙහි ව්‍යුහය පිළිබඳ අධ්‍යයනය, එහි නිර්මාපකයා විචක්ෂණ ලෙස ධ්වනියේ නියමයන් සහ මූල ධර්මයන් දැන සිටි බවක් පෙන්වයි. අන්තරීක්ෂයේ පිළිවෙළ පිළිබඳ අධ්‍යයනයෙන් පවා, යම් නිශ්චිත නියමයක උපක්‍රමයෙන් ඒවා පාලනය කරන ශ්‍රේෂ්ඨ යථාර්ථයක පැවැත්ම අපට අවබෝධ වන්නේය.

අයිසැක් නිව්ටන් *(ගුරුත්වාකර්ෂණ නියමය සොයාගත් විද්‍යාඥයා)*

7. විශ්වය ක්‍රමානුකූල පිළිවෙලකට ක්‍රියාත්මක වීමට සළස්වා, එම පිළිවෙළෙහි සළකුණු හා ප්‍රතිඵල, ස්වභාව ධර්මයේ විවිධ මූල ධර්මවල හෙළිදරව් කරන්නාවූ ශ්‍රේෂ්ඨ හා සදතනික ඥනය මගින් එය පාලනය කරනු ලබන්නේය.

සී. ෆ්ලැමරීන්

8. බොහෝ විට සියලුම විද්වතුන් විසින් තහවුරු කොට ඇති ස්වභාව ධර්මයේ පවතින ක්‍රමානුකූල පිළිවෙළ මැවීම පිළිබඳ වූ ස්ථාවර මතයෙන් පමණක් නොව මෙම පිළිවෙළ නොනැවතී දිගටම අඛණ්ඩව පැවතීම ආරක්ෂා කිරීම සඳහා අති ශ්‍රේෂ්ඨ ඥනය දෙවියන් වහන්සේ ගේ පැවැත්මෙහි අවශ්‍යතාවය ඇති කරන්නේය.

ඩී. රොබට් කාර් *(භූ රසායන විද්‍යාඥ)*

9. දෙවියන් වහන්සේ ගේ ස්වභාවය සෙවීම හා ඔහුගේ පැවැත්ම නිෂේධ කිරීම වෙනුවට, විශ්වයේ පවතිවන ක්‍රමානුකූල පිළිවෙළ තුළ අපි ඔහුව දැක ගත යුතු අතර අපි ඔහුට නමස්කාර

කළ යුතු ද වන්නෙමු. ලොවේ අභිරහස් සොයා ගැනීමට සහ අවබෝධ කර ගැනීමට මිනිසා සමත් වන නමුත් පවතින නීති නියමයන් හා මූල ධර්මයන් නිර්මාණය කිරීමට ඔහු අපොහොසත් වන්නේය. ස්වභාවික නියමයන් ස්ථාපිත කිරීමට සමත් වන්නේ දෙවියන් වහන්සේ පමණි.

ජෝන් ඒ. බොහ්ලර් *(රසායනඥ)*

10. ලොවෙහි පවතින ක්‍රමානුකූල පිළිවෙළ පිටුපස අති ශ්‍රේෂ්ඨ වූ ඥනයක් තිබෙන්නේය. මෙම ජීවි බලය ද්‍රව්‍ය ධාතුව සහ ශක්තිය අතීතයේ යම් නිශ්චිත කාලයක නිර්මාණය කොට නිසි ස්ථානයන්හි ආකාශ වස්තූන් චලනය වීමට සළස්වා, දියුණු කිරීමේ හැකියාව ලෝකය වෙත පිරිනැමුවේය.

එවර් ලයින් සී. කැලින්ස් *(රසායන විද්‍යා ඉංජිනේරු)*

11. පරම නිපුණත්වය සත්ව ශරීරවල ව්‍යුහයන්ට බෙද දෙනු ලැබ ඇති බව ජීව විද්‍යාඥයෝ විශ්වාස කරති. රතු රුධිරාණු වල හැඩය සහ ප්‍රමාණය ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය අංග සම්පූර්ණ ලෙස හුවා දක්වති. හැඩයෙන් අංග සම්පූර්ණ වන අනෙකුත් අවයව වලටද මෙය අදල වන්නේය. මේවා ප්‍රඥවන්ත මැවුම්කරුවාණන් වන සියලු මැවීම් කෙරෙහි පාලනයක් ඇති, සර්ව බලධාරී නිර්මාපකයාණන් ව ඔප්පු නොකරන්නේ නම්, විද්‍යාව අර්ථ ශූන්‍ය හා පලක් නැති දෙයක් වන්නේය.

අයි. වෙස්ටර් රෙක්ස් *(භෞතික විද්‍යාඥ හා ගණිතඥ)*

12. පවතින රසායනික මූලද්‍රව්‍ය වල සහ නව මූල ද්‍රව්‍යවල සංයෝගය පිළිබඳව අධ්‍යයනය කිරීමට රසායනඥයෝ, මූල ද්‍රව්‍ය වල ආවර්තිතා වගුවේ (මෙන්ඩලීෆ් ගේ වගුව) සහාය ලබා ගනිති. ප්‍රායෝගික පර්යේෂණ වලදී ඔවුන්ගේ සාර්ථක භාවය වන්නේ භෞතික ලෝකයේ පවතින විශ්මිත ක්‍රමානුකූල පිළිවෙළ හි සාධකයයි.

මගේ අදහස අනුව, ස්වභාව ධර්මයෙහි සෑම දෙයක්ම ක්‍රමික පිළිවෙළකට හා අධිෂ්ඨානයකට අනුකූලව ඉටු කරනු ලැබ

ඇත්තේය. මේ සඳහා ඥානාන්විත පූර්ව විධානයක් අවශ්‍ය වනු ඇත. මම එය , දෙවියන් වහන්සේ ලෙස හඳුන්වමි.

බොහෝ විද්‍යාඥයෝ ජලයෙහි විශ්මිත සම්පත් ගැන අධ්‍යයනය කොට ඒවාහි හේතු කාරකය අවබෝධ කර ගැනීමට උත්සාහ කොට ඇත. සියලු සිද්ධාන්ත වල විද්‍යාමානත්වයේ ගුණය අප සොයා ගන්නා වුවද එහි ''ඇයි'' යන ප්‍රධාන ප්‍රශ්ණය ඉතිරිව ඇත්තේය. එනම් හේතුඵලත්වයයි. ජලය හැරුණු කොට මිනිසා ඒවායේ සම්පත ගැන නොදන්නා දේ බොහෝ ඇත. මෙම ප්‍රශ්ණය විසඳන ඒත්තු ගැන්විය හැකි පිළිතුරක් මම සොයා ගෙන ඇත්තෙමි. ස්වභාව ධර්මයෙහි පවතින ක්‍රමික පිළිවෙළ, ශ්‍රේෂ්ඨ වූ පූර්ව විධාන සැලැස්මක් හේතුවෙන් ස්ථාපිත වී ඇත්තේය. මෙය මහා කාරුණික නිර්මාපකයාණන් විසින් ඔහුගේ නිර්මාණයන් කෙරෙහි ප්‍රදනය කෙට ඇති කරුණාවයි.

තෝමස් ඩී. පාර්ක්ස් *(රසායන විද්‍යඥ)*

13. දැන් අපි මූලික සාකච්ඡාවට හැරෙමු. එනම් අවිශ්වාසනීය ප්‍රමාණයකින් යුත් ආකාශ වස්තූන් හා තාරකාවන්හී ලෝකයේ ශ්‍රේෂ්ඨ වූ විශ්වය, විවිධවූ ඝණ ද්‍රව්‍යයන් හා සජීවී දේ සහ අප්‍රමාණ වූ, නිසි ලෙස සංවිධානය කෙරුණු ස්වභාව ධර්මයේ මූල ධර්මයන්, යනාදියයි. මෙවනි නිසි ලෙස සංවිධානය කෙරුණු සූක්ෂ්ම වූ ව්‍යූහ පද්ධතියකට නිර්මාපකයෙකු අවශ්‍ය නොවන්නේද? එවැනි ක්‍රමික පිළිවෙළක පැවැත්ම; අති ශ්‍රේෂ්ඨ වූ පැවැත්මක් පවතින බව නිගමනය කිරීමට නොසැහෙන්නේද?

ඔස්කාර් එල්. බෲවර් *(භෞතික විද්‍යාඥ හා රසායනඥ)*

14. මම, ඔහුගේ සළකුණු සියලු ජීවීන් හා මැවීම් තුළ නිරීක්ෂණය කළෙමි. මිනිසාගේ දෑසට නොපෙනුනද ඒවායින් පැහැදිලි වන්නේ මොන තරම් බලයක් ද ? සෑම දෙයකම එතරම් විශේෂ වූ ඥනයක් හා පරිපූර්ණත්වයක් දැකිය හැකිය.

ලිස්ටෙ *(ජීව විද්‍යාඥ)*

15. මෙම නීති නියමවල සහ ක්‍රමික පිළිවෙළෙහි පැවැත්ම ප්‍රත්‍යක්ෂ කරගන්නාවූ ස්ථිර විනිශ්වයට, ලෝකයට මූලාරම්භයක් නොමැති බව තවත් විශ්වාස කිරීම කළ නොහැක්කකි.

ඩාර්වින් *(පරිණාමවාදයේ නිර්මාතෘ)*

16. සතුන්ගේ බිහිවීම හා ඔවුන්ගේ හැඩයන් ආකස්මික අහඹු සිද්ධියක් නොවේ. ඔවුන්ගේ වර්ගය තුළ පවතින සමානකම් සහ වෙනස්කම්, යම් නිශ්චිත මූලධර්මයන් හා පිළිවෙළකට අනුකූලව පිහිටා ඇත. එකම ද්‍රව්‍යයක් වන ප්‍රොටොප්ලාස්මාව, යම් නිශ්චිත විචක්ෂණ අධිෂ්ඨානයක් හා ක්‍රමික පිළිවෙළක පැවැත්ම හේතුවෙන් වෙනස්කම් සහ සමානකම් ඇති වන්නාවූ විවිධ වර්ගවල සතුන් උත්පාදනය කරන්නේය. භෞතික ලෝකයේ පවතින මේ සියලු වර්ගයන්, නියමයන් සහ ක්‍රමික පිළිවෙළ ස්ථාපිතකර පාලනය කරනු ලබන්නේ බලධාරීවූ නිර්මාපකයාණන්ගේ අධිෂ්ඨානයයි.

ආර්. කේ. මික්සේ *(ජීව විද්‍යාඥ)*

17. පීචි ගසක මල්වල වර්ධනය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී මාගේ අවධානය යොමුවූයේ මල්වල පරාගනය සිදුවීම සඳහා මැදිහත්වන මී මැස්සන් සහ කෘමීන් කෙරෙහිය. ශාක හා කෘමීන් අතර පවතින මේ සියලු එකඟත්ව ගැලපීම් සහ සුහදතාවයන්, ස්වභාව ධර්මය ස්ථාපිත කොට පාලනය කරන අධිෂ්ඨානයක, පූර්ව විධානයක පැවැත්ම පෙන්නුම් කිරීමට සෑහෙන සාක්ෂියක් යැයි මම සිතුවෙමි.

ඩබ්. ඒ. ලේමර්ස් *(ජාන විද්‍යාඥ)*

18. භෞතික විද්‍යාවේ සෑම හා එකිනෙක ගැටලුවටම අපට උදාහරණයක් සහ මූල ධර්මයක් සොයා ගත හැකි වීම ආස්වාද ජනකය. මෙය ස්වභාව ධර්මයේ පවතින ක්‍රමික පිලිවෙළෙහි අන්‍යෝන්‍ය සම්බන්ධතාවය සහ යථාර්ථය තහවුරු කරන්නේය. පවතින ක්‍රමික පිලිවෙළ ආකස්මික අහඹුවක් හෝ ව්‍යාකූල ත්වයක ප්‍රතිඵලයක් යැයි යෝජනා කිරීම මානව බුද්ධියේ සාරයට කරන අපහාසයකි. එමනිසා බුද්ධිමත් මිනිසෙක් මෙම ලෝකයේ ක්‍රමික පිළිවෙළ සඳහා වූ නිර්මාපකයාණන් ව අනායාසයෙන්ම පිළිගනු ඇත.

ජී. එච්. බ්ලන්ට් *(භෞතික විද්‍යාඥ)*

19. මෙම එක්සත් බව, පොදු බව, අඛණ්ඩත්වය අරමුණ සහ

බන්ධනය, සමතුලිතතාවය සහ ජීවයේ අඛණ්ඩ බවට මැදිහත් වන කාරකයක් නොමැතිව පවතින්නට හැකි වූයේ කෙසේද? ස්වභාව ධර්මයේ බලපෑම කරන මේ විශ්මිත යථාර්ථයන් සහ පොදු කරුණු හෝ පොදු යථාර්ථයන් සඳහා තම මැවීම හා මැවීම තුළින් තම සළකුණු; පෙන්නුම කරන ප්‍රඥවන්ත පැවැත්මක මැදිහත් වීමකින් තොරව මේවා පවතින්නේ කෙසේද?

එම්. එස්. කොංඩන් *(දර්ශනික හා ජීව විද්‍යාඥ)*

මේ අදහස් උපුටා ගනු ලැබුවේ

1. *එස්බාත් ඒ වුජූද් ඒ කුඃද* (දෙවියන් වහන්සේ ගේ පැවැත්මෙහි සාධකයන්) විද්වතුන් සතලිස් දෙනෙකු විසින් ලියන ලදුව අහ්මද් අරාම් විසින් පරිවර්තනය කරන ලද්දකි.

2. *ෆර්හාජ අකායිද් ව කවාතීනේ ඉස්ලාම* (ඉස්ලාමීය අදහස් වල හා මූල ධර්මවල ශබ්ද කෝෂය) කයියිබ් සබෙස්තරි විසින් පරිවර්තනය කරන ලද්දකි.

3. ෆරිද් වුජ්දි, විශ්ව කෝෂය

4. *අෆාරි දෙගාර් එ ජහාන්* (ලොවෙ මැවුම්කරුවාණෝ) නසීර් මකාරිම් ෂිරාසි

5. කුද දර් තබීයත් (ස්වභාව ධර්මය තුළ දෙවියන් වහන්සේ) සී. ෆ්ලැමරියන්

දිව්‍ය ඒකීය භාවයේ සාධකයන්

මේ දක්වා අපි, අල්ලාහ් අති ශ්‍රේෂ්ඨ ලෙස පරිපූර්ණ හා පරම යථාර්ථ පැවැත්ම බව තේරුම් ගත්තෙමු. ඔහු සීමා නියමයන්ගෙන් ද මිණුමෙන් ද අකාර්යක්‍ෂමතාවයෙන් ද දෝෂ සහිත බවෙන් ද ස්වාධීනය. ඔහුට කිසියම් දෙයක අවශ්‍යතාවයක් ද නැත්තේය. ඔහුගේ පැවැත්ම අපරිමිත හා ස්වාධීන වන්නේය.

එවැනි පැවැත්මක් හෝ පරිපූර්ණත්වයක් බහුත්වාදයට අනුකූල විය නොහැකිය. ඔහු සාරයෙන්ම ඒකීය වේ. එක දෙවියෙකුට වඩා පැවතියේ නම් එකිනෙක දෙවියන්ට විශේෂිත වූ අකාර්යක්‍ෂමතාවයන් සහ දෝෂයන් හඟවන ගුණාංගයන් බොහෝ විට ඔවුන්ට ලැබෙනු ඇත. පරම පැවැත්ම එක්සත් භාවය හා සමාන වන බව දර්ශනවාදය තුළින් ඔප්පු කර තිබේ. අප කළින් සාකච්ජා කළ පරිදි මේ තර්ක වල මූලයන් දර්ශන වාදයෙහි වූ වද අල්ලාහ් ගේ ඒකීයත්වය අපට අනෙකුත් මට්ටම් වලින් ද තර්ක කළ හැකිය.

1. ලොවේ දෙවිවරුන් කිහිප දෙනෙක් පැවතියේ නම්, සෑම කෙනෙකුටම යම් නිශ්චිත බල සීමාවන් හා බල ක්ෂේත්‍රයන් පවතිනු ඇත. එසේ වූ විට ඔවුන් සෑම කෙනෙකුගේම බලය සීමා සහිත වන අතර ඔවුන්ගෙන් කිසිම කෙනෙකු සර්ව බලධාරී සහ පරිපූර්ණ නොවන්නේය. මෙය අප අල්ලාහ්ට ආරෝපණය කරන, සර්ව ව්‍යාපී, සර්ව බලධාරී සහ ස්වීය පැවැත්ම යනාදී ගුණාංග වලට පටහැණි වන්නේය.

2. ලෝකය ස්වාධීනව පාලනය කළ හැකි සමානවූ පරිපූර්ණ බලය සහිත දෙවිවරුන් දෙදෙනෙකු සිටියේ නම් එහි සංවිපාකය වශයෙන් ඇතිවන නියෝගයන් දෙක හා අධිෂ්ඨානයන් දෙකෙහි ප්‍රතිඵලය වශයෙන් ස්ථිර වශයෙන් අවුල් වියවුල් වූ අරාජිකත්වයක් සහ අපිළිවෙළක් කැළඹීමක් ඇති වනු ඇත. මේ පිළිබඳව ශුද්ධවූ කුර්ආනය මෙසේ පවසයි.

''(එකම) අල්ලාහ් හැර වෙනත් දෙවිවරුන් සිටිත් නම් අහස්හි හා පොළොවෙහි කලබල සිදුවනු ඇත.'' (22:211)

3. මේ සෑම මනඃකල්පිත දෙවියෙකුම, ලොව පාලනය කිරීමෙහි එකිනෙකාට සහයෝගය දක්වන බවට සහ සාකච්ඡා කරගන්නා බවට එකඟත්වයකට එලඹ සිටියේ නම්, ඔවුන් එක්කෝ එවැනි සහයෝගයක් සහ සාකච්ඡාවක් සඳහා අඛණ්ඩ අවශ්‍යතාවයකින් පෙළෙන අතර එසේ නැතිනම් ඔවුහු අසරණ හා දුබල බවට පත්වෙති. (දෙවියන් වහන්සේට අසීමිත බලයක් තිබිය යුතුව තිබියදී) ඔවුහු අනෙක් කොටස්කරුගේ අවශ්‍යතාවයෙන් පෙළෙන අබල දුබල තත්ත්වයට පත්වෙති. නැතිනම් සෑම දෙවියෙකුටම තනිව ලෝකය නිර්මාණය කිරීමෙහි සහ පාලනය කිරීමෙහි හැකියාවක් ඇතිවනු ඇත. දෙවැනි තත්ත්වය යටතේ ඔවුන්ගේ උපකාරය සහ සහයෝගිතාවය අර්ථ ශූන්‍ය හා ඵලක් නොමැති වන්නේය.

4. තවද , ලොව පුරා පැතිරුණු විශ්මිත ක්‍රමානුකූල පිළිවෙළ හා සුහදත්වය අප නිරීක්ෂණය කරන බැවින් ඔහුගේ නිර්මාණයන් තුළින් අපට අල්ලාහ්ගේ ඒකත්වය අවබෝධ කර ගත හැක. ක්ෂුද්‍ර පරමාණුවක සිට සුවිශාල සක්වල දක්වාවූ සියලු මැවීමක්ම

දම්වැලක් මෙන් එකිනෙකට සම්බන්ධ වී පවතින අතර ඒවා එකිනෙකට සහාය වෙමින් සහ සහයෝගී වෙමින් පවතින්නේය. බිලියන සංඛ්‍යාවකින් පවතින තාරකාවන්, ඒවා හා වෙනස් කක්ෂවල වේගයෙන් චලනය වුවද , ඒවා පොදුවූ හා කල්තියා කරන ලද නියෝගයකට අනුව යන්නා සේ සහ එකම මූලධර්මයක් මත රැඳී පවතින්නා සේ තනි එක්සත් භාවයකින් සංයුක්ත වන්නේය.

මෙම අද්විතිය ලෝකය එකම දෙවියාණන් වූ අල්ලාහ් විසින් නිර්මාණය කරන ලදී. එකම මූල බල ප්‍රභවයකින් මෙය ප්‍රාරම්භ කොට ඇති අතර ඒකීය වූ ද අද්විතීය වූ ද අල්ලාහ් ගේ විධානය හැර වෙනත් කිසිම අණක් ලොවේ ක්‍රියාත්මක කළ නොහැකිය.

තුන්වන පරිච්ඡේදය

ශුද්ධවූ කුර්ආනයෙහි අල්ලාහ් ගේ ඒකීය බව

ශුද්ධවූ කුර්ආනයේ ඉගැන්වීම් වල , ඒක දේවවාදය ඉතාම මූලිකවූ ප්‍රතිපත්තියකි.

මෙම මහානුභාව සම්පන්න, අද්විතීය පුස්තකය, සෑම සමාජයකම සමෘද්ධිය හා පරිපාලනය සඳහා අවශ්‍යවන්නාවූ නීතිරීති හා තොරතුරු පද්ධතියකින් සමන්විත වන්නේය. එය; වැඳුම් පිදුම් කිරීම, නීතිය, සදචාරය, දඬුවම් පමුණුවීම රාජ්‍ය කටයුතු පරිපාලනය කිරීම, සාමය, යුද්ධය, විද්‍යාව, යනාදිය ඇතුළුව සමාජයීය හා තනි පුද්ගල ජීවිතයේ සියලු අංගයන් හී දිව්‍යමය දර්ශනය හඳුන්වා දෙන අතර ඒවා විස්තරාත්මකව සාකච්ඡා කොට අපට අවශ්‍ය වන ප්‍රයෝජනවත් උපදෙස් හා නියෝගයන් ලබා දෙන්නේය. නමුත් සියලු නීති හා රෙගුලාසි; ඒක දේවවාදය, පවිත්‍ර චේතනාව සහ අල්ලාහ් කෙරෙහි වූ විශ්වාසය මත පදනම් වන්නේය. ශුද්ධවූ කුර්ආනයේ අරමුණ වී ඇත්තේ, සියලු ජනතාව සහ ඔවුන්ගේ සමාජයීය , තනි පුද්ගල, දේශපාලන, ආර්ථික, සදචාරාත්මක, පර්යේෂණාත්මක හා එවැනි ඕනෑම ක්‍රියාකාරකමක්ම සෑම අවස්ථාවකදීම මැවුම් කරුවාණන් වෙත අවධානය යොමු කරවීමක්ය. එම නිසා අල්ලාහ් සහ ඒකදේවවාදය පිළිබඳ වැඩි අවධාරණයක් යෙදීම කුර්ආනයේ සහජ ගුණාංගයකි.*

අල්ලාහ් පිළිබඳ වූ සාකච්ජාවේ විෂය ක්ෂේත්‍රය තුළ වූ කුර්ආනයේ පාඨයන් පහත සඳහන් පරිදි වර්ගීකරණය කර ඇත.

1. එක් ආකාරයකින් හෝ වෙනත් ආකාරයකින් අල්ලාහ්ගේ පැවැත්ම තහවුරු කරන පාඨයන්, මේවා ප්‍රධාන වශයෙන්ම, මැවුම්කරුවාණන් කෙරෙහි මිනිසාගේ අවධානය නත් අයුරින් යොමු කරවන්නාවූද තර්කනයන්ට සම්බන්ධ වූ ද වන්නේය.

මේවාහි ආකාර කිහිපයක් නම්:

(අ) මිනිස් ස්වභාවය.

(ආ) දිව්‍ය කරුණාවේ සළකුණු පෙන්වා දීම.

(ඇ) හේතුඵලත්ව මූල ධර්මය සහ විශ්වය දෘශ්‍යමාන වීම.

(ඈ) මිනිසා නිර්මාණය කිරීම.

(ඉ) ස්වභාව ධර්මයේ පවතින ප්‍රත්‍යක්‍ෂ වූ නීති නියමයන්.

(ඊ) ජීවයේ සිද්ධාන්තය.

2. අල්ලාහ් ගේ ඒකත්වය ස්ථිර කරන පාඨයන් -

අ. ඇතැම් ජනයා විසින් අල්ලාහ්ට ආරෝපණය කරනු ලබන සියලු ආකාර වල හවුල්කාරත්වය නිෂේධනය කරන පාඨයන්.

ආ. අල්ලාහ් ගේ පැවැත්ම සාධනීය ලෙස ඔප්පු කරන පාඨයන්

ඇ. මැවීම් වල විශිෂ්ඨ සළකුණු සහ ස්වභාව ධර්මයෙහි පවතින සුහදතාවය හා ක්‍රමානුකූල පිළිවෙළ පිළිබඳ සඳහන් කරමින්, මෙම අතිවිශාල වූ සැලැස්ම හා ප්‍රත්‍යක්‍ෂ කරගත නොහැකි වන්නාවූ ව්‍යුහය නිර්මාණය කිරීම හා පවත්වාගෙන යෑමෙහි සියලු මැවීම් වල මැදිහත් වීම නිෂේධනය කරන පාඨයන්.

ඈ. බහුදේවවාදයේ අහිතු විපාකයන් පිළිබඳ විස්තර කරන පාඨයන්,

කුර්ආනයේ සාකච්ඡා කෙරෙන ආකාරයට දේව ධර්ම විද්‍යාව වෙනම ශාස්ත්‍රීය විෂයයක් ලෙස ස්වාධීනව අධ්‍යයනය කළ හැකි පුළුල් ක්ෂේත්‍රයකින් සමන්විත වන බව ඒ පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් අපි සොයා ගන්නෙමු. කෙසේ වෙතත් සඳහන් කරන ලද එකිනෙක අවස්ථාවන් සඳහාවූ එක නිදර්ශනයක් පමණක් උපුටා දක්වමින් අප එය සීමා කරගන්නෙමු.

අ. මිනිසා සහ ඔහුගේ ස්වභාවය කෙරෙහි අවධානය යොමු කරමින් අල්ලාහ් ගේ පැවැත්ම ස්ථිර කරන පාඨයන්,

'අහස්ද පොළොවද නිර්මාණය කොට ඉර සහ හඳ (ඔවුන්ගේ නියමිත කාර්යයන් සඳහා) වසඟ කළේ කවරෙක් දැයි? ඔවුන්ගෙන් ඔබ ඇසුවෙහි නම් ඔවුහු අල්ලාහ් යයි පවසති.

(ශුද්ධ වූ කුර්ආනය 29:61)

''අහසින් ජලය පහළ කොට පොළොව මළ පසු එයට ජීවය දෙන්නේ කවරෙක් දැයි ඔබ ඔවුන්ගෙන් ඇසුවෙහි නම් ඔවුහු ස්ථිර වශයෙන්ම ''අල්ලාහ්'' යයි පවසති .''

(ශුද්ධවූ කුර්ආනය 29:6)

''පවසන්න, අහසින් සහ පොළොවෙන් ඔබට ආහාර සපයන්නේ කවරෙක්ද? හෝ ශ්‍රවණය සහ දර්ශනය පාලනය කරන්නේ කවරෙක්ද? මළ දෙයින් ජීවී දෙය ද ජීවී දෙයින් මළ දෙය ද ගෙන දෙන්නේ කවරෙක්ද ? කටයුතු ක්‍රමිකව පවත්වාගෙන යන්නේ කවරෙක්ද? එවිට ඔවුහු 'අල්ලාහ්' යයි පවසති. එවිට පවසන්න: අකුසලට එරෙහිව ඔබ ආරක්ෂා නොවන්නෙහිද?''

ශුද්ධවු කුර්ආනය (10:31)

මේ සියලුම පාඨයන්හී බහුදේවවාදීන් (මුෂ්රිකීන්) ගෙන් හෝ අල්ලාහ් ගේ පැවැත්ම පිළිබඳ ස්ථිර විශ්වාසයක් නැති අයගෙන්ම ප්‍රශ්න අසනු ලැබීම සැළකිල්ලට ගත යුතු කාරණයකි. කෙසේ වෙතත් කුර් ආනය මඟ පෙන්වනුයේ මෙලෙසයි.

ඔවුන්ගේ ස්වභාවයෙහි සහ හෘදය සාක්ෂියෙහි හඬ වෙත අවධානය යොමු කොට, පවතින සිරිත් විරිත් වල බලපෑමෙන් ඔවුන්ව මුදවාගෙන , මෙම විශ්මය ජනක ලෝකය මැව්වේ කවුරුන් දැයි ඔබ ඔවුන්ගෙන් ඇසුවෙහි නම් සැබැවින්ම ඔවුහු ''අල්ලාහ්'' යැයි පිළිතුරු දෙනු ඇත.

(ආ. දිව්‍ය බලයෙහි සහ ලෝක චමත්කාරයෙහි සළකුණු පෙන්වා දීම

ශුද්ධවූ කුර්ආනය පෙන්වා දෙන ආකාරයට අල්ලාහ් හඳුනා ගැනීමේ ක්‍රමය, සරල වූද තේරුම් ගැනීමට පහසු වූ ද ස්වාභාවික වූ ද සහජ උනන්දුව ඇතිකරන්නාවූ ද ක්‍රමයකි. මිනිසා ඔහුගේ ආත්මය සහ හෘදය සාක්ෂිය තුළින් අල්ලාහ් ව අවබෝධ කර ගැනීමට අපොහොසත් වන්නේනම්, දුෂ්කර තර්කනවලින් ද වලින් ද සංකීර්ණ වූ විවාද වලින් ද ඔහුට කිසිම යහපතක් නොවනු ඇත. තර්කන වල, විවාදවල පීඩනයෙන් ඔහුව නිශ්ශබ්ද තත්ත්වයකට

මෙම පරිච්ඡේදයේ අරමුණ වන්නේ, කුර්ආනීය පාඨයන් මගින් අල්ලාහ් ගේ පැවැත්ම ඔප්පු කිරීම නොව අල්ලාහ්ව දැන ගැනීම සඳහා වූ කුර්ආනීය ක්‍රමය දැන ගැනීමය. මෙම පුස්තකය; මුහම්මද් නබිතුමාණන්ගේ හා මෙම පුස්තකයේම වාර්තාමය සාක්ෂියක් වුවද, අල්ලාහ් කෙරෙහි විශ්වාසය හා ඉස්ලාමයේ වක්තෘන් නබිතුමාණන් ගේ දේව පණිවුඩය ළහාකර ගත් පුද්ගලයා කුර්ආනයේ සප්‍රමාණතා වලංගුභාවය පිළිගන්නා බැවිනි.

පත් කළ හැකි වුවද, අල්ලාහ් කෙරෙහි වූ විශ්වාසයේ ප්‍රතිඵල ලෙස හදවතෙහි උද්වන සැනසීම සහ සහනය මෙයින් නොලැබෙනු ඇත. ඉතා සරල හා තේරුම් ගත හැකි ක්‍රමයක් එනම්; ඔහුගේ සහජ විනිශ්චයන් සමඟ කරුණු ගෙනහැර දැක්වීමේ ක්‍රමය පෙන්වා දීමෙන් කුර්ආනය මිනිසාට අල්ලාහ් ව දැනගැනීමේ මාර්ගය උගන්වන්නේය. එය; විෂම චක්‍රය කෙරෙහි වූ විවාදය පදනම් නොකරන අතර ම මිනිසා ස්වභාව ධර්මයෙහි දකින බලවේගයේ විශිෂ්ඨ සළකුණු හා හෙළිදරව්ව පිළිබඳව වූ අධ්‍යයනයට සිත යොමු කරන ලෙස ඔහුට ආරාධනා කරයි. මෙම අධ්‍යයනය අනුගමනය කරමින්, මිනිසා හෘදයාංගවම සහ ඔහුගේ ස්වභාවයේ විනිශ්චයන්ට අනුකූලව මෙසේ පිළිගනියි.

''නිරන්තරයෙන්ම කාර්යය, හැකියාවේ සහ බලශක්තියේ ප්‍රතිඵලයකි.'' එවිට ඔහු අල්ලාහ්ව අවබෝධ කරගෙන, ඔහු දැනටමත් ස්වභාව ධර්මයෙහි දැක ඇති අල්ලාහ් ගේ චමත්කාරවූ ප්‍රදර්ශනය හා අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨත්වය හා බලය ඉදිරියේ සිරස නමා සප්තාංග නමස්කාරය කරනු ඇත.

සැබැවින්ම, සුවිශාල වූ අහස, එහි පවතින සියළු තාරකාවන්, සූර්යයා හා චන්ද්‍රයා සමඟ ද තාරකාවලට සම්බන්ධව පවතින ග්‍රහයින් සමඟ ද ඔසවා තබා ඇත්තේ කවරෙක්ද? ඉර හා සඳ අභිබවමින් ඒ දෙකට නියමිත කක්ෂ වල චලනය වීමට සැළැස්වූයේ කවරෙක්ද? එක අන්තයේ මිහිරි ජලය ද අනෙක් අන්තයේ ලුණු, ලවණ සහිත ජලය ද පවතින මුහුද ඔබ සමහර විට දැකී තිබිය හැකිය. එසේ පැවතියත් මේවා යම් නිශ්චිත ස්වභාවික නියමයන් හේතුවෙන් කිසි දිනක මිශ්‍ර නොවේ. මෙ ජලයන් දෙක අතර බාධාවක් ඇති කරමින් ස්වාභාවික නියමයන් ස්ථාපිත කර ඇත්තේ කුමන බලයක්ද?

පක්ෂියෙක් වාතය තුළින් චලනය වෙමින් ඉහළ අහසේ පියාසර කරයි. පක්ෂියා, වැටීමෙන් වළක්වා ගැනීම සඳහා වාතය උපයෝගී කරමින් පෘථිවියේ ගුරුත්වාකර්ෂණය, බලය භංග කරන තරංගයන් සහ චලනයන් ඇති කරයි. පැය කිහිපයකදී මහාද්වීපයන් එකට යා කරමින් සැහෙන දුරක් ගමන් කරන ශබ්දයට වඩා අධි වේගීවූ ගුවන්යානයක් විද්‍යාව කොතරම්

ශ්‍රේෂ්ඨ දෙයක් දැයි විදහා දක්වන අතර විද්‍යාව මිනිසාට ගමන් කිරීම සඳහා විශ්මිත නවීන පහසුකම් ප්‍රදානය කොට ඇත්තේය. පවිත්‍ර හා අහිංසක ස්වභාවය සතු මිනිසෙකු මේ සුන්දර, විශ්මිත හා බලවත් කුරුල්ලන්ව නිරීක්ෂණය කිරීමෙන් පසුව ඔවුන්ට පසුපසින් ඇති අල්ලාහ් ගේ ප්‍රබල හස්තය හඳුනා නොගැනීමට ද ඔහුගේ ආත්මයන් සහ හෘදය සාක්ෂිය තුළ අල්ලාහ් ව ප්‍රත්‍යක්ෂ කරගැනීමට අපොහොසත් වීමටද ඇත්තෙන්ම හැකියාවක් තිබිය හැකිද? සත්‍යය වන්නේ, මෙම යථාර්ථය යමෙකු වාචිකව නිෂේධ කළ ද හෘදයාංගවම සහ ඔහුගේ හෘදය සාක්ෂියෙහි ඔහු සැබැවින්ම එය පිළිගන්නේය. මෙය ශුද්ධවූ කුර්ආනය අල්ලාහ් කෙරෙහි මිනිසාගේ අවධානය යොමු කිරීම සඳහා උපයෝගී කරගන්නා එක් ක්‍රමයකි. උදහරණ වශයෙන් පාඨයන් කිහිපයක් උපුටා දක්වීම සෑහෙන්නේය.

''ඔබට පෙනෙන ටැඹක් නොමැතිව අහස එසෙව්වේ අල්ලාහ්ය. ඔහු බලයෙන් ඉතා දැඩිය. ඉර හා හඳ (ඔබට) යටහත් වීමට සැළැස්වූයේ ඔහුය. සෑම දෙයක්ම නියමිත කලකට ඒවාහී ගමන් කරගෙන යන්නේය. ඔබ ඔබගේ ස්වාමියාණන්ව මුණගැසීම ස්ථිර වනු පිණිස ඔහු සළකුණු පැහැදිලි කරමින් කටයුතු විධිමත් කරන්නේය.''(13:2)

''ඇත්ත වශයෙන්ම රාත්‍රිය දහවල තුළට පත් කරන්නේ ද දහවල රාත්‍රිය තුළට පත් කරන්නේ ද අල්ලාහ් බවත්; ඔහු ඉර හඳ (ඔබට) යටහත් වීමට සළස්වා ඇති බවත්; නියමිත කාලයක් දක්වා සෑම දෙයක්ම ගමන් කරන ආකාරයට ඔහු සැළැස්වූ බවත්, ඔබ කරන දේ අල්ලාහ් දන්නා බවත්; ඔබ නොදකින්නෙහිද?'' (31:29)

''ඔවුන්ට ඉහළින් පක්ෂීන් (ඔවුන්ගේ අත් තටු) දිගහැරීම ද ඒවා හැකිලීම ද ඔවුහු නොදකින්නෙහුද? පරම දයාබර දෙවියාණන් හැර ඔවුන් ව රඳවා තබාගන්නේ කවරෙක්ද? ඇත්තෙන්ම ඔහු සියලු දේ දන්නේය.'' (67:19)

''අහස හා පොළොව ඔහුගේ අණින් රඳවා තැබීම ඔහුගේ දෘෂ්ඨාන්තයන් නම් සළකුණු වලින් එකකි. ඔහු ඔබව එක

(තනි) ඇමතුමකින්, ඇමතූ විට පෘථිවියෙන් පිටත සිට ඔබ පැමිණෙන්නෙහිය.'' (30:25)

''දෙමුහුද ඇති කොට එය ස්වාධීනව ගලන්නට සැළැස්වූයේ ඔහුය. එකක්, පිපාසය සංසිඳුවන මිහිරි බවින් යුක්ත වන අතර අනෙක ලවණ බවින් තිත්ත වන්නේය. අපි ඒ දෙක අතර බාධකයක් ද ඇති කළෙමු.'' (25:53)

''පොළොව ව්‍යාප්ත කර එහි ස්ථිර වූ කඳු හා ගංගා ස්ථාපිත කළේ ඔහුය. සියලු පළතුරු වර්ග යුගල වශයෙන් හටගැන්වූයේය. ඔහු රාත්‍රිය දහවලින් ආවරණය කරන්නේය. ස්ථිර වශයෙන්ම මෙවාහී, කල්පනා කරන ජනයාට සළකුණු තිබෙන්නේය.'' (13:3)

'' එකිනෙකට යාබ ද භූමි භාග ද මිදි වතු ද, කුඹුරුද , ශාඛා අතු සහිත වූද, ශාඛා අතු රහිත වූ ද ඉඳි ගස් ද එකම ජලයෙන් පෝෂණය කෙරෙන්නේය. ඒවාහී පලදාව සමහරෙකින් සමහරෙක් විශිෂ්ඨ කළෙමු. ඇත්තෙන්ම අවබෝධ කරගන්නා ජනයාට එහි සළකුණු තිබෙන්නේය.'' (13:4)

''ඔහු ගවයින් වැනි සතුන් සඳහා (තණ යනාදී) ශාකමය ආහාර හට ගැන්වූයේය. එය වියළුණු විට දූවිලි වර්ණ ගැන්වෙන්නේය.'' (87:4-5)

'' අල්ලාහ් සියලු දෙයෙහි මැවුම්කරුවාණෝය.'' (13:16)

'' අහස් හිද පොළොවෙහි ද නිර්මාණය ද ඔබගේ භාෂාවන් හි හා වර්ණයන් හී විවිධත්වයද ඔහුගේ (දෘෂ්ඨාන්තයන්) සළකුණු වලින් එකකි.'' (30:22)

''පොළොව මත ඇති සැමදේ, ඔබ වෙනුවෙන් නිර්මාණය කළේ ඔහුය''(2:29)

''අහස් හා පොළොව, සත්‍යයෙන් නිර්මාණය කළේ ඔහුය.''(6:73)

''නිර්මාණය කොට පරිපූර්ණ කරන්නාවූද, ප්‍රමාණයන් අනුව (ඒවා) සළස්වා (ඔවුන්ගේ අරමුණ කෙරෙහි ඔවුන්ට) මඟ පෙන්වන්නාවූ ඔබගේ අති ශ්‍රේෂ්ඨ වූ ස්වාමියාණන් ගේ නාමය සුවිශුද්ධ කරන්න.''(87:1-3)

''ඔහු ඔබගේ ස්වාමියාණන් වන අල්ලාහ්ය; ඔහු හැර අන් දෙවියෙක් නැත; සියලු දෙයෙහි නිර්මාපකයාය. එහෙයින් ඔහුටම නමදින්න. සියලු දෙයෙහි භාරය ඇත්තේ ඔහු වෙතය.'' (6:103)

''තවද ඔහු සියලු දේ මැව්වේය. පසුව ඒවා සඳහා වූ සැලැස්ම නියම කළේය.'' (25-2)

''ඔහු අල්ලාහ්ය; නිර්මාපකයාය; සාදන්නා; හැඩයන් නිර්මාණය කරන්නා;''(59:24)

මිනිසා නිර්මාණය කිරීම පිළිබඳව සඳහන් කිරීම මගින් අල්ලාහ් කෙරෙහි මිනිසාගේ අවධානය යොමු කරවන්නාවූ පාඨයන් කොටස් දෙකකට බෙදා ඇත. මින් පළමුවැන්නෙහි තේමාව, මිනිසා නිර්මාණය කිරීම පිළිබඳව වන අතර දෙවැන්නෙහි තේමාව වන්නේ මිනිසාව නිර්මාණය කිරීමේ ගුණයයි. මෙම විශ්මයජනක නිර්මාණය බිහිවීම සහ මෙම චමත්කාරජනක මැවීම ගැන සඳහන් කිරීම මගින් මිනිසාගේ අවධානය, මුලු මහත් නිර්මාණයෙහි ස්වාමියා වශයෙන් නිසි ලෙස හැඳින්වෙන ඔහුගේ නිර්මාපකයාණන් වෙත යොමු කිරීම සඳහා දෙවන කොටසට අයත් වන පාඨයෙන් බැඳී සිටින්නේය. එය එසේ වන්නේ මිනිසාගේ හදවතෙහිද හෘද සාක්ෂියෙහිද පවතින අල්ලාහ් කෙරෙහි වූ විශ්වාසයට පුනර්ජීවයක් ලබාදීම සඳහාය.

පළමු කොටසට අයත් වන පාඨයන්; මිනිසා මැවීම, ඍජුවම අල්ලාහ්ට ආරෝපණය කරයි. මෙම ලොවේ ඍජුවම අල්ලාහ් ට ආරෝපණය කරයි. මෙම ලොවේ කුඩා අංගයක් වන මිනිසාව මැවීමේදී, මුලු මහත් විශ්වය මැවීම සඳහා වූ නියමයන්, අනිවාර්යයෙන්ම අනුගමනය කරනු ලැබිය යුතු බව ප්‍රත්‍යක්ෂ කරුණකි. විශ්වය අල්ලාහ් විසින් මවනු ලැබ ඇති බැවින් මිනිසා ද ඔහු විසින් මවනු ලැබ තිබිය යුතුය. අපි නිදසුන් කිහිපයක් පහතින් උපුටා දක්වන්නෙමු.

''ඔබව නිර්මාණය කොට ආහාර සැපයුයේ අල්ලාහ්ය. ඔබව මරණයට පත් කරන්නේ ඔහුය. පසුව ඔබට ජීවය ලබා දෙන්නේ ද ඔහුය.''(30:40)

"මනුෂ්‍යයෙනි! (නපුරට එරෙහිව) ඔබ ආරක්ෂා වීම පිණිස ඔබ ද ඔබට පෙර සිටියවුන් ද මැවූ ඔබගේ ස්වාමියාණන්ට නමදින්න." (2:21)

"මේ පොළොවෙහි ඔබ බෝව් (සංඛ්‍යාවෙන්) වැඩිවීමට සැළැස්වූයේ ඔහුය. ඔහු වෙතම ඔබව එක් රැස් කරනු ලැබේ." (23:79)

"අල්ලාහ් නිර්මාණයන් මූලාරම්භ කරන්නේය. පසුව එය ප්‍රත්‍යුත්පාදනය කරන්නේය. ඔබ නැවත ඔහු වෙතම පමුණුවනු ලබන්නෙහිය." (30:11)

"ඔබව නිර්මාණය කොට අංගසම්පූර්ණ කොට ඔබට ඔහු මනා ගැලපීමක් ද ඇති කළේය" (82:7)

"ඔවුහු කිසියම් දෙයක් නොමැතිව නිර්මාණය කරනු ලැබුවාහුද? නැත්නම් ඔවුහු නිර්මාපකයෝ වන්නෝද" (52:35)

සර්ව බලධාරී මැවුම්කරුවාණන් කෙරෙහි මිනිසාගේ අවධානය යොමු කරවමින්, ඔහුගේ මැවීමෙහි යථාර්ථය හඳුනාගැනීම සඳහා මිනිසාගේ මැවී මෙහි තත්ත්වය පරීක්ෂා කරන පාඨයන් දෙවන කොටසට ඇතුළත් වන්නේය. මෙම පාඨයන්ට අනුව මිනිසාව මැවීම ; ක්‍රමානුකූල ක්‍රියාවලියකි. එහිදී ඔහුව මූලාරම්භයේදීම "තෙත පොළවේ උත්පාදනයකින්" හැඩ ගස්වන ලදී. පසුව ඒවා කළලයේ විකාසනය මුලුමනින්ම පරිණත වූ ළදරුවෙක් වශයෙන් උපදින තෙක් පැහැදිලි කරන්නේය. අවසාන වශයෙන් ඒවා මෙම විශ්මිත මැවීම (දෙවියන් වහන්සේ) ඔහුගේ අධිෂ්ඨානයේ සහ බලයෙහි දෘෂ්ඨාන්තයන් නම සළකුණු වලින් එකක් බව නිගමනය කරයි. මෙම අපූරු වූ ද අලංකාර වූ ද නිර්මාණය සුහද සංයෝජනයෙන් යුක්ත වූද නිර්මාණය මැව්වේ අල්ලාහ් වන ඔහුය. මේ කොටසට අයත් වන පාඨයන් කිහිපයක් අපි පහතින් සඳහන් කරමු.

"ඇත්තෙන්ම අපි මිනිසාව මැටියෙහි වූ සාරයෙන් නිර්මාණය කොට කුඩා ජීවී බීජයක් වන ශුක්‍රාණුවක් වශයෙන් පත් කොට ස්ථිර වූ හා නිසල වූ ස්ථානයක තැබුවෙමු. පසුව එම ජීවී බීජය ඝන ලේ කැටියක් කළෙමු. පසුව එම ලේ කැටිය මාංශ පිණ්ඩයක් කළෙමු; පසුව එම මාංශ පිණ්ඩය (තුළ) අස්ථීන්

කළෙමු. පසුව එම අස්ථීන්, මාංශයෙන් ආවරණය කළෙමු; පසුව එය වෙනම නිර්මාණයක් ලෙස වැඩීමට සැලැස්වීමු; සියළු ප්‍රශංසා ශ්‍රේෂ්ඨ මැවුම්කරුවාණන් වූ අල්ලාහ්ටමය.'' (23:12-14)

''මනුෂ්‍යයෙනි! ඔබ නැවත නැගිටුවීම පිළිබඳ සැකයෙන් සිටින්නේ නම්; ඇත්තෙන්ම අපි ඔබලාව, දූවිල්ලෙන් නිර්මාණය කොට, කුඩා ජීවී බීජයක් වන ශුක්‍රාණුවක් වශයෙන් ද පසුව ඝන ලේ කැටියක් වශයෙන් ද, පසුව මූර්තිමත් වූ ද මූර්තිමත් නොවූ ද මාංශ පිණ්ඩනයෙන් ගෙන් නිර්මාණය කළෙමු. මෙය ඔබට පැහැදිලිකර දීමටය. අප සිතූ දෙය නියමිත කලක් දක්වා ගැබ්හි පිහිටන්නට සලස්වන්නෙමු; පසුව ළදරුවන් බවට ජනනය කරවන්නෙමු; පසුව ඔබ ඔබේ පරිණත භාවයට ළඟා වනු ඇත. '' (22:5)

''අපි ඔහුව කුඩා ජීවී බීජයක් (වූ ශුක්‍රාණුවෙන්) නිර්මාණය කළ බව මිනිසා නොදන්නෙහිද? '' (36:77)

''ඔහු ඔබව දූවිල්ලෙන් නිර්මාණය කිරීම ද පසුව ඔබ සැම තැන පැතිරී සිටීම ද ඔහුගේ සාධකයයි.'' (30:20)

(ඉ) ස්වභාව ධර්මයේ පවතින ක්‍රමික පිළිවෙළ තුළින්

අල්ලාහ් ගේ පැවැත්ම තහවුරු කිරීම සඳහා කුර්ආනය ඉදිරිපත් කරන තවත් ක්‍රමයක් වන්නේ, ස්වභාව ධර්මයේ පවතින ක්‍රමික පිළිවෙල සහ සුභදතාවයයි. ''ක්‍රමානුකූල පිළිවෙළ'' යන මාතෘකාව යටතේ දැනටමත් සඳහන් කර තිබෙන ආකාරයට ක්‍රමික පිළිවෙළ විවිධ වස්තුවල නිරීක්ෂණය කළ හැකි විය යුතුය. එමනිසා මෙම වර්ගයට අයත් පාඨයන් ජීවීන්ගේ මැවීම සඳහා වූ මූලධර්මයන් ගැන සිත යොමු නොකරන අතර එමගින් අප ඒවාහී දකින ක්‍රමික පිළිවෙළ හා සුභදතාවය ඉලක්ක කරගෙන කරුණු ඉදිරිපත් කෙරේ. එක් ජීවියෙකුගේ මැවීම අත්‍යවශ්‍යයෙන්ම සිදු කරනු ලැබ ඇත්තේ, අනෙක් ජීවියෙකුගේ මැවීම සහ අවශ්‍යතාවය සඳහා වන බව මෙම කණ්ඩායමට අයත් පාඨයන් වලින් පෙන්නුම් කෙරේ.

නිදසුනක් වශයෙන් ස්වභාව ධර්මයේ මැවීමක් වන මානව

වර්ගයා ගැන සිතා බලන්න. කුර්ආනයට අනුව, ඔහුගේ සියළු අවශ්‍යතාවයන් අනෙක් නිර්මාණයන් මගින් සපුරාලනු ලබන බවද; මානව වර්ගයාගේ මැවීම සහ ඉර, හඳ, අහස, වැස්ස වැනි අනෙකුත් මැවීම් අතර විශ්මිත වූ සුහදතාවයක් පවතින බව ද; පෙන්වා දී ඇත. එනම්: මෙම සුහදතාවයට සහ ක්‍රමික පිළිවෙළට අනුකූලව මිනිසා, අනෙකුත් නිර්මාණ වලින්, තමාගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ලාභ ප්‍රයෝජන ගැනීමට සමත් වන්නේය. පෘථිවිය, ජලය ලබාගෙන එහි ගැඹුරටම ගලාගෙන යෑමට ඉඩ දෙන්නේය. බීජයන් සහ ධාන්‍යයන් වර්ධනය වීම සඳහා අවශ්‍ය වන සුදුසුම ස්ථානය පෘථිවියය. කළලයක් වර්ධනය වීම සඳහා සුදුසුම ස්ථානය ගර්භාෂයයි. පෘථිවිය මිනිසා ජීවත්වීම සඳහා සුදුසු වන අතර අවසාන වශයෙන්; ඉර, හඳ, සුළඟ, වලාකුළු, සහ වැස්ස ශාක වල වර්ධනයට ක්‍රියාශීලී සාධකයන් වන්නේය. මෙ කොටසට අයත් පාඨයන්ගෙන් තෝරාගත් නිදසුන් කිහිපයක් පහතින් දැක්වේ.

''මහා කරුණික දෙවියන් වහන්සේ ගේ නිර්මාණයෙහි ඔබ කිසිම නොගැලපීමක් නොදකින්නෙහිය. නැවත වරක් ඔබ බැල්ම යොමු කරන්න. කිසියම් හෝ ක්‍රමානුකූල නොවන බවක් ඔබ දකින්නෙහිද? '' (67:3)

'' ඔබට පෘථිවිය පහසු සෞම්‍ය ලෙස කළේ ඔහුය. එම නිසා එහි නන් දෙසට ගොස් ඔහු සම්පාදනය කරන බොජුන් අනුභව කරන්න. මරණයෙන් පසු ආපසු පැමිණිය යුතු වන්නේ ඔහු වෙතටමය.'' (67:15)

'' අල්ලාහ් වලාකුළු පාවෙන්නට සළස්වා මෙහෙයවන බවත්, පසුව ඒවා එකට රැස්කොට, ගොනු කරන බවත් ඔබ නොදැක්කෙහි ද ? ඒවා අතරින් වැස්ස පැමිණෙන බව ඔබ දකින්නෙහිය. කඳු (මෙන් වූ) වළාකුලු වලින් ඔහු හිම වැස්ස පහළ කරන්නේය. එයින් ඔහු සිතූ කෙනෙකුට හිංසා කරන්නේය. එයින් ඔහු සිතූ කෙනෙකුව වළක්වන්නේය. එහි විදුලි ආලෝකය බොහෝ විට දර්ශනය පැහැර ගන්නේය.'' (24:43)

(මෙම පාඨය වළාකුළු, වැස්ස, හිම වැස්ස හා විදුලි කෙටීම විස්තර කරන්නේය.)

"නිසරු බිමට ජලය ලබාදී මොවුන්ද මොවුන්ගේ ගවයින් ද අනුභව කරන්නා වූ අස්වැන්න ද අපි හටගන්වන්නෙමු'යි ඔවුහු විමසිලිමත්ව නොබලන්නෙහුද? එසේ නම් ඔවුහු නොදකින්නෝද?" (32:27)

(මෙම පාඨය ක්‍රමානුකූල පිළිවෙළ ද අන්‍යෝන්‍ය සුහදතාවය ද ජලය, පොළොව, අස්වැන්න, සිවුපාවුන් සහ මානව වර්ගයා අතර පවතින්නාවූ සැහෙන සම්බන්ධතාවය ද දැනුම් දෙන්නේය)

"අල්ලාහ් අහසින් ජලය පහළ කොට එය පොළොවේ උල්පත් වල ගමන් කරවා නානා වර්ණයෙන් යුත් පැළ හටගන්වන්නේය. පසුව එය කහ වර්ණයෙන් යුක්තව දකින අයුරින් වියළී යන බව ඔබ නොදකින්නෙහිද? පසුව ඔහු එය කැබලි වලට කැඩී සුන් වූ දෙයක් බවට පත් කරන්නේය. ඇත්තෙන්ම නුවණැතියනට මෙහි මෙනෙහි කිරීමක් ඇත්තේය. (39:21)

(මෙම පාඨය ජලය හා කෘෂිකර්මය අතර ද ස්වාභාවික ක්‍රියාදමය හා ශාක ජීවිතයේ පවතින පැහැදිලි පිළිවෙළ අතර ද පවතින නිසි සම්බන්ධතාවය විස්තර කරයි.)

(ඒ) ජීවයේ සිද්ධාන්තයන් තුළින්

අල්ලාහ් කෙරෙහි මිනිසාගේ අවධානය යොමු කිරීම සඳහා කුර්ආනය, ජීවිතයේ පරිමාණයන් අවධාරණය කර පෙන්වයි.

ජීවිතය අභිරහස්ම වස්තුවකි. විද්වතුන්ට අනුව නිර්මාණයක් සජීවී වීමට මිලියන සංඛ්‍යාන කාරකයන් සහ තත්ත්වයන් ඒකරාශී විය යුතුය. එය ඇත්තෙන්ම, සෑම තනි වස්තුවක්ම බිහි වීම සඳහා යම් නිශ්චිත කාරකයන් හි සහ තත්ත්වයන් හි සහභාගීත්වය අවශ්‍ය වන අතර ජීවිතය යන සිද්ධාන්තය සඳහා අවශ්‍ය වන සාධකයන් ඒවාහී හේතුක ඒකරාශී වීම නිශ්චිත වශයෙන්ම පිළිගත නොහැකි තරමට විශිෂ්ඨ වන්නේය. කුර්ආනය අල්ලාහ් ගේ පැවැත්ම ගැන සඳහන් කරන සෑමවිටම ජීවිතය නම් සිද්ධාන්තය පිළිබඳ අවධාරණය කරන්නේය. අල්ලාහ්ව හඳුන්වාදීමේදී ඉබ්‍රාහීම් මෙසේ පවසයි.

''ජීවය දෙන්නා වූ ද මරණයට පත්කරන්නා වූ ද ඔහු මගේ ස්වාමියාය''(2:258)

ජීවයේ පරිමාණයන් සඳහන් කරමින් පාඨයන් කාණ්ඩ දෙකක් අල්ලාහ් ගේ පැවැත්ම තහවුරු කරන්නේය. එක් කාණ්ඩයක් මිනිසාගේ ජීවය ගැන පමණක් අවධානය යොමු කොට සියළු තර්කනයන් ඒ මත ගොඩ නගයි. අනෙක් කාණ්ඩය පොදුවේ ජීවය ගැන අවධානය යොමු කරයි. එවැනි පාඨයන් දෙවර්ගයම පහත සඳහන් උපුටනයන් වල දැක්වේ.

''ජීවය දෙන්නා වූ ද මරණයට පත් කරන්නා වූ ද ඔහු මගේ ස්වාමියා යැයි ඉබ්‍රාහිම් පැවසූ කල් හී .....'' (2:258)

''ඔබ අල්ලාහ් කෙරෙහි විශ්වාස නොකරන්නේ කෙසේද? අප්‍රාණීව සිටි ඔබට ඔහු පණ දුන්නේය. නැවත ඔහු ඔබව මරණයට පත් කරනු ඇත; පෙරළා ඔබට ජීවය ලබාදෙනු ඇත. තවද නැවත ඔබ ඔහු වෙත පමුණුවනු ලබන්නෙහුය.''(2:28)

''ඔහු හැර දෙවියෙක් නැත. ජීවය දෙන්නේද මරණය පමුණුවන්නේ ද ඔහුය. ඔහුගේ ස්වාමියා ද පෙර සිට ඔබගේ පියවරුන් ගේ ස්වාමියා ද ඔහුය.''(44:8)

'' ඔබට ජීවය ලබාදුන්නේ ඔහුය; පසුව ඔහු ඔබට මරණය පමුණුවන්නේය. පසුව (නැවත) ඔබට ජීවය ලබාදෙන්නේය.'' (22:66)

'' අප්‍රාණී දෙයින් ජීවය ලබාදෙන්නේ ඔහුය; ඔහු ජීවී දෙයින් අප්‍රාණී දෙය ලබාදෙන්නේය. පොළොව මළ පසු එයට ජීවය ලබාදෙන්නේය. මෙලෙස ඔබ උපද්දනු ලබන්නෙහිය.'' (30:19)

'' බිය හා අපේක්ෂාව උපදින ලෙස ඔහු ඔබට විදුලි කෙටීම දැක්වීම ඔහුගේ දෘෂ්ඨාන්තයන් නම් සළකුණු වලින් එකකි. තවද ඔහු අහසින් වැස්ස පහළ කොට, පොළොව මළ පසු එයින් ජීවය ලබාදෙන්නේය. ඇත්තෙන්ම එයින් අවබෝධ කරගන්නන්ට සළකුණු තිබෙන්නේය. '' (30:24)

(උ) විශ්වයේ බිහිවීම

මිනිසා ඉදිරියේ එක් යථාර්ථයක් ඇත. එය විශ්වයේ බිහිවීමයි. ලෝකය එක්කෝ කලින් සිටම පැවතුණු දෙයක් විය යුතුය. නැත්නම් එය නිර්මාණය කරන ලද්දක් විය යුතුයි. දෙවනුව සඳහන් කාරණයේදී එය ආකස්මික අහඹුවක් ලෙස පැවැත්මක් ලබාගත්තේ හෝ නිර්මාපකයෙකු විසින් නිර්මාණය කරන ලද්දක් විය හැකියි. වැඩිදුරටත් දෙවනුව එයම හෝ බලවේගයක් හෝ එයට පරිභාහිරවූ යම් දෙයක් විය හැකිය.

ලෝකය කලින් සිටම පැවතුණු දෙයක් යන කාරණය, දැනටමත් විද්‍යාව මගින් අභිශූන්‍ය කර ඇත. ජීව භෞතික විද්‍යා මහාචාර්යවරයෙකු වන ෆ්රෑන්ක් ඇලන් මෙසේ පවසයි: "ලෝකය අඛණ්ඩ විපර්යාසයන්ට ලක්වෙමින් පවතින තත්ත්වයක තිබෙන බවත් එහි ප්‍රතිඵලය වශයෙන් පවතින සෑම දෙයක්ම, පරිභෝජනය සඳහා කිසිම ශක්තියක් ඉතිරි නොවන අඩු උෂ්ණත්වයටම පත්වනු ඇතැයි තාපගතික මූලධර්මය ඔප්පු කොට ඇත. එවැනි තත්ත්වයක් යටතේ ජීවය සිදු විය නොහැකි දෙයක් වනු ඇත. ලෝකයට ආරම්භයක් නොතිබුනේ නම් හා එය කලින් සිටම පැවතුණු දෙයක් නම් එවැනි උදාසීන හා අප්‍රාණික තත්ත්වය මීට බොහෝ කලකට පෙර සිදුවී තිබිය යුතුය. නමුත්, දැවෙන සූර්යයා, දීප්තිමත් තාරකාවන් සහ ජීවය ලබාදෙන පෘථිවිය යනාදිය, ලෝකය බිහිවීම අතීතයේ යම් නිශ්චිත කලෙක සිදුවූ බවට, සත්‍යවාදී වූ සාක්ෂි වන්නේය. එම නිසා එය නිර්මාණය කරන ලද්දක් විය යුතුයි."

දෙවැනි කල්පිතය, එනම්; ලෝකය ස්වියවම බිහිවීම පිළිබඳ ආකල්පය ද ප්‍රත්‍යක්ෂ වී ඇත. මන්ද ශූන්‍ය හා නොපවතින බවෙන් හටගත හැක්කේ ශූන්‍යය පමණකි. තවද මෙම කල්පිතය පොදු මූලධර්මය වන හේතුඵලත්වය තහවුරු නොකරන්නේය. ඒකාන්ත තීරණයකට එළඹෙන මෙම මූලධර්මය පිළිගැනීමෙන් අපි ස්වයං පැවැත්ම මත පදනම් වූ සියලු උපකල්පනයන් දෝෂ සහිත බව පෙන්වා හෙළා දැක ඇත්තෙමු.

තුන්වන කල්පිතය, එනම්; ලෝකයේ නිර්මාපකයා ලෝකයම

වන වග ද සිදුවිය නොහැක්කෙකි. ඊට හේතුව එය බිහිවීමට පෙර එය නොපැවැතුණු දෙයකි. නොපවතින්නාවූ යම් දෙයකට වෙනත් යමක් නිර්මාණය සඳහා බලපෑමක් කිරීමක් හෝ මගපෑදීමක් හෝ කොහේත්ම සිදුකළ නොහැක්කකි. දර්ශන විද්‍යාවේ පවා, නිතරම හේතුව ප්‍රතිඵලයට කලින් සිදුවන්නේය. වෙනත් වචන වලින් පවසන්නේ නම් හේතුවට ප්‍රතිඵලය කෙරෙහි ප්‍රමුඛතාවයක් තිබෙන්නේය. ලෝකය නිර්මාණය වීමෙහි පාදක වූ හේතුව ලෝකයම බව අප සළකන්නේ නම් ''ලෝකය එම ලෝකයේම නිර්මාණයෙහි හේතුව වන බැවින් එය කෙරෙහිම එයට ප්‍රමුඛත්වයක් තිබිය යුතුය. එසේ වන්නේ එය සඳහා වූ හේතුවද එයම වන බැවිනි.'' යන අර්ථ ශූන්‍ය තර්කය ද අවසානයේදී පිළිගත යුතුය. එනම්; 'ලෝකය; යම් හේතුවක ඵලයක් වශයෙන් බිහිවී තිබිය යුතු අතර එම හේතුව එයට පසුව පවතින්නක් ද වන්නේය.' මෙය ද අර්ථ ශූන්‍ය උපකල්පනයකි.

දැන් අපට ඉතිරිව ඇත්තේ එකම කල්පිතයකි. එනම් ලෝකය, එයට පරිබාහිරවූ දෙයකින් නිර්මාණය කරන ලද බවයි. මෙ කරුණ සම්බන්ධයෙන් ශුද්ධවූ කුර්ආනය සරල හා විස්තරාත්මක වචන වලින් පැහැදිලි කරයි. විශාල ප්‍රමාණයක උපකල්පනයන් අර්ථ ශූන්‍ය බව පෙන්වීම සඳහා කුර්ආනය; ඒවාහී පැහැදිලි අර්ථ ශූන්‍ය භාවය සඳහන් කරමින් කොටසක් ද ඥනය සහ මිනිසා පවිත්‍ර මිනිස් ස්වභාවයෙහි සහයෝගය පතමින් කොටසක් ද තම කාර්යයට යොදා ගන්නේය. නිදසුනක් වශයෙන් මිනිසා මැවීම පිළිබඳව එය මෙසේ ප්‍රකාශ කරයි. ''ඔවුහු කිසිම දෙයක් නොමැතිව නිර්මාණය කරනු ලැබුවෝද? නැත්නම් ඔවුහු නිර්මාපකයෝද?''(52:35)

මෙවා මුළු මහත් මැවීම පිළිබඳ විෂය ගැන අප සඳහන් කර ඇති උපකල්පනයන් හතරින් දෙකකි. මෙයින් නොපැවැත්මෙන් ස්වියව මිනිසාට පැවත්මක් ලබාගැනීමට නොහැකි අතර ඔහුට ඔහුගේම නිර්මාපකයා වීමටද නොහැකි බව තහවුරු වෙයි. කුර්ආනය එවැනි උපකල්පනවල අර්ථ ශූන්‍ය බව ඒවා විසින්ම ඔප්පු වීමට ඉඩ හරින අතර ඒ අවස්ථාවේදීම සත්‍යය සොයා ගැනීම සඳහා මිනිසාගේ බුද්ධියට ආරාධනා කරයි.

ඒක දේවවාදය පිළිබඳ නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

(අ) අල්ලාහ්ට හවුල්කරුවෙකුගේ පැවැත්ම නිෂේධ කරන පාඨයන්:

''ඇත්තෙන්ම සත්‍ය පැහැදිලි කිරීම මෙයයි. තව ද අල්ලාහ් හැර දෙවියෙක් නැත. ඇත්තෙන්ම අල්ලාහ් බලසම්පන්නය; නුවණැතිය.'' (3:61)

''තවද යමෙක් අල්ලාහ් හා සමාන කරන්නේද ඔහු මහත්වූ පාපයක් කරන්නේය.''(4:48)

''යමෙක් අල්ලාහ් හා සමානව යම් දෙයක් ගන්නේද ඇත්තෙන්ම ඔහු ඈත්වූ දුර්මාර්ගයන් හි නොමග යන්නේය.''(4:116)

''තවද ඔවුහු ජින්වරුන් අල්ලාහ්ට සමාන කරන්නෝය. ඔවුන්ව මැව්වේ ඔහුය. නොදැනීමෙන් ඔවුහු ඔහුට පුත්‍රයන් ද දූවරුන් ද වැරදි ලෙස ආරෝපණය කරන්නාහ. ඔහු සුවිශුද්ධය; (ඔහුට) වර්ණනා කරන දැයින් ඔහු අති ශ්‍රේෂ්ඨය.''(6:101)

''අල්ලාහ් අන් දෙවියෙකු හා සමානව නොගන්න. එසේ කළහොත් ඔබ ගර්හිත හා නොසළකා හරිනු ලැබූ කෙනෙක් වන්නෙහිය.'' (17:22)

(ආ) අල්ලාහ් ගේ ඒකත්වය ප්‍රකාශ කරන පාඨයන්,

''ඔහු හැර (අන්) දෙවියෙකු නැතැයි අල්ලාහ් සාක්ෂි දරන්නේය. මලාඉකාවරු (න් වන සුරදූතය)න් ද දැනුමැත්තන් ද (එසේම සාක්ෂි දරති. යුක්ති සහගතව ඔහුගේ මැවීම් පාලනය කරන ඔහු හැර දෙවියෙක් නැත. ඔහු බලසම්පන්නය; ඥනවන්තය.''(3:17)

''ඔබගේ දෙවියා එකම දෙවියන් වහන්සේය. ඔහු හැර තව දෙවියෙක් නැත. ඔහු මහා කාරුණිකය. පරම දයාබරය.'' (2:163)

''අල්ලාහ්; ඔහු හැර දෙවියෙක් නැත. ඔහු සදතනිකයි; ස්වියව පවතින්නාය; ඔහු මත සියල්ල රැඳී පවතින්නේය.'' (2:255)

ඔබගේ දෙවියා එකම දෙවියන් වහන්සේය. එහෙයින් ඔහුටම අවනත වන්න.'' (22:34)

''පවසන්නඃ ඔහු අල්ලාහ්ය. කේවල (ඒකෝ) ය.'' (112:1)

''ඔහු ඔබ ගේ ස්වාමියාණන් වන අල්ලාහ්ය. ඔහු හැර දෙවියෙක් නැත. සියලු දෙයෙහි නිර්මාපකයාය. එහෙයින් ඔහුටම නමදින්න. සියලු දෙයෙහි භාරය ඇත්තේ ඔහු වෙතය.'' (6:103)

'' ඔහු අල්ලාහ්ය. ඔහු හැර දෙවියෙක් නැත. මෙලොව පරලොව සියලු පැසසුම් ඔහුටමය. විනිශ්චයේ බලය ඇත්තේ ඔහුටය. ඔහු වෙතම ඔබ නැවත පමුණුවනු ලබන්නෙහිය.'' (28:70)

(ඇ) ලෝකය නිර්මාණය කිරීමෙහි මැදිහත්වන කිනම් හෝ දෙයක් නිෂේධ කරන පාඨයන්.

ස්වාභාවික සිදුවීම් සාධාරණීකරණය කිරීම සඳහා බහු දේවවාදී උපකල්පනය අවශ්‍ය නොවන බව අනෙකුත් සමහර පාඨයන් පෙන්වා දෙයි. ස්වභාව ධර්මය ගැන ද එහි පවතින මනා පිළිවෙළකට සැකසුණු හා විශ්මිත සිද්ධාන්තයන් ගැන ද කල්පනා කරමින්, මිනිසා අල්ලාහ් ගේ පැවැත්ම අනිවාර්යයෙන් පිළිගෙන ඇති බව ප්‍රත්‍යක්ෂ වූ දෙයකි. ස්වභාව ධර්මය සහ එහි සිදුවීම් සාධාරණීකරණය කිරීම සඳහා අවසානයේදී ඔහුට අල්ලාහ් කෙරෙහි විශ්වාසය තැබීම හැර කිරීමට වෙනත් යමක් නොමැත. අද්විතීය වූ අල්ලාහ්ට හවුල්කරුවෙක් ආරෝපණය කරන්නාවූ බහු දේවවාදය විශ්වාස කිරීම ඔවුනට තුඩු දුන්නේ, කුමන ස්වාභාවික සිදුවීමක් හෝ ගැටලුවක් සාධාරණීකරණය කිරීමටදැයි පැහැදිලි කරන ලෙස, දැන් අපි අභියෝග කළ යුත්තෙමු. නිසැකයෙන්ම ඔවුන්ට එවැනි අවශ්‍යතාවයක් හැඟී නොමැත. ඔවුන්ගේ උපකල්පනය අනුකරණය සහ චාරිත්‍රයන් මත පදනම් වී ඇත්තේය. ශුද්ධවූ කුර්ආනය මෙසේ පවසයි.

''අහස්ද පොළොවද නිර්මාණය කොට ඔබට අහසින් ජලය පහළ කළේ ඔහුය. පසුව එයින් පියකරු වතු වැවෙන්නට සැළැස්වීමු. එහි ගස් වැල් වැඩෙන්නට සැලැස්වීම ඔබට කළ නොහැක්කෙකි. අල්ලාහ් සමග (වෙනත්) දෙවියෙක් සිටින්නේද? නැත. ඔවුහු (නිසි මාර්ගයෙන්) ඉවත්ව යන ජනතාවයි.'' (27:60)

(මෙම සිද්ධාන්තය සාධාරණීකරණය කිරීමට වෙනත් දෙවියෙක්ව උපකල්පනය කිරීමේ අවශ්‍යතාවයක් තිබෙන්නේද?)

"...හෝ භූමිය ජීවත්වීමට සුදුසු ස්ථානයක් කොට එහි ගංගා නිර්මාණය කොට ඒ මත කඳු පිහිටුවා දෙමුහුද අතර බාධකයක් ඇති කළේ කවරෙක්ද? අල්ලාහ් සමග තවත් දෙවියෙක් සිටින්නේද? නැත. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් නොදනිති" (27:61)

"ගොඩබිමෙහි සහ මුහුදෙහි ඝන අඳුරේ ඔබට මග පෙන්වන්නා කවරෙක්ද? ඔහුගේ මහා කාරුණික භාවයෙහි සුභාරංචිය ලෙස සුළං එවන ඔහු කවරෙක්ද? ඔවුන් සමාන කරන දේට වඩා අල්ලාහ් අත්‍යුත්කෘෂ්ඨය. " (27:63)

(ඇ) ස්වභාව ධර්මයෙහි පවතින ක්‍රමික පිළිවෙළ ද අක්‍රමිකභාවයේ හා ව්‍යාකූල භාවයේ නොපැවැත්ම තුළින් අල්ලාහ් ගේ ඒකත්වය ස්ථිර කරන පාඨයන්.

හතරවන වර්ගයට අයත් පාඨයන් ලොවේ පවතින ක්‍රමානුකූල පිළිවෙළ තුළින් ඒක දේවවාදය තහවුරු කරයි. අප දැනටමත් විස්තර කොට ඇති ආකාරයට ක්‍රමානුකූල පිළිවෙළ යනු මැවීම් අතර පවතින සුහද සම්බන්ධතාවය වන බැවින් ස්වභාව ධර්මයෙහි පවතින පැහැදිලි ක්‍රමික පිළිවෙළ පිළිබඳ මිනිසා අනිවාර්යෙන්ම අද්විතීය වූ අල්ලාහ් ගේ පැවැත්ම පිළිගත යුතුය. එක ජීවියෙකුගේ මැවීම, අනෙක් ජීවීන්ගේ ස්වභාවික අවශ්‍යතාවයන් සපුරා ලීම සඳහා සිදු කරනු ලබන විටෙක මෙම සුහද සම්බන්ධතාවය තේරුම්ගත හැකි වන්නේය. සියලු ජීවීන්ගේ නිර්මාපකයා අද්විතීය වූ දෙවියෙක් වුවහොත් මිස, මෙය සිදුවිය නොහැකිය. ලෝකය, මැවුම්කරුවාණන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් විසින් නිර්මාණය කරනු ලැබ තිබුනේ නම්, මෙ මැවුම්කරුවන් විසින් එක් එක් වර්ගයට අයත් ජීවීන් මවනු ලබනු ඇත. එක් දෙවියෙකු විසින් මවන ලද නිර්මාණයන් කණ්ඩායම අනෙක් දෙවියන් විසින් මවන ලද කණ්ඩායමෙන් ස්වාධීන වූද කිසිම සම්බන්ධතාවයකින් තොරවූද වනු ඇත. එහෙයින් එක් ජීවීන් කණ්ඩායමක් අනෙක් ජීවීන් කණ්ඩායම වෙනුවෙන් මවනු නොලැබෙනු ඇත. මෙහි සංවිපාකය වශයෙන් ස්වභාව ධර්මයෙහි කිසිම සුහද සම්බන්ධතාවයක් හෝ ක්‍රමික පිළිවෙළක් පැවතිය නොහැකි අතර එවිට ලෝකය මහා විනාශයකට බැඳී සිටිනු ඇත. තවද අපි

බහුදේවවාදය පිළිගන්නේ නම්, අනිවාර්යයෙන්ම තවත් ප්‍රශ්නයකට මුහුණ දිය යුත්තෙමු. එනම්; බලයෙහි සහ අරමුණෙහි පවතින විරුද්ධභාවයයි. මෙවැනි ගුණාංගයන් ගෙන් අල්ලාහ් ස්වාධීන වන්නේය. පහත සඳහන් උපුටනයන් මෙ වර්ගයට අයත් පාඨයන්ගෙන්ය.

''අල්ලාහ් හැර ඒවාහී වෙනත් දෙවියන් සිටින්නේ නම්, ඇත්තෙන්ම ඔවුන් දෙදෙනාම ව්‍යාකූල තත්වයක සිටිනු ඇත. ස්වකීය රාජ්‍යයෙහි ස්වාමියාණන් වූ අල්ලාහ් ඔවුන් ආරෝපණය කරන දෙයින් සුවිශුද්ධය.'' (21:22)

''අල්ලාහ් ඔහුට පුත්‍රයෙකු නොගන්නේය. ඔහු සමග වෙනත් දෙවියෙකු නොවිය. එසේ වී නම් සෑම දෙවියෙකුම තමා විසින් මවන ලද දේ වෙන් කොට ගෙන ඔවුන්ගෙන් ඇතැමෙකු ඇතැමෙකුගෙන් උත්කෘෂ්ඨ වනු ඇත. ඔවුන් ආරෝපණය කරන දෙයින් අල්ලාහ් සුවිශුද්ධය.''(23:91)

ඉස්ලාමීය සම්ප්‍රදයෙහි ඒක දේවවාදය

සියලු කුර්ආනීය පාඨයන්; අල්ලාහ් දැන ගැනීමේ මූල ධර්මය, ඒක දේවවාදය සහ සෑම තනි පුද්ගල, සමාජයීය, ආර්ථික දේශපාලනික, සිවිල් හා දණ්ඩණීය නියමයන්ගෙන් සමන්විත වී ඇත්තේය. ඉස්ලාමයේ ඉගැන්වීම්; සියලු දෙය අද්විතීය වූ දෙවියාණන් වූ අල්ලාහ් විසින් මවන ලද්දේය යන කාරණය කෙරෙහි වූ විශ්වාසය මත පදනම් වී ඇත්තේය. අපට භාර දෙනු ලැබ ඇති ඉස්ලාමීය සම්ප්‍රදයයන් ද; කියමන්, අවවාද සහ එම විෂය පිළිබඳව වූ උපදෙස් වලින් සමන්විත වන්නේය. මෙවා ඉස්ලාමයේ උත්තම වක්තෘ නබිතුමාණන් හා ශ්‍රේෂ්ඨ ඉමාම් වරුන් විසින් ද කාලය, ස්ථානය හා ශ්‍රාවකයන්ගේ අවබෝධ කරගැනීමේ තරාතිරම යනාදියෙහි බරපතලකමට අනුකූලව ප්‍රකාශ කරනු ලැබ තිබෙන්නේය. පරිච්ඡේදය අවසානයේදී අපි මේ සම්ප්‍රදයයන්ගෙන් ඉතා කුඩා කොටසක් වාර්තා කරමු. සුදුසු අවස්ථාවන්හිදී මෙවා පිළිබඳව විස්තරාත්මකව සාකච්ඡා කරමු.

* ශ්‍රේෂ්ඨ වක්තෘ මුහම්මද් නබි (සල්) තුමාණෝ පැවසූහ:

''අල්ලාහ් ගේ ගුණාංග පිළිබඳව කල්පනා කරන්න. නමුත් ඔහුගේ ස්වභාවය පිළිබඳ කිසි දිනක කල්පනා නොකරන්න. ඒ, ඔහුව සිතා ගැනීමට (ග්‍රහණය කර ගැනීමට) ඔබ අපොහොසත් වන බැවිනි''.

* ඉමාම් සාදික් (රලි) තුමාණන් ඉදිරියේ මිනිසෙක් මෙසේ පැවසුවේය.

''අල්ලාහ් ශ්‍රේෂ්ඨය.''

- 'ඔහු කවරෙකුට වඩා ශ්‍රේෂ්ඨ වන්නේද?' ඉමාම් ඇසුවේය.

- 'සියළු දේට වඩා ' මිනිසා පිළිතුරු දුන්නේය.

-'ඔබ අල්ලාහ්ට ප්‍රමාණයක් ආරෝපණය කළෙහිය'. (ඔබ අනෙකුත් දේ සමග ඔහුව සංසන්දනය කළ බැවිනි.)

- '' එසේ නම් මා කෙසේ පැවසිය යුතුද''?

- ''පවසන්නඃ අල්ලාහ් කෙනෙකුට විස්තර කළ හැකි දෙයකට වඩා ඉතාමත් ශ්‍රේෂ්ඨය''.

* තමා පිළිබඳව වඩාත් හොඳින් දන්නා තරමටම ඔහු ඔහුගේ නිර්මාපකයාණන් පිළිබඳව වඩාත් හොඳින් දන්නේය.

ශ්‍රේෂ්ඨ වක්තෘ නබි(සල්) තුමාණෝ පැවසූහඃ '''මිනිසාව නිර්මාණය කිරීම අල්ලාහ්ව දැන හැඳින ගැනීම සමගම පවතින්නකි.'' වෙනත් වචන වලින් පවසන්නේ නම් මිනිසා ඔහුගේ නිර්මාපකයාණන් කෙරෙහි අවධානය යොමු කරන ආකාරයට ඔහු මවනු ලැබ ඇත්තේය. ශුද්ධවූ කුර්ආනයේ අල්ලාහ් අහස් හා පොළොව නිර්මාණය කළේ කවුරුන් දැයි ඔවුන් ගෙන් ප්‍රශ්න කරනු ලැබූ විට ඔවුහු ''අල්ලාහ්'' යයි පවසති' යැයි පවසා තිබීමෙන් පැහැදිලි වන්නේ මෙයයි.

සෑම මිනිසෙකුගේම ස්වභාවය වන්නේ දෙවියන් වහන්සේ සෙවීමේ ස්වභාවයයි. එහෙයින් අල්ලාහ් ගේ පැවැත්ම ඔප්පු කිරීම සඳහා කිසිම තර්කනයක් අවශ්‍ය නොවේ. ඔහුගේ ස්වභාවය තුළින් ඔහුට හැඟෙනා දේ ඔහු ප්‍රකාශ කරන ඉක්මනින්ම ඔහු අල්ලාහ් ව ස්ථිර කරන්නේය.

* ඉමාම් අලී (රලි) තුමාණන් මෙසේ පැවසූහ. අල්ලාහ් ගේ මැවීම් තුළින් අපට ඔහුව දැන ගත හැකිය. අපගේ ඥානය හා බුද්ධිය තුළින් ඔහුව අවබෝධ කර ගත හැකිය. සිත යොමු කිරීම තුළින් ඔහුගේ නියම, නීත්‍යානුකූලභාවය අපට තේරුම් ගත හැකිය.

* ඉමාම් සාදික් තුමාණන්ගෙන් මෙසේ ප්‍රශ්න කරන ලදී. 'අල්ලාහ් ගේ පැවැත්මෙහි හේතුව කුමක්ද?''

එතුමා මෙසේ පිළිතුරු දුන්නේය.''ඔහුගේ පැවැත්මෙහි හේතුව මගේම පැවැත්මයි. ඒ මන්ද යත් මාගේ පැවැත්ම මා විසින්ම මූලාරම්භ කරන ලද්දක් නම් භාව්‍යතාවයන් දෙකක් තිබෙනු ඇත: එක්කෝ මා පැවැත්මක් ලැබී තිබුණු තත්ත්වයකට පසුව මම මාව නිර්මාණය කර ඇත්තෙමි. මෙය දැනටමත් අත් කර ගත් දෙයක් ම අත් කරගැනීමට දරන උත්සාහයකි. (එනම්: යමක් දැනටමත් නිර්මාණය කරනු ලැබ ඇති විටක කෙනෙකු එය නිර්මාණය කළ හැක්කේ කෙසේද?) නැත්නම් මා පැවැත්මක් ලැබීමට ප්‍රථම මා නිර්මාණය කොට ඇත්තෙමි. මෙය ද සිදුවිය නොහැක්කකි. නොපැවැත්මක්, පැවැත්මකට උත්පත්තියක් දෙන්නේ කෙසේද? එහෙයින් මාව වෙනත් කෙනෙකු විසින් නිර්මාණය කර තිබිය යුතුය. ඔහු කවදත් පැවතුණු හා සදතනිකය. ඔහු අල්ලාහ්ය.

* යමෙක් ඉමාම් සාදික් තුමාගෙන් මෙසේ ඇසුවේය.

''කරුණාකර මට අල්ලාහ් ව හඳුන්වා දෙන්න.''

එවිට ඉමාම් සාදික් තුමා මෙසේ ඇසුවේය.

''ඔබ කිසියම් හෝ දිනක, රුවල් නැවක නැගී, බිහිසුණු කුණාටුවකට මැදිවී යාත්‍රා කරමින් සිටිද්දී, ඔබේ සුක්කානම ද නැතිවී, ඔබේ රුවල ඉරී ගොස් ඇති විටෙක, ඔබේ නැව ගිලී යන්නට නොදී පා කර ගැනීමට; ජීවිතයේ ආශාව අතහැර බලාපොරොත්තු සුන් වූ අයුරින්; උත්සාහ කරමින් සිටියදී, ඔබ ට කළ හැකි සෑම දෙයක්ම කළත් ඔබව තනිකර ගිලී යන මොහොතක ඔබ අධික ලෙස වෙහෙසට පත්ව, කර කියා ගත නොහැකි දෙයක් නොමැතිව, අසරණය වියරු වැටුණු රළ පහරෙහි අනුකම්පාව මත සිටි අත් දැකීමක් ඔබට තිබේද?''

'' ඔව්. වරක් මම ඒ අත් දැකීම වින්දෙමි.'' මිනිසා පිළිතුරු දුනි.

''ඒ සෑම බලාපොරොත්තු සුන් වීමක් තුළදී වුව ද, නමක් නොමැති, නොහඳුනන බලවේගයක් තවමත් මාව ආරක්ෂා කරනු ඇත යන බලාපොරොත්තුවේ මන්දලෝකය ඔබේ හදවතෙහි නොතිබුණේද? ඉමාම් ඇසුවේය.

''ඔව් එසේ තිබුණේය.'' මිනිසා පිළිගත්තේය.

-''එම බලය අල්ලාහ්ය.'' ඉමාම් පැවසුවේය.

ඉමාම් හුසෙයින් තුමා එතුමාගේ නැමදුම් ප්‍රාර්ථනයේදී මෙසේ පැවසීය. ''හවුල් කරුවාම තම පැවැත්ම සඳහා ඔබගේ අවශ්‍යතාවයෙන් පෙළෙන විට, අප ඔබට හවුල්කරුවෙක්ම තබන්නේ කෙසේද? ඔබට වඩා හෙළිදරව්වීමක් කවරෙකුට හෝ තිබනේනේද? ඔබව හෙළිදරව් කිරීමට සමත් වන්නේ ඔබමය. ඔබ ගුප්තව පැවති විට ඔබව සොයා ගැනීමට අපට මහ පෙන්වන්නෙක් අවශ්‍ය වන්නේය. ඔබ ඇත් වී සිටින කල දෘෂ්ඨාන්තයන් හා සාධක තුළින් අපි ඔබව සෙව්වෙමු. අන්ධ වන්නේ; තම නිර්මාපකයාණන්ව දැක ගත නොහැකි ඇසය. පරාජිතයා වන්නේ; ඔබගේ මිත්‍රත්වය බෙදා නොගත් පුද්ගලයාය.''

*වෙනත් නැමදුම් ප්‍රාර්ථනයකදී ඉමාම් හුසෙයින් (රලි) තුමා පැවසුවේය: සෑම දෙනාටම ඔබව දැන ගැනීමට සැළැස්වූයේ ඔබය. එමනිසා , ඔබව නොදන්නා කිසිවෙක් නොමැත. ඔබ මට සෑම දෙයක් තුළින්ම ඔබව සොයා ගැනීමට සැළැස්වූයේය. එහෙයින් සෑම දෙයක් තුළම මා ඔබම දකින්නෙමි. එනම්, ඔබ සෑම දෙයක් තුළම ප්‍රත්‍යක්ෂවී ද විද්‍යාමාන වීද සිටින්නේය.

*භෞතිකවාදියෙකු වන ඉබ්න් - අබී අව්ජා, ඉමාම් සාදික් තුමාව බැහැදකින්නට ගියේය. එතුමා ඔහුගෙන් ඇසීය.

'' ඔබ, බලධාරී වූ ද ඥනවන්ත වූ ද , විචක්ෂණයක් මගින් නිර්මාණය කරනු ලැබ නොමැත්තේද?''

'' නැත. මම නිර්මාණය කරනු ලැබ නොමැත්තෙමි.''

''ඔබට නිර්මාපකයෙක් සිටියේ නම් ඔහු ඔබව නිර්මාණය කරනු ඇත්තේ කෙසේද? ''

ඔහු පිළිතුරු දිය නොහැකිව පිටත්ව ගියේය.

අල්ලාහ් ගේ පැවැත්ම හා ඒකියත්වය පිළිබඳව ඉමාම් සාදික් තුමා විසින් කරන ලද දේශනයකින් කොටසක් පහත දැක්වේ.

''සර්වඥ වූ අල්ලාහ් ඔහුගේ මැවීම් වලට පහසුකම් සැලැස් වීම සඳහා ආලෝකය ලබාදෙන තාරකාවන් සැලැස් වූයේය. ඒවාහී ක්‍රමික චලනය මගින් මගීන්ට මඟ පෙන්වීම ද මුහුදු යාත්‍රිකයින් සාගරය මධ්‍යයේ අතරමං වීමෙන් ආරක්ෂා කිරීමටද සැලැස්වූයේය.''

තාරකාවන් වර්ග දෙකක් ඇත. : නිශ්චිත තාරකාවන් සහ ග්‍රහයන් වශයෙනි. පළමුවන වර්ගයට අයත් ඒවාහී ස්ථානයන් නිතරම නිශ්චිතය. (එනම්: තාරකාවක ස්ථානය, අනෙකුත් තාරකාවනට සාපේක්ෂව නොවෙනස්ව පවතී) දෙවන වර්ගයට අයත් වන්නේ එක් ග්‍රහ රාශි චක්‍රයක සිට අනෙකට ගමන් කරන්නා වූ ද ඒවාහී ගමන් මාර්ගයෙන් කිසි විටක බැහැරව නොයන්නාවූ ද තාරකාවන්ය. ග්‍රහයින්ට විශේෂිතවූ චලනයන් දෙකක් ඇත. එකක්, නැගෙනහිර සිට බටහිරට සිදුවන පොදු දෛනික චලනයක් වන අතර අනෙක එකිනෙක ග්‍රහයින්ට වෙන් වෙන් වූ ද බටහිර සිට නැගෙනහිරට සිදුවන්නා වූ ද චලනයයි. මෙය, වමේ සිට දකුණට චලනය වන ඇඹරුම් ගලක් මත දකුණේ සිට වමට චලනය වන කුඹියෙක් මෙනි. එනම් මෙම කුඹියාට සමකාලීනව චලනයන් දෙකක් පවතී. එකක්, කුඹියා විසින්ම චේතාන්විතව සිදු කරනු ලබන චලනය වන අතර අනෙක සිය කැමැත්තෙන් තොරව, ඇඹරුම් ගල විසින් ආපස්සට සිදු කරනු ලබන චලනයයි. දැන් ඇතැම් තාරකාවන් (අපගේ තත්ත්වයට සාපේක්ෂව) නිශ්චිත වන බව ද තවත් සමහර තාරකාවන් චලනය වන බව ද ඒවා යම් නිශ්චිත නියමයන්ට හා පිළිවෙළකට අනුකූලව චලනය වන බව ද සැළකෙන කාරණය අපට සාධාරණීකරණය කිරීමට හැකි වන්නේ කෙසේද? සර්වඥ වූ අල්ලාහ් ගේ උපක්‍රමය අප නොතකා හරින්නේ නම්, එවැනි පැහැදිලි ක්‍රමික පිළිවෙළක් ස්ථාපිත කරනු ලැබිය හැක්කේ කෙසේද?

අයුතු දෙයක් යැයි මානව ඥනයට පෙනෙන තරමට තාරකාවන්

ඒවාහි කකක්ෂයන් හී වේගයෙන් චලනය වේ. ඒවාහී ප්‍රඥප්තිය කිසිම ඇසකට එය දිහා බැලිය නොහැකි තරමට ඉතා ද ැඩිය. අපගේ ඇස් වලට ඒවායේ ආලෝකයෙන් කිසිම හානියක් සිදුනොවන ආකාරයට ඒවා හී චලනය දෙස අපට බැලිමට තරම් දුර ප්‍රමාණයක අල්ලාහ් ඒවා ස්ථාන ගත කොට ඇත්තේය. තාරකාවන් අපට සමීපව පිහිටියේ නම්; ඒවාහි එතරම් වේගවත් චලනය ද ප්‍රඥප්තිය ද අපගේ ඇස්වලට හානියක් සිදුකරනු ඇත. මෙය නිරන්තරයෙන්ම අහසේ ඇතිවන අකුණු වල ප්‍රතිඵලය ලෙස අපගේ ඇස්වලට හානි පැමිණ වීමට ඇති හැකියාව හා සමාන වන්නේය; තවද කාමරයක අසුන් ගෙන සිටින කිහිප දෙනෙකු වටේට සැහෙන ප්‍රමාණයකින් ආලෝකමත් විදුලි බුබුළු භ්‍රමණය වීමට සැළැස්වීමෙන් ඔවුන්ගේ ඇස් නිලංකාර වී මුළාවට පත්වෙන තත්ත්වයට ද සමාන වන්නේය.

අප ළිඳක සිට ජලය සුළං කාවයක් මගින් උඩ අදින්නේ නම්, සහ ලිඳේ පිහිටීම හා උපකරණ වල ව්‍යුහය, වත්තේ ගස්වලට නිසියාකාරව අඛණ්ඩව ජලය ලැබෙන පිළිවෙළකට සකස් කර තිබුණේ නම් , අපට වත්තට ජලය සැපයිය හැකිය. මෙම සුලං කවය හා උපකරන වල ව්‍යුහය දෙස බැලීමෙන් එය කිසිවෙකු විසින් නිර්මාණය කරන ලද්දක් හෝ සකස් කරන ලද්දක් හෝ නොවේ යැයි කෙනෙකුට සිතීමට හැකියාවක් තිබේද? බැලූ බැල්මට එහි ඥනවන්ත මිනිසෙකුගේ අධිෂ්ඨානය හා තහවුරු වන අතර මෙම උපකරන වල ව්‍යුහය බුද්ධිමත් හා කුසලතා පූර්ව මිනිසෙකු විසින් නිර්මාණය කරනු ලැබ ඇති බව අවබෝධ වේ. අප ජලය ඇදීමට භාවිතා කරන සුළං කවයක් එනම් ඉතා සරල හා ඉතා සුලු වූ දෙයක් මිනිසෙක් නිරීක්ෂණය කිරීමෙන් ඔහු එය ඉදිකළ තැනැත්තා ගැන සිතයි. එසේනම් කිසිම හානියක් හෝ අක්‍රමානුකූල බවක් හෝ විරාමයක් හෝ නොමැතිව අනන්ත සංඛ්‍යාන තාරකාවන් සහ ග්‍රහයන් ද ක්‍රමිකව සිදුවන දිනයේ උදව සහ රාත්‍රිය එළඹීමද, වර්ෂයකදී ඇතිවන ඍතු හතර යනාදිය දෙස බලමින් මිනිසා ක්ෂුද්‍ර වූ ද සුවිශාල වූ ද අනන්ත අප්‍රමාණ මැවීම් වල ඥනවන්ත නිර්මාපකයාණන් ව අවබෝධ කර ගැනීමට අපොහොසත් විය හැකිද?

* ඉමාම් සාදික් තුමා, භෞතිකවාදියෙකු වූ වෛද්‍ය වරයෙකු සමග කළ විවාදයෙන් කොටසක්:

''මවනු ලැබූ ඔබ, අල්ලාහ් ඔහුගේ නිර්මානයන් සැඟවී සිටින්නේ යැයි සිතීම ගැන මම පුදුම වෙමි. නොයෙකුත් මූල ද්‍රව්‍යයන් හා අංශු ඒකරාශී කොට ඔබව සංරචකව නිර්මාණය කිරීමෙන් ඔබ තුළවූ, අල්ලාහ් ගේ ස්ථිර නිර්මාණාත්මක ශක්තිය ඔබ පැහැදිලිව දකින්නෙහිය. ස්ථිර වශයෙන්ම ඔබේ බුද්ධිය, ඔබට සත්‍යය පවසන අතර ඔබට එය ප්‍රතික්ෂේප කළ නොහැකිය. මම මගේ ජීවය මත දිවුරා ප්‍රකාශ කරමි. ජනයා ඔවුන්ගේම නිර්මාණය ගැන කල්පනා කළේ නම්, ඒ සඳහා උපයෝගී කරගනු ලැබ ඇති ප්‍රත්‍යක්ෂ සංයෝග සංරචකයන් සහ නියමිත උපක්‍රමයන් ඔවුන් දැක ගනු ඇත. (නිර්මාපකයාණන් වන) ඔහු නොපැවැත්මෙන් පැවැත්ම, නිර්මාණය කර ඇති බව ඔවුහු වටහා ගනිති. තවද ඔහු ඔවුන්ගේ ශරීරයේ සහ ස්වභාවයේ වෙනස්කම් හා විපර්යාසයන් ඇති කරන බව ද ඔවුන්ගේ පෙර ජීවිතයට පසුව නව ජීවයක් ඔවුන්ට පිරිනමනු ලබන බව ද ඔවුහු වටහා ගනිති. මා පැවසූ දෙයින් ජනයා ඥානවන්ත නිර්මාපකයෙක් සිටින බව නිගමනය කරනු ඇත. ඔවුහු ඔහුගේ නිර්මාණ සංරචක වල උපක්‍රම වල සළකුණු නිරීක්ෂණය කරනු ඇත. මෙවාම දූරදර්ශී වූද, විචක්ෂණ වූද අද්විතීය වූද මැවුම්කරුවාණන් ගේ පැවැත්ම ඔප්පු කරන සාධකයන් වන්නේය. නිර්මාණයන් යම් බලයක් විසින් නිර්මාණය කරන ලද බව කියන මාගේ ප්‍රකාශය කෙරෙහි ඔබ විශ්මයට පත් වීද , ඒවා නොපැතුමෙන් පැවැත්මක් ලබා ගත් බව කියන ඔබගේ ප්‍රකාශය කෙරෙහි ඔබ විමතියට පත් නොවී ද සිටින්නේ කෙසේද? කුමන ප්‍රකාශය පිළිගත හැක්කේ දැයි විනිශ්චය කරන්න.'

අල්ලාහ් ව දැන ගැනීම පිළිබඳ ප්‍රශ්න අටක්

කුම් දේවධර්ම මධ්‍යස්ථානයේ විද්වතෙක් පහත සඳහන් ප්‍රශ්න, ඒවාට දෙන ලද පිළිතුරු සමඟ සකස් කොට අප වෙත එවා ඇත. එය මෙම පොතේ තේමාවට අනුකූල වන බැවින් පාඨකයන්ට වඩාත් ප්‍රයෝජනවත් හා උපකාරීවීම පිණිස මෙහි පළකරමු.

ප්‍රශ්නයඃ (1) ***අල්ලාහ් ගේ ගුණාංගයන් මොනවාද?***

පිළිතුරඃ අප සිරිතක් වශයෙන් අපගේ පැවැත්මෙහි පවතින පරිමාණයන්ගෙන් සෑම දෙයක්ම සංසන්දනය කරමු. එමනිසා, අප අපරිමිත වූද පරිපූර්ණ වූ ද අල්ලාහ් ගේ ගුණාංගයන් අපගේ සීමිත පැවැත්ම මගින් මැනීමට නිතරම උත්සාහ කරන්නෙමු. මෙසේ කිරීමෙන් නිශ්චිත වශයෙන්ම අපි යම් දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්නෙමු. අඟහරු ලොවේ ජීවීන් සිටින්නේ නම්, එහි සිටිය හැකි ජීවීන්ගේ ජීවී තත්ත්වය ගැන අපි උපකල්පනය කිරීමට උත්සාහ කළ ද අප නොයෙකුත් දුෂ්කරතා වලට මුහුණ පානු ඇත. සෞර ග්‍රහ මණ්ඩලයේ අනෙකුත් ග්‍රහයින් අතර, අඟහරු ග්‍රහයා, මිනිසුන් ඔවුන්ගේ අනාගත ගුවන් තරණයන් මගින් පා තැබීමට බොහෝ විට ඉඩ ඇති ග්‍රහයා වේ. එහි සිටිය හැකි ජීවීන් ගේ ලක්ෂණයන් ගැන අපට කල්තියා දැන ගත නොහැකි වන්නේ ඔවුන්ගේ ජීවී තත්ත්වය අපගේ තත්ත්වයට වඩා සහමුලින්ම වෙනස්වන බැවිනි.

අපට වඩා ආලෝක වර්ෂ මිලියන ගණනක් ඈතින් පිහිටි චක්‍රවාටයන් හි ජීවීන් පැවතුනේ යැයි සිතන්න . එවිට ඔවුන්ගේ ජෛව තත්ත්වය අපට උපකල්පනය කළ හැකිද? පිළිතුරු නිසැකයෙන්ම 'නැත ' යන්නයි. ඊට හේතුව අපේ දැනුම, අපේ පෘථිවි ගෝලයට සීමා වී තිබීමයි. අප නින්දේදී දකින්නේ අප විසින් දැනටමත් දැක ඇති දේවල ප්‍රතිබිම්බයක් වන බැවින් අපගේ ග්‍රහයේ පවතින දේට පරිභාහිර වූ දෙයක් අපට නින්දේදී වත් බලා ගත නොහැකිය. තවද මෙ සැම එකක්ම අදාල වන්නේ අපට සමාන ගුණාංග ඇති ජීවීන්ට පමණි.

නමුත් භෞතික ලෝකයේ සියලු මැවීම්වලට වඩා අති ශ්‍රේෂ්ඨ වූ අසීමිත පැවැත්මක ගුණාංග පිළිබඳව වූ අපගේ දැනුම ඇත්ත වශයෙන්ම සීමා සහිතය. අප දන්නේ, ඔහු පවතින බව; ඔහුගේ පැවැත්ම අසීමිත බව පමණකි. ඔහුගේ දැනුම, බලය සහ අනෙකුත් ගුණාංගයන් ඔහුගේ ස්වභාවය ලෙසම අසීමිතය. අල්ලාහ් ගැන වැඩි දුරටත් දැන ගැනීමට අප බලාපොරොත්තු නොවිය යුතුය. අපමෙන් භෞතික දෙයක් ලෙස සහ කාලයේ හා ස්ථානයේ පරිමාණ වලට සීමාවූ ලෙස ඔහු ගැන සිතීම හරිද?

පොදු තොරතුරු කාණ්ඩයක් ම අල්ලාහ් පිළිබඳව වූ දැනුමට අනුරූපතා දක්වන බව අපි නිගමනය කරමු. ඔහු සියල්ල දන්නා බව අපි දනිමු. නමුත් මේ තොරතුරු සියල්ල රැස්කර ගන්නේ කෙසේද? ඔහු අප සාමාන්‍යයෙන් කරන ආකාරයෙන් මොළය, ස්නායු පද්ධතිය සහ ආත්මය යනාදී උපාංගයන් මගින් ප්‍රත්‍යක්ෂ කරගන්නෙහිද? ඔහු ඇත්තෙන්ම එසේ නොවේ. ඊට හේතුව ඔහුගේ ගුණාංග අපේ ගුණාංග වලට සමාන නොවීමයි. ඔහුගේ පැවැත්ම මුළු මහත් මැවීම සම්භාරයට වඩා අති ශ්‍රේෂ්ඨය. අල්ලාහ්, පැවැත්මෙහි මූලාරම්භය වන බැවින් ඔහු, සියලු පරිපූර්ණත්වයන් එනම්; ජීවය, ඥානය සහ බලය යනාදියෙහි ප්‍රාරම්භකයා ද වන්නේය. අල්ලාහ් ගේ ජීවය ඥානය සහ බලය වැනි ගුණාංග; එවැනි ගුණාංග වලින් තොරව ඔහුව සිතින් සළකා බැලිය හැකිවන අයුරු ඔහුගේ පැවැත්මට පරිබාහිර වූවක් නොවේ. අල්ලාහ් ගේ ගුණාංග ඔහුටම අයත් ස්වභාවය හා සමාන වන බව අප පවසන්නේ එනිසයි. ඔහු සියලු පරිපූර්ණ ගුණාංගයන් සතුව සිටින්නේය; ජීවියෙකු ලෙස පැවතීමේදී අවශ්‍යයෙන්ම ඇතිවන සියලු දෝෂයන් හා ඌනතාවයන්ගෙන් ද අවශ්‍යතාවයේ සහ දුර්වලත්වයේ සළකුණු වලින් ද ඔහු ස්වාධීනය.

ප්‍රශ්නය (2): *අල්ලාහ් අදෘශ්‍යමාන වන්නේ ඇයි?*

පිළිතුරු: මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට ප්‍රථම අපි තවත් ප්‍රශ්නයක් නගමු. ලොවේ සෑම දෙයක්ම දෘශ්‍යමානද? තවද අපට යමක් දෘශ්‍යමාන නොවන්නේ නම් එකී දෙය කොහේත්ම නොපවතින බව අපි තීරණය කරන්නෙමුද? විද්‍යාව අපට නිසි පිළිතුර ලබාදෙයි. දෘශ්‍යමානව පවතින දේවල සංඛ්‍යාව,

අදෘශ්‍යමානව පවතින දේවල සංඛ්‍යාවට වඩා බෙහෙවින් අඩුය. අපට අවබෝධ කර ගත නොහැකි දේ සමග සංසන්දනය කරන විට; දෘශ්‍යමාන වර්ණය, ශ්‍රවණය කළහැකි ධ්වනි කම්පනයන් සහ අපගේ පංචේන්ද්‍රියයන් මගින් ප්‍රත්‍යක්ෂ කරගනු ලබන දේ ඉතාම සීමා සහිත වූද අල්ප වන්නේය. එමනිසා යම් දෙයක් ස්වභාව ධර්මයෙහි අදෘශ්‍යමාන වුවද එහි පැවැත්ම පිළිගැනීමට එයින් බාධාවක් නොමැත්තේය. ද්‍රව්‍යමය මැවීම් ප්‍රත්‍යක්ෂ කර ගැනීමට අපගේ පංචේන්ද්‍රියයන් අපොහොසත් වන බව අප පිළිගන්නා කල අල්ලාහ් ව බැලීම පිළිබඳ අප උදෙක්ම බලාපොරොත්තු වන්නේ කෙසේද?

දෘශ්‍යමානව පවතින්නේ කුමන ආකාරයේ දේ දැයි අපි බලමු. වස්තූන් ඇත්තෙන්ම මේ ඝනයට වැටෙන නමුත් සියලු වස්තූන් මේ ඝනයට නොවැටේ. අපට බැලීමට හැකියාවක් ලැබෙන්නේ, අපගේ දෘෂ්ටි පටලයේ පතිත වන වර්ණවත් දේ පමණයි. ඒ හැර අනෙකුත් වස්තූන් හා ද්‍රව්‍යයන් අපට කොහේත්ම දැක බලා ගත නොහැක. නිදසුනක් ලෙස, අපේ මනසේ කාවැදී තිබිය හැකි ගුරුත්වාකර්ෂණ බලයෙහි මූලධර්මය වැනි විද්‍යුත්මක මූල ධර්මයන් දැක බලා ගැනීමට අප බලාපොරොත්තු නොවිය යුතුය. අපි යම් සිදුවීම් වලින් වින්දනයක් ලබමු. ඇතැම් විට අන් අය සමග සිතේ අවුලකින් යුතුවද පසුවෙමු. මෙවැනි ප්‍රීතියක් හෝ ශෝකයක් දෘශ්‍යමාන ද ? ඇත්තෙන්ම ඒවා දෘශ්‍යමාන නොවේ.

දැන් අපි තවත් ප්‍රශ්නයක් අසමු: අල්ලාහ් භෞතික සත්තාවක් විය හැකිද? පිළිතුර 'නැත' යන්නයි. ඊට හේතුව සෑම භෞතික දෙයක්ම කාලය, ස්ථානය, තත්ත්වය, ප්‍රමාණය සහ අනෙකුත් බොහෝ තත්ත්වයන්ට සීමා වන්නේය. නමුත් අල්ලාහ් අසීමිත පැවැත්මක් වන්නේය. ඔහු කාලයෙන් සහ ස්ථානයෙන් ස්වාධීන වන්නේය. එමනිසා ඔහු අදෘශ්‍යමානය. තවද අල්ලාහ් ද්‍රව්‍යමය හා භෞතිකභාවයක් අත් කර ගෙන සිටියේ නම්; ඔහු භෞතික ලෝකයේ මූලධර්මයන්ට විෂය වස්තු වන්නේය. එමනිසා අල්ලාහ්ට භෞතික භාවයක් තිබිය නොහැකි අතර එහි ප්‍රතිඵලය වශයෙන් ඔහු අදෘශ්‍යමානය.

ප්‍රශ්නය (3): නැවත නැගිටුවන දිනයේදී අපට අල්ලාහ් දැක බලා ගත හැකිද?

පිළිතුර: ඉහතින් අප සඳහන් කළ දේ අනුව, පිළිතුර ඉතාම පැහැදලි වන්නේය. එනම් අල්ලාහ්ට මෙලොවදී හෝ ඉන් පසුව භෞතික භාවයක් නොමැති බැවිනි. මොලොවේදී හෝ අනෙකදී කාලය හා ස්ථානය කෙසේ වෙතත් අභෞතිකදේ අදෘශ්‍යමාන වන්නේය.

ප්‍රශ්නය (4) : *අල්ලාහ්ට වාසස්ථානයක් නොමැත්තේ ඇයි?*

පිළිතුර: මෙය දැනටමත් දෙවැනි සහ තුන්වැනි පිළිතුරුවලදී පිළිතුරු දී ඇත. එනම් ද්‍රව්‍යයකට අවකාශය අවශ්‍ය වන (Space) බැවිනි. ඕනෑම භෞතික දෙයක් අවකාශයෙන් කොටසක් අත් කර ගන්නා අතර කාලයටද විෂය වස්තු වේ. වෙනත් වචන වලින් පවසන්නේ නම්, වස්තුවේ ප්‍රමාණයද චලනයේ තරමෙහි ප්‍රතිඵලය ලෙස කාලයද අප සලකන්නේ නම් අවකාශය අර්ථවත් බවට පත්වන්නේය. කෙසේ වෙතත්, කාලය සහ අවකාශය (Time amd Space) යන දෙකම භෞතික දෙයක අවශ්‍යතාවයකි.

අල්ලාහ් භෞතික නොවන බව අප ඔප්පුකළ පසු ඔහුට වාසස්ථානයක් නොමැති බව තහවුරු වේ. ඒට හේතුව ඔහුට එසේ වාසස්ථානයක් තිබුණේ නම් ඔහු අනිවාර්යයෙන්ම ද්‍රව්‍යයක් වන අතර භෞතික ලෝකයේ මූල ධර්ම වලටද සීමා වන්නේය.

ප්‍රශ්නය (5): *අල්ලාහ් අභෞතිකව සිටියදී ඔහු මූසා ට සහ අනෙකුත් වක්තෘන්ට කථා කෙළේ කෙසේද?*

පිළිතුර: අල්ලාහ් කථා කළ බව අප පවසන විට එයින් මුඛය, දිව, ඌර්ධවකණ්ඨය සහ වාචික ස්වරයන්ගේ මාර්ගයෙන් ඔහු කථා කෙළේ කෙසේ දැයි අදහස් නොවේ. ඒ ඔහුට ශරීරයක් හෝ මුඛයක් හෝ දිවක් හෝ වාචික ස්වරයක් හෝ නොමැති බැවිනි. නමුත්, එයින්, මූසා ඔහුගේ හදවතට අනාවරණයවූ දේ ප්‍රත්‍යක්ෂ කර ගත් බව හෝ ඇතැම් විට අල්ලාහ් මූසාට ලබා ගත හැකි වන අයුරු වාතයේ හඬ, ස්වර තරංගයන් ඇති කළ බව අදහස් විය හැකිය. අල්ලාහ් සර්ව බලධාරී වන අතර එවැනි සරල තරංගයන් ඇති කිරීමෙ හැකියාව ඔහු සතුව පවති. මිනිසාට පවා, විද්‍යාත්මක උපකරණ භාවිතා කරමින් එවැනි ශබ්දයන් ඇති කිරීමෙ හැකියාව ඇත්තේය.

ප්‍රශ්නය (6) : *අල්ලාහ් සංයෝගයක් නොවන්නේ කෙසේද?*

පිළිතුර: මුල් ප්‍රශ්න වලට පිළිතුරු දීමේදී අල්ලාහ් භෞතික නොවන බව නිරීක්ෂණය කළෙමු. එය ඔහු සංයෝගයක් නොවන බවට ප්‍රත්‍යක්ෂ සාක්ෂියකි. සෑම සංයෝගයක්ම මූල ද්‍රව්‍යයන් කිහිපයකින් සමන්විත වන්නේය. නිදසුනක් ලෙස, අපගේ ශරීරයේ රුධිර නාල, මාංශපේශීන් සහ අස්ථීන් නිර්මාණය වීම සඳහා කාබනික මූල ද්‍රව්‍යයන් ඇත්තෙන්ම, නොයෙකුත් වෙනස් ස්ථානවල සිට පැමිණ අපගේ ශරීරය නිර්මාණය කිරීම සඳහා දායක වී ඇත. මෙම මූලද්‍රව්‍යයන් ශරීරය පුරා නොයෙකුත් සංයෝගවල ආකාරයෙන් විසිරී ඇති බව ඒ පිළිබඳව අවධානය යොමු කිරීමෙන් අපට දැක බලා ගත හැකිය.

එමනිසා සෑම සංයෝගයක්ම භෞතික විය යුතු අතර භෞතික ද්‍රව්‍යයකට අත්‍යවශ්‍යයෙන්ම කාලයද ප්‍රමාණයක් ද තිබෙන්නේය. නමුත් අප දැනටමත් පැවසූ පරිදි අල්ලාහ් භෞතික නොවන අතර කාලයට හෝ ප්‍රමාණයට බැඳී ද නොමැත්තේය. එමනිසා ඔහු මූල ද්‍රව්‍යයන් වල එකතුවක් ද නොවන්නේය. තවද සෑම සංයෝගයකටම එය සමන්විත වන මූල ද්‍රව්‍යයන්ගේ අවශ්‍යතාවයෙන් යුතුව පවතින්නේය. එනම් සෑම සංයෝගයක්ම එය සමන්විත වන මූල ද්‍රව්‍යයන්ගේ අවශ්‍යතාවයෙන් යුතුව පවතින්නේය. එනම් සෑම සංයෝගයක්ම එය සමන්විතවන මූල ද්‍රව්‍යයන්ගේ උත්සාහයක ප්‍රතිඵලයක් වන්නේය. ඊට පටහැනිව අල්ලාහ් මූල ප්‍රභවය වශයෙන් ද , සෑම දෙයකම මූල හේතුව සහ නිර්මාපකයාණන් වශයෙන් ද කිසිම දෙයක අවශ්‍යතාවයකින් තොරව ද පවතින්නේය. එසේ නම් ඔහු, මූලද්‍රව්‍යවල සංයෝගයක් වී ඒ සංයෝගවල උත්සාහයක ප්‍රතිඵලයක් වශයෙන් පවතින්නේ කෙසේද?

ප්‍රශ්නය (7) : *අල්ලාහ් සර්ව ව්‍යාපී වන්නේද?*

පිළිතුර: බොහෝ දෙනෙක් අල්ලාහ් කොහේ දැයි ප්‍රශ්න කරති. ඔහු සිටින්නේ පෘථිවියේද, අහස්හිද, චක්‍රවාටවලද ? එක් පැත්තකින් ඔවුන් නිවැරැදිය. ඊට හේතුව ඔවුන් සාමාන්‍යයෙන් කටයුතු කරන්නේ භෞතික දේවල් සමග වීමයි. සෑම භෞතික වස්තුවක්ම අනිවාර්යයෙන්ම යම් නිශ්චිත අවකාශයක් අත්පත් කර ගන්නේය. එය එතැන හෝ මෙතැන යම් තැනක තිබිය යුතුය.

එමනිසා ජනයා පුරුද්දක් වශයෙන් යම් දෙයකට යම් නිශ්චිත ස්ථානයක් ආරෝපණය කරන අතර ඔවුන්ට අල්ලාහ් නම ලැබූ විටද ඔවුන් ඔහුට භෞතික හා සීමිත පැවැත්මක් තිබෙන බව සළකා අල්ලාහ් සිටින්නේ කොහේදැයි ඔවුන්ගෙන්ම ප්‍රශ්න කර ගනිති. නමුත් අල්ලාහ්, අවකාශයක් අවශ්‍ය නොවන අභෞතික පැවැත්මක් බව; විශේෂිත ස්ථානයක සිටීමේ අවශ්‍යතාවය ඇතිවන ආකාරයේ සීමිත නොවන බව ; ඔවුහු තේරුම් නොගනිති. අල්ලාහ් අත්‍යන්තයෙන්ම අසීමිත වන අතර සීමාරහිත පැවැත්මකට විශේෂිත ස්ථානයක් අත්කර ගෙන සිටීමටද වෙනත් තැනක නොසිටීමද හැකියාවක් නොමැත.

අල්ලාහ් විශේෂිත ස්ථානයක් අත් කර නොගෙන සිටින බව අප පවසන විට, එයින් ඔහුගේ පැවැත්ම සියලු අවකාශයේ (වායූ, අංශු හා පදර්ථයන් අතර ද මැවීම් තුළ ද) පිරී පවතින පදර්ථයන් ලෙස කලෙක විශ්වාස කරන ලද ඊතර් හා සමාන වන බව අදහස් නොවේ. ඔහු ඉදිරියේ එක සමානව සැළකෙන මෙම ලෝකය හා සියලු ස්ථානයන්ට වඩා ඔහු අති ශ්‍රේෂ්ඨය.

අප මානව වර්ගයා භෞතික ලෝකයේ දරුවන් වන අතර අපගේ අවබෝධය ද ඉන් බලපෑමට ලක්වන බැවින් නිසැකයෙන්ම, මෙම යථාර්ථය තේරුම් ගැනීමට හා තහවුරු කර ගැනීමට බොහෝ දෙනෙකුට දුෂ්කර වන්නේය. එමනිසා ස්වභාව ධර්මයට ඉහළින් සිටින මෙම යථාර්ථය ප්‍රත්‍යක්ෂ කර ගැනීමේදී අපට මුලා වීමට හෝ දුෂ්කරතා වලට මුහුණ පෑමට හෝ සිදුවේ. නමුත් මෙම යථාර්ථය අවබෝධකර ගැනීමට අපට උදහරණ කිහිපයකින් ජනයාට උදව් කළ හැකිය. සම්පූර්ණ දෙයක් එහි කුමන හෝ කොටසකට වඩා විශාල බවද ; ත්‍රිකෝණයක කෝණ වල එකතුව අංශක 180 වන බවද; 2 ගුණ කිරීම 2, 4 වන බව ද; අපි දනිමු. දෙක ගුණ කිරීම දෙක හතර වශයෙන් පවතින්නේ කොහේ දැයි අපෙන් අසනු ලැබුවොත් අපි, පොළොවෙහි අහසෙහි සෑම තැනම බව වහාම පිළිතුරු දෙමු. මෙම කරුණ මූලධර්මානුකූලව කිසිම තැනක විෂය වස්තු වී නැත. එමනිසා, අල්ලාහ් සර්ව ව්‍යාපී යයි අප පවසන විට ඉන් ඔහු සියලු ස්ථාන වලට වඩා අති ශ්‍රේෂ්ඨ වන බව අදහස් වේ. සියලු ස්ථානයන් ඔහු ඉදිරියෙහි සම තත්ත්වයක් භුක්ති විඳින අතර

කිසියම හෝ ස්ථානයක් වෙනත් යම ස්ථානයකට වඩා ඔහුට සමීප නොවන්නේය.

ප්‍රශ්නය (8): අල්ලාහ් සියල්ල දන්නේද?

පිළිතුර: මෙම සිත් ගන්නා සුලු ප්‍රශ්නයට පිළිතුරු දීමට ප්‍රථම අප දැනටමත් සඳහන් කළ ආකාරයට අප එනම්; නිර්මාණයන් හා ලෝකයේ නිර්මාපකයාණන් අතර පැහැදිලි වෙනසක් තිබෙන බව මතක තබා ගත යුතුයි. අපි සෑම අංගයකින්ම සීමා සහිත වෙමු. ඔහු සෑම අංශයකින්ම සීමා රහිත වන්නේය. කෙටි වාක්‍ය ඛණ්ඩයකින් ප්‍රකාශ කළ හැකි වෙනස්කම්, සියලු සාදෘශ්‍යය සමානකමක්ම බොඳවී යන ආකාරයට ඔහුගේ පැවැත්ම හා අපගේ පැවැත්ම අතරෙහි වූ විශාල ලෙස පුළුල් වූ පරතරයකින් සමන්විත වී ඇත්තේය. අප දැනටමත් පෙන්වා දුන් පරිදි එවැනි වෙනස්කම් වල පැවැත්ම ,'අල්ලාහ් ගේ ගුණාංග' යන තේමාව ඉතා සංකීර්ණ දෙයක් බවට පත්කරන අතරම එය ප්‍රයෝජනවත් සිත් ගන්නා සහ ඓශ්වර්යමත් බවට ද පත්කරන්නේය.

කෙසේ වෙතත් අපි අල්ලාහ් ගැන කථා කරන විට, අසීමිත, අපරිමිත හා අනාදිමත් යනාදී වශයෙන් වූ සංකල්පයන් පිළිබඳ සාමාන්‍යයෙන් සැළකිල්ලක් දක්වමු. එමෙන්ම ඔහු සියල්ල දන්නා බව අප පවසන විට, අහස් හි සහ පැවැත්මක් ලබන්නාවූ ග්‍රහයන්ගේද දැනටමත් අභාවයට ගොස් ඇති ග්‍රහයින්ගේ ද සක්වළයන්හී සිදුවන සියල්ල ඔහු හොඳින් දන්නා බව අපි අදහස් කරමු. මෙම සුවිශාල වූ ලෝකයේ, අවුරුදු බිලියන ගණනකට කලින් සිදුවූ විස්මෘතියේ අගාධයටම වැටී ඇත්තාවූ ද සිදුවීම් සියල්ල ද ඔහු දන්නේය. මෙම සුවිශාල වූ ලෝකයේ අනාගතයේදී අවුරුදු බිලියන ගණනකදී සිදුවීමට තිබෙන සිදුවීම් පවා ඔහු දන්නේය.

අල්ලාහ්ට දූරස්ථ බව හා සමීපත්වයයෙහි ද අතීතය හා අනාගතය ද කිසිම වෙනසක් නොදක්වයි. ඔහු මුළු මහත් නිර්මාණයන් වටලා වෙළා ගෙන සිටින්නේය. ඔහු සෑම දෙයක්ම දන්නේය. මෙම සුවිශාල වූ විශ්වය ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය ඉදිරියෙහි පෙනී සිටින අතර ඔහු සදාකාලිකයි. ඔහු කවදත් පැවතුණු හා අඛණ්ඩවම දිගටම පවතින සදතනික පැවැත්ම නොවේද? ඔහු

සදකල් නිත්‍යව පවතින්නාවූ සෑම මොහොතකදී සෑම තැනකම පෙනී සිටින්නා නොවේද?

නිතරම සෑම තැනම පෙනී සිටින බලයක් සෑම දෙයක් ම ස්වභාවයෙන්ම දන්නා අතර කිසි දෙයක් ඔහුගෙන් සැඟවිය නොහැකිය. අප සෑම වෙලේම සෑම තැනම පෙනී සිටින්නේ නම් අපි සෑම දෙයක්ම දැන ගන්නෙමු. නමුත් මෙහිදී කාල චක්‍රයෙහි අප යම් නිශ්චිත අවකාශයක් අත් කර ගෙන සිටින බැවින් ද එහි පවා අපගේ ජීවය සීමා සහිත වීම හේතුවෙන් අපගේ පැවැත් මද සීමාසහිත වන බැවින් ද මෙය අපට කළ නොහැක්කෙකි. අතීතය සහ අනාගතය යන පදයන්ට අර්ථයක් ලැබෙන්නේ කාලයේ සහ අවකාශයේ පවතින සීමාවන් නිසයි.

දූරස්ථ යයි අප පවසන්නේ අප හා යම් පරතරයක් ඇතිව පිහිටා ඇති අපි භෞතිකව පෙනී නොසිටින්නාවූ ස්ථානයකටය. සමීප යයි අප පවසන්නේ· අප හා ඉතා කෙටි පරතරයක් ඇතිව පිහිටි ස්ථානයකටය. අප සෑම තැනම පෙනී සිටින්නේ නම් සෑම දෙයක්ම අපේ අසලින්ම පිහිටන අතර දූරස්ථ බව හා සමීප බව යන්නට අර්ථයක් නොමැතිවනු ඇත. අතීතය වන්නේ අපගේ උත්පත්තියට පෙර වූ සම්පූර්ණ කාලපරිච්ඡේදයයි. අනාගතය යන්නෙන් අදහස් වන්නේ අපගේ සීමිත ජීවිත කාලයෙන් පසුව එළඹෙන කාල පරිච්ඡේදයයි. අප සහ ලෝකයේ සියලු සිදුවීම් නිත්‍ය ලෙස සදකල් පවතින්නේ නම් අතීතය සහ අනාගතය යන්නට අර්ථයක් නොමැති නොවේද?

අපට එළඹිය හැකි නිගමනය වන්නේ අල්ලාහ්, සර්ව ව්‍යාපී වන බැවින් ඔහු කවදත් පැවතුණු හා අඛණ්ඩවම දිගටම පවතින බවත් එහෙයින්, ඔහු සියල්ල දන්නා බවත්ය. කිසිවක් ඔහුගෙන් සැඟවිය නොහැකිය. තවද අප භෞතික ලෞකික වන බැවින් අපට අපව කාලයෙන් වෙන් කරගත නොහැකි අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් අපි ''සදතනික'' හෝ ''සදතනික දෙවියන් වහන්සේ'' එසේත් නැතිනම් අල්ලාහ්, සියලු කාලයන්ට ඉහළින් සිටින්නේය යන පදයන් සොයා ගත්තෙමු. කාලයේ නිර්මාපකයා ඔහුය; කාලයේ බලපෑමක් නොමැතිව ඔහු සියලු නිර්මාණයන් වටලා වෙළා ගෙන සිටින්නේය. තවද සියලු වස්තූන් හි නිර්මාපකයා සහ සියලු සිදුවීම්

වල නිෂ්පාදකයා ඔහුය. යම් උපකරණයක නිර්මාතෘ එය පිළිබඳව නොදැන සිටිය හැකිද?

"මැව්වේ කවුරුන් දැයි ඔහු නොදන්නේද? ඔහු, සියුම් විචක්ෂණ ඥානයෙන් දැන ගන්නා වන්නේය. ඔහු සියල්ල දන්නේය." (67:14)

හතරවන පරිච්ඡේදය

ඒක දේවවාදයේ තනි පුද්ගල හා සමාජයීය බලපෑම

අල්ලාහ් දැන ගැනීම ඉස්ලාමයේ පමණක් නොව සියලු දේව ධර්මයන් හිම පදනම න්නේ එයයි. මේ විෂයය කෙරෙහි මෙතරම් අනිවාර්ය වැදගත් කමක් දෙනු ලැබ ඇත්තේ ඇයි දැයි අප සොයා බැලිය යුතුයි. එය සියලු වක්තෘවරුන්ගේ ප්‍රථම ආරාධනයේ තේමාව විය; සියලු ආගමික නීතීන් හා අණ පනත් මේ තේමාවට සහයෝගය දැක්වූ හා ඒ මත පදනම් වූ බැවින් අල්ලාහ් කෙරෙහි විශ්වාස නොකරන්නේ නම් මුස්ලිම්වරයෙකු හෝ ආගමිකයෙකු ලෙස කිසිවෙක් සළකනු නොලබති.

මෙම ස්ථිර විශ්වාසය කෙරෙහි වූ වැදගත්කම, ඒ මත ඒතරම් අවධාරණයක් දක්වමින් මූලාරම්භ වන්නේ කොතනින්ද? එය හුදෙක් වාචික ප්‍රකාශනයක්ද, එසේ නැතිනම් එය හදවතෙහි ද පවතින විශ්වාසයක්ද? එය විශ්වාසයක් නම් මෙම විශ්වාසය හා මිනිසාගේ ක්‍රියාව සහ සදචාරය අතර පවතින සම්බන්ධතාවය කුමක්ද? ජීවිතයේදී, මිනිසාගේ ප්‍රබෝධයෙහි ප්‍රභවය විශ්වාසය නම් මෙම ප්‍රබෝධය කුමක් දැයි අපි සොයා බැලිය යුත්තෙමු. අල්ලාහ් දැනගැනීමට මිනිසා තුළ සම්පූර්ණ වෙනසක් හා වර්ධනයක් ඇති කර තිබෙන්නේ නම් මෙම වෙනස හා වර්ධනය අප සොයා බැලිය යුතුයි. එසේ නැතිනම් ඒකදේව වාදයේ වැදගත්කම හා තත්ත්වය මූලරාම්භ වන්නේ කොතනින්ද? මේ ප්‍රශ්න අපි කෙටියෙන් පරිශීලනය කර බලමු.

ඉස්ලාමීය මතය අනුව සියුම් ලෙස පරිශීලනය කරන විට, වඩාත් පෘථුල ගැඹුරු විෂයයක් වූ ඒක දේවවාදය, සියලු ස්ථිර විශ්වාසයන්ට ආදර්ශ පාඨය ගොඩ නංවන්නක් පමණක් නොව, එය ජීවිතයේ සමාජයීය සදචාරාත්මක හා පවුල සම්බන්ධ වූ අංගයන් ටද මුල් බැස තිබෙන අතර , මේ සෑම ධාර්මික ක්‍රියාවන්, චරිත්‍රයන් හා විශ්වාසයන්ට විශේෂ අර්ථයක් හා වර්ණයක් ලබා දෙන්නේය.

ඉස්ලාමීය ශ්‍රේෂ්ඨ නායක මුහම්මද්තුමාණන් විසින් සම්පූර්ණ මෝක්ෂය ඒක දේවවාදය මත පදනම් කරනු ලබන තරමට ඉස්ලාමීය ඒක දේවවාදය අතිමහත් වැදගත්කමක් දරන්නේය. තවද එතුමාණෝ, මෙම විශ්ව ආරාධනය ඒක දේවවාදයේ හඬත් සමග ආරම්භ කළ අතර නැවත නැවතත් මෙසේ කීහ.

''ආරක්‍ෂාවීමට අල්ලාහ් හැර වෙනත් දෙවියෙක් නැතැයි පවසන්න.''

ශුද්ධවූ කුර්ආනය, දේව වක්තෘන්ගේ පොදු පරමාර්ථය ප්‍රකාශ කිරීමේදී සහ ධර්ම පුස්තකයන් හි ජනතාවට සමාන වචනයකට අඩ ගැසීමේදී, දේව ධර්මවල සියලු අනුගාමිකයන් ගේ සමගියේ පදනම ලෙස ඒක දේවවාදය පිළිගෙන ඇත.

''පවසන්නඃ පුස්තකයේ අනුගාමිකයෙනි; අප හා ඔබ අතර සමාන කරුණු කෙරෙහි පැමිණෙන්න. (එනම්) අල්ලාහ් හැර අන් කිසිවකට අප වන්දනාමාන නොකළ යුතුය. ඔහුට සමාන ලෙස අන් කිසිවක් නොතැබිය යුතුය. අල්ලාහ් හැර සමහරු අන් අයව ස්වාමියාණන් කොට නොගත යුතුය. නමුත් ඔවුන් පැහැර හැරිය විට (ඔබ) පවසන්නඃ අප මුස්ලිම්වරුන් බවට ඔබ සාක්ෂි දරන්න.'' (3:63)

''ඇත්ත වශයෙන්ම අපි සෑම ජාතියකටම, අල්ලාහ් ව නමදින්න. සාතන්ව මඟ හරින්නැයි ප්‍රකාශ කරන වක්තෘන් කෙනෙකුව පහළකොට ඇත්තෙමු.''(16:36)

පහත සඳහන් කෙටි අධ්‍යනයෙහි කුර්ආනයේ විනිශ්චයන් සම්බන්ධව ඒක දේවවාදයේ තනි පුද්ගල හා සමාජයීය බලපෑම ගැන අපි පරීක්‍ෂා කර බලමු.

සමාජයීය බලපෑම

සියලු ජාතීන් ගේ ඒකමතිකත්වය හා සමගිය.

ඉස්ලාමීය ඒකදේවවාදය, සියලු ජනතාවගේ නිර්මාපකයා , පොදුවේ මුලු මහත් මැවීම් සියල්ලෙහි නිර්මාපකයාද වූ අල්ලාහ්- ඒකෝ වන බව අපට උගන්වයි. සියලු මැවීම් ඔහු නිර්මාණය කොට ඇත්තේය. ඔහු සියල්ල උත්පාදනය කරයි. ඔවුන්ගේ සතුට හා යහපත ඔහු පතයි. ඔහුගේ කරුණාව සහ ආශීර්වාදය සියල්ල වටලා වෙළාගෙන සිටී. එමනිසා මැවීමෙහි සහ කරුණාවෙහි මූලාරම්භය , ජනයින්ගේ සියලු උත්සාහයින් යොමු කරනු ලැබිය යුතු එක් ලක්‍ෂයක් වන්නේය.

''ඇත්ත වශයෙන්ම අප අල්ලාහ් ගේම වන අතර ඔහු වෙතම අපි පෙරලා යන්නෙමු.''(2:156)

බලාපොරොත්තුව, ක්‍රියාදමය සහ පරමාර්ථය එකම ස්ථානයකට යොමුවී ඇති විටෙක සියලු ජනතාව ඔවුන් එකම දෙවියන් වහන්සේගේ මැවීම් වන බව දැන ගනිති. ඔවුන් පියවර නැගිය යුත්තේ ඔහු දෙසටය. ඒ පිළිබඳව ඔවුනතර වෙනසක් හෝ භේදයක් තිබිය නොහැකිය.

''තවද ඔබගේ දෙවියන් වහන්සේ එකම දෙවියන් වහන්සේය. ඔහු හැර දෙවියෙක් නොමැත. ඔහු මහා කරුණිකය; පරම දයාබරය.''(2:163)

''.. මා හැර දෙවියෙක් නොමැත. එමනිසා මටම නමදින්න.''(21:25)

සාමානාත්මතාවය සහ සාධාරණත්වය

ඉස්ලාමීය ඒක දේවවාදයට අනුව අල්ලාහ්ට පරම බලය ඇත්තේය. ඔහුගේ දැනුමෙහි විෂය ක්ෂේත්‍රය සෑම දෙයක්ම වටලා වෙළා ගෙන තිබෙන අතර මුළු මහත් ලෝකය පාලනය කිරීමට හිමිකම ඇත්තේ ඔහුට පමණි. සෑම දෙයක්ම ඔහුගෙන් යැපෙන අතර ඔහුගේ ආඥාව ලෝකයේ එක් අන්තයක සිට අනෙකට නික්මෙන්නේය.

''රාජධානිය ඇත්තේ කවරෙකුගේ අතෙහිද ඔහු භාග්‍යවන්තයාය. සෑම දෙයක් කෙරෙහි ඔහුට බලය ඇත්තේය.''(67:1)

''අල්ලාහ්! වෙනත් දෙවියෙක් නැත. ඔහුට නමදින්න. (ඔහු) සදතනිකය. ස්වියව පවතින්නාය; ඔහු මත රැඳී සියල්ල පවතින්නේය.''(2:255)

''පෙර හා පසුව ඇති ආඥාවන් අල්ලාහ් ගේම වන්නේය.'' (6:62)

ඔහු සියල්ලලෙහිම හිමිකරුවා වන අතිශ්‍රේෂ්ඨවන්තයාය. ශ්‍රේෂ්ඨ බලය ඔහු සතුව පවතින අතර ඔහු සියලු ස්වාභාවික වටිනාකම්, සම්පත් හා සමෘධිය පරිපාලනය කරන්නේය. සියලු දයාදයන් ජනතා වෙනුවෙන් මවනු ලැබ අතර එය තනි පුද්ගල යාටත් සැමටත් සෙත සැළසීම සඳහාය.

ජලය, වාතය, වනාන්තර, ආකරයන්, ආහාර, ඇඳුම, වාසස්ථාන, රැකියාවන්, විවාහවීමෙ සහ දරුවන් ලබාගැනීමෙ අයිතිය යනාදී මෙ සියල්ලක්ම සියළු ජනතාවගේ සුබ සෙත සඳහා වන අතර අල්ලාහ් හැර අන් කිසිවෙක් මෙ දේවල පරම ස්වාමියා නොවන්නේය....... ජනතාව දිව්‍ය දයාදයෙන් ලාභ ප්‍රයෝජන ලැබිය යුතු ඔහුගේ මැවීම් වන්නෝය.... පුද්ගලික හිමිකාරත්වය සඳහා යම් නිශ්චිත නීති රීති , අන් අයගේ අයිතිවාසිකම හා සමානාත්මතාවයේ සහ සාධාරණත්වයේ මූල ධර්මයන් අනුව පනවනු ලැබ ඇත්තේය. අන් සියලු දෙනාම දිව්‍ය පරිත්‍යාගයෙන් ලාබ ප්‍රයෝජන ලැබිය යුතු ඔහුගේ සේවකයන්ය..... අන් අයගේ අයිතිවාසිකම හා සමානාත්මතාවයේ සහ සාධාරණත්වයේ මූලධර්මයන් අනුව පුද්ගලික හිමිකාරිත්වය සහ දේපල සඳහා විශේෂ සීමාවන් හා රෙගුලාසි පනවනු ලැබ ඇත්තේය. අවසාන ප්‍රතිඵලය ලෙස අල්ලාහ් ගේ අත්‍යුත්කෘෂ්ඨ බලය සියලු ජනතාවගේ අධිෂ්ඨානය සහ බලය අභිබවා යන අතර කිසියම් හෝ අවස්ථාවක ඒකාධිපතිවාදය මගින් ජනතාවට බලය ගත නොහැකිය. ඇත්ත වශයෙන්ම සියලු අධිකාරයන් සහ බලයන් දිව්‍ය නීතිය ඉටුකිරීමෙහි ලා පහසුකම් සළසමින් ද පොදු යහපතට සහායෝගය දක්වමින් ද ජනතාවට උදව් උපකාර ලබාදෙමින් ද ක්‍රියාත්මක විය යුතුය. එමනිසා, යම් නිශ්චිත ජනතා කොට්ඨාශයක් හෝ පංතියක් මගින් කරනු ලබන බලය මධ්‍යගත කිරීමෙහි විපාකය වශයෙන් පවතින පංති භේදය හෙලා දකිනු ලැබේ. ධනය මධ්‍යගත කිරීම, මහජන දේපල බලෙන් අත්පත් කර ගැනීම යනාදීය හේතුවෙන් මතුවන සියලු ආරවුල් සහ මතභේදයන් මුලිනුපුටා දමනු ලබන අතර ආර්ථික සහ සමාජ සාධාරණත්වයේ මූල ධර්මය අවසාන වශයෙන් ස්ථාපිත කරනු ලැබේ.

බුද්ධිමය සහ සමාජ ස්වාධීන ත්වය

ඉස්ලාමීය ඒක දේවවාදය අනුව අල්ලාහ් ප්‍රබෝධයේ ප්‍රභවයයි. එය ජනතාවට , දිව්‍ය දෘෂ්ඨාන්තයන් වන සළකුණු කෙරෙහි සිත යොමු කිරීමට ද නිර්මාණයන්හි සළකුණු කෙරෙහි සියුම් ලෙස අවධානය යොමු කිරීමට ද ආරාධනය කරයි. එමනිසා ඇත්ත වශයෙන්ම නිර්මාණයෙහි සිද්ධාන්තයන් සහ නීතින් මත ලෝකයේ

යථාර්ථයන් දැන ගැනීමට සම්පූර්ණ නිදහසක් ජනතාවට පිරිනමනු ලැබ ඇත. බුද්ධිමය වශයෙන් නොනිසි ලෙස ආත්මාර්ථය පිණිසම යොද ගැනීම සඳහා අල්ලාහ්ව දැන ගැනීමෙ පිළිවෙත අත හැරීමට කිසියම් ජනයින්ගේ සිතැඟියාව අනුගමනය කිරීමට ඔවුන්ට කිසි දිනක බලය දී නොමැත්තේය. තවද එය, මුතුන් මිත්තන්ව සහ ආගමික මූලාශ්‍රයන්ව අන්ධානුකරණය කිරීම හෙළා දකින අතර එය ෂිර්ක් බහුදේවවාදය වශයෙන් සළකයි.

''ඔවුහු අල්ලාහ් හැර ඔවුන්ගේ පූජකවරුන් ද පැවිද්දන්ද, මරියම් ගේ පුත් මසීහුද ස්වාමිවරුන් කොට ගත්හ. නමුත්, එකම දෙවියන් වහන්සේ පමණක් නැමදුම් කරන ලෙස ඔවුහු අණ කරනු ලැබූහ.'' (9:31)

කිසියම් ජනයින්, ලොවේ යථාර්ථයන්, නිවැරදි හා සත්‍ය දේ පිළිගැනීම වෙනුවට දූෂිත මතවාදයන් හා ගුරුකුලයන් අනුකරණය කිරීමට හා අනුගමනය කිරීමට අන්ධ ලෙස එකඟ වන්නේ නම් ඔවුන් ඒක දේවවාදයේ සහ අල්ලාහ්ට අවනතවීමෙ නිවැරදි මාර්ගයෙන් ඉවත්ව යනු ඇත. තවද ඔවුන් නිශ්චිත වශයෙන්ම මුළාවී යනු ඇත.

''පවසන්නඃ පුස්තකය හිමියනි! ඔබගේ ධර්මයෙහි අනිසි ලෙස සීමාව නොඉක්මවන්න. පෙර දූර්මාර්ගය ගත් ජනයාගේ සිතුවිලි අනුගමනය නොකරන්න. (ඔවුහු) බොහෝ දෙනෙක්ව දූර්මාර්ගයෙහි මෙහෙයවූ අතර (තමන් ද) නිසි මාර්ගයෙන් නොමග ගියහ.'' (5:77)

එනිසා, අල්ලාහ් කෙරෙහි විශ්වාස කරන ජනතාව කුමන හෝ ආකාරයක බුද්ධිමය සිරගත වීමකට ඉඩ නොදෙන අතර කිසි දිනක, බුද්ධිමය ලෙස එක තැන පල්වී සිටීමට හෝ ගල් ගැසී සිටීමට ඉඩ නොදෙති. ඔවුහු නිතරම මිථ්‍යා ඇදහීම්වල බලපෑමට ලක්නොවී සිටීමට ද උත්සාහ කරති. තවද තම අසාධාරණ දර්ශනයන් අන් අය මත බලහත්කාරයෙන් හෝ ප්‍රචණ්ඩකාරීව පටවන ජනයා සමඟ ද පුද්ගලික ලාභ ප්‍රයෝජනය සඳහා සහ ඔවුන්ගේම අරමුණට සහයෝගය ලබා ගැනීම සඳහා සහ ඔවුන්ගේම අරමුණට සහයෝගය ලබා ගැනීම සඳහා සහ ඔවුන්ගේ

අරමුණට සහයෝගය ලබාගැනීම සඳහා මහජන මතයෙහි වාසිය අවශ්‍ය කරන්නන් සමඟද සම්බන්ධ නොවීමට ඔවුහු උත්සාහ දරති.

ඔවුන් මෙසේ කරන්නේ නිර්මාණයන් හි සුවිශාල වූ ක්ෂිතිජය දෙස බැලීමට ද එහි අභිරහස් සහ මූලධර්මයන් අවබෝධ කරගැනීමට උත්සාහ කරමින්, විශ්වවේදය හා යථාර්ථය මත පදනම් වූ ලෝක දර්ශනය දැකීමට ද වන්නේය.

(ෂිර්ක්) බහුදේව විශ්වාසයේ අයහපත් බලපෑම

ශුද්ධවූ කුර්ආනය මගින් දුෂ්ඨ පීඩාවක් ලෙස හඳුන්වා දෙන තරමට ෂිර්ක් කුමන ස්වභාවයෙන් පැවතියද එය විශාල සමාජ කැළඹීම් වලට ආරම්භය වන්නේය.

''අහෝ! (ඔහුට සමානව) හවුල්කරුවන් ආරෝපණය කිරීම දරුණු පාපයකි.'' (31:13)

එය, මුෂ්රිකීන්වරුන් දුෂ්ඨයන් ලෙසට හඳුන්වයි.

''යමෙක් අල්ලාහ්ට (සමානව) හවුල්කරුවන් තබන්නේද, ඔහුට අල්ලාහ් ස්වර්ගය තහනම් කරන්නේය. ඔහුගේ වාසස්ථානය අපායයි. අකටයුතුකම් කරන්නන්ට උදව් කිරීමට කිසිවෙක් නොසිටිනු ඇත.'' (5:72)

''ඔහු හැර මම දෙවියෙක්මි' යි ඔවුන්ගෙන් යම් කෙනෙක් කියන්ද, අපි ඔහුට ඵල විපාකය වශයෙන් අපාය දෙන්නෙමු; අප අපරාධ කරන්නන්ට ද ඵල විපාක දෙන්නේ එලෙසය. '' (21:29) ඇත්ත වශයෙන්ම දුෂ්ඨ වූ පීඩාවක් යනු එය යථාර්ථයෙන් ඉවත්ව යන්නක් වන අතර යම් කෙනෙක් හෝ යම් දෙයක් කෙරෙහි අයුක්ති සහගත තත්ත්වයක් අයුතු ලෙස නියම කරනු ලැබූ විට සිදුවන්නකි. එහෙයින් අල්ලාහ් සමාන ලෙස හවුල්කරුවෙක් ආරෝපණය කිරීම යනු සිදුවීමට හැකියාවක් තිබෙන විශාලම අසාධාරණය වන්නා සේම මිනිසාගේ ආත්මයේ සහ සිතුවිල්ලේ ඇති විය හැකි නියම මාර්ගයෙන් ඉවත්ව යාමද වන්නේය. එය අවුල් සහගත තත්ත්වයන් සහ මුෂ්රික්වරුන්ගේ ආත්මයේ සාරධර්මයන්හී සහ යථාර්ථයන්හී මූලධර්ම වල කැළඹීමක් ඇති කරයි. මෙය යම් අයුරක අසාධාරණ විනිශ්චයක් සහ එය දුෂ්ඨ වූ

පීඩාවක් ලෙස පමණක් අර්ථ නිරූපණය කළ හැකි සිතුවිල්ලක් වන්නේය.

අල්ලාහ් ගේ පරම බලය හා භාරකාරත්වය, සමාජයක අඩුකොට සළකනු ලබන්නේ නම් ද එහි ජනතාව ඔවුන්ගේම ස්වෛරී අධිකාරිය හා අත්තනෝමතික පාලකයා ලෙස කිසියම් පුද්ගලයෙකු හෝ ජනතා පන්තියක් පිළිගන්නේ නම් ද දෙවනුව සඳහන් කළ තැනැත්තා තම යටත් වැසියන් අත්තනෝමතික ලෙස පාලනය කරන්නේ නම් ද එම සමාජය ඇත්ත වශයෙන්ම බහුදේව විශ්වාසී වශයෙන් සැළකිය හැකිය. ඒ මන්ද යත් ජනතාව ඔවුන්ගේ ස්වාමියා ලෙස හා ඔවුන්ගේ ශ්‍රේෂ්ඨ භාරකරු ලෙස එක් පුද්ගලයෙකු හෝ පුද්ගලයින් පිරිසක් පත් කරගෙන සිටින්නා බැවිනි. මෙය ඉස්ලාමීය ඒක දේවවාදය හා සර්ව බලධාරී අල්ලාහ් වෙත බලය මධ්‍ය ගත කිරීමේ මූලධර්මයන් හා පටහැනි වන්නේය. මෙවැනි අපගමනයක සංවිපාකය වශයෙන් ලෝකයේ බලය පසුපස හඹායන්නන්, මහජන මතය යටපත් කරමින්; අනෙකුත් ජනයින්ගේ දේපළ හා අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් ; ඔවුන්ගේ බලය ක්‍රියාත්මක කිරීමට පටන් ගනිති. මෙමු 'තව තව බලය සෙවීමේ ' සහ 'බලය ක්‍රියාත්මක කිරීමේ' උමතුව, සමාජයක අනන්ත අප්‍රමාණව සිදුවන දමරික ක්‍රියාවන්, ලේ වැගිරීම්, කොල්ලකෑම් සහ තදබල මර්දනය යනාදියට මූලාරම්භයක් ලබාදෙන අතරම එම සමාජයේ ජනතාව ඔවුන් වෙනුවෙන් මිනිසා විසින් නිර්මිත දෙවියන්ඔවුන්ම නිර්මාණය කරගනිති.

ඉඩම් වැනි සියලු ස්වාභාවික සම්පත් වල ඒකාධිකාරය, අනෙක් අයගේ අයිතිවාසිකම් හා දේවනීතින් පිළිබඳව අවම සැළකිල්ලක්වත් නොදක්වා යම් ජන පිරිසක් තබාගන්නේ නම් ඔවුහු ඇත්ත වශයෙන්ම අල්ලාහ්ගේ පරම ස්වාමිත්වය පිළිබඳ මූලධර්මයටද ස්වාභාවික පරම ස්වාමිත්වය පිළිබඳ මූල ධර්මයට ද ස්වාභාවික දයාදයන් හි සියලු ජනතාවගේ සහභාගිත්වයට ද විරෝධය පාති. මෙ අවස්ථාවේදී, ජනතාව අතරද සමාජයන් අතරද ඔවුන්ගේ උනන්දුව හා සැලකිල්ල පිළිබඳව පරස්පර විරෝධීතාවයන් සහ සට්ටනයන් හටගනී; ජනතාවගේ සහ

ජාතීන්ගේ අයිතිවාසිකම්, බලපෑම් කල හැකි වූ ද ප්‍රබල වූ ද කණ්ඩායම් මගින් උල්ලංඝණය කෙරෙනු ඇත; සෑම දෙයක්ම ආත්මාර්ථය පිණිසම යොද ගැනීම, ආක්‍රමණය සහ යුද්ධය යනාදී විනාශකාරී ක්‍රියාවන් හී අඩිතාලම ස්ථාපිත කෙරෙනු ඇත; තවද, ආර්ථික අසමානාත්මතාවයට අනුග්‍රහ දක්වන තදබල මර්ධනයන් උද්ගත වනු ඇත.

බල තත්භාව සහ බල අරගලය

''අල්ලාහ් පුතකු තෝරා නොගත්තේය. ඔහු සමග කිසිම දෙවියෙක් නොවූයේය. එසේ වුවහොත් සෑම දෙවියෙක්ම තමා විසින් මවන ලද දේ පිළිබඳව වීරයෙක් වනු ඇත. තවද ඔවුන්ගෙන් ඇතමෙකු ඇතමෙකුගෙන් උත්කෘෂ්ඨ වනු ඇත. ඔවුන් ආරෝපණය කරන සියල්ලෙන්ම අල්ලාහ් සුවිශුද්ධය.'' (23:91)

ෂිර්ක් හි ප්‍රතිඵලය භේදය හා බෙදීම වන්නේය. ස්වභාවයෙන්ම නොයෙක් කණ්ඩායම් වලට බෙද ඇති කල්පිත දෙවිදේවතාවුන් අනුගාමිකයන් අතරේ අඛණ්ඩ සට්ටනයක් පවතින්නේය. ඔවුනොවුන්ගේ ව්‍යාජ දෙවියා ආරක්ෂා කර ගැනීමට සෑම කණ්ඩායමක්ම අනෙක් කණ්ඩායමට එරෙහිව සටන් වදිනු ඇත; අනෙකා පරාජය කිරීම පිණිස සෑම ආකාරයේම අපරාධ ක්‍රියාවල සහ ආක්‍රමණ වල පිහිට පතනු ඇත.

මත ගැටුම් සහ විවිධ අරමුණු ඇති නායකයින්ගේ හිතුවක්කාරී ක්‍රියාවන්ට සහ මුළාවූ හදිසි ආශාවන්ට අවනත වීමේ ප්‍රතිඵලය ලෙස සට්ටන සහ බල අරගලයක් ඇතිවනු ඇත. ඒක දේවවාදය සහ යථාර්ථය මත පදනම් වූ තනි ලෝක දර්ශනය යටතේ, මෙම මත භේදයන් ක්‍රමානුකූලව අතුරුදහන් වනු ඇත. අදහස් වල යම් භේදයක් දිගටම පවතින්නේ නම් කිසිම කණ්ඩායමක් අනෙක හෙළා දකිමින් එකිනෙකා හා සටන් නොවදිති; සංවාදශීලීව එකිනෙකට සහයෝගීව කටයුතු කරමින් විශ්වයේ යථාර්ථයන් සොයා ගැනීමට සහ අවබෝධ කර ගැනීමට සාමකාමීව උත්සාහ දරති.

කැරලි කෝළාහල

''අල්ලාහ්ටම නමදින්න; ව්‍යාජ දෙවියන් අත් හරින්න;(යයි

ප්‍රකාශකරන්න) දූතයෙකු අපි සෑම ජනතාවටම එව්වෙමු. ' (16:36)

''ඇත්ත වශයෙන්ම මිනිසා ආක්‍රමණකාරීය. ඔහු ස්වාධීන බව ඔහු සිතයි.'' (96: 6-7)

අල්ලාහ් නැමදීම; ඔහු කෙරෙහි අඛණ්ඩව පවතින අවශ්‍යතාවයේ හැඟීම ද , ඔහුගේ කරුණාව, අනුග්‍රහය සහ දේව ආරක්ෂාව අයදීම ද , ඔහුගේ නීති නියමයන්ට අවනත වීමට හා ඒවා අනුගමනය කිරීමට කරනු ලබන උත්සාහය ද ජනතාවට උදව් උපකාර කිරීම හා පිරිසිදු භක්තිමත් ජීවිතයක් මෙහෙයවීම තුළින් මැවුම්කරුවාණන්ගේ තෘප්තිය ලබා ගැනීමට කරන උත්සාහය ද අඟවන්නේය.

නැමදීමද අල්ලාහ් කෙරෙහි පවතින අවශ්‍යතාවයේ හැඟීම ද අඩුවන කල්හි මිනිසා කැරළි කෝළාහල කරන අතර ඔහුට අවස්ථාවක් දෙනු ලැබූ විටක ඔහු ජනතාව තලා පෙළා කෲර ලෙස පාලනය කරනු ඇත. ඔහුගේ අහංකාර ගර්වය ද ස්වාර්ථවාදය ද තව තවත් අධික ලාභ ප්‍රයෝජනය සඳහා ඔහුගේ ගිජුකම ද ජනතාව තමාගේ වාසියට හරවා ගැනීමේ සැළැස්ම ජනතාව මත පැනවීමේ මානසික පීඩාව ද මගින් ජනතාවගේ අයිතිවාසිකම් සහ ලාභ ප්‍රයෝජන උල්ලංඝණය කිරීමට ඔහුව මෙහෙයවනු ලබන්නේය.

ඉන්ද්‍රියයන් පිනවීම හා වරදට පොළඹීම

'' තම ආශාවන් ඔහුගේ දෙවියා කරගත් පුද්ගලයා ඔබ දුටුවෙහිද? තවද අල්ලාහ් සිතාමතාම ඔහුව නොමග යවා ඔහුගේ ශ්‍රවණයේද හදවතේද මුද්‍රා තැබුවේය; ඔහුගේ දර්ශනයට ද ආවරණයක් ඇති කෙළේය. අල්ලාහ් (ඔහු සදෙස් යයි විනිශ්චය කළා) ට පසුව ඔහුට යහ මඟ පෙන්වන්නේ කවරෙක්ද? ඔබ කල්පනා කොට අවබෝධ නොකරන්නේද? '' (45:23)

අල්ලාහ් නැමදීම වෙනුවට ස්වාර්ථවාදය පවතින විටක ඉමහත් තෘෂ්ණාව, පෞද්ගලික ලාභ ප්‍රයෝජනයන් හා කාමුක ආශාවන් මිනිසාගේ වඩාත් ඇලුම් කරන දෙවියන් බවට පත්වන්නේය. එවිට ඔහු අන් අයගේ අයිතීන් පාගා දමා ඔවුනට කරන පාඩුව මත හෝ

එය ළඟා කරගැනීමට උත්සාහ දරයි. ධනය සඳහා මිනිසුනට ඇති දැඩි ආශාව නිසා ඔහුගේ පෞද්ගලික ලාභ ප්‍රයෝජනය ගැන පමණක් සිතන බැවින් අන් සියල්ලක්ම නොසළකා හැර එමගින් ඔහු යථාර්ථයෙන් සහ සාධාරණත්වයෙන් ඉවත්ව යන්නේය; ඔහු පීඩිත ජනයාගේ විලාපය ශ්‍රවණය කිරීමට අපොහොසත් වන අතර කාරුණික ජනයින්ගෙන් ලැබෙන උපදේශය කෙරෙහි අවධානය යොමු කිරීමට ද ඔහු ප්‍රතික්ෂේප කරයි; ඔහුට ලාභ ප්‍රයෝජනයක් ගෙන දෙන දෙයක් හැර අන් සියල්ල දෙස බැලීමට ඔහුගේ ඇස් වලට නොහැකි වන අතර සූක්ෂ්ම අන්තර් දෘෂ්ටිය ද තේරුම් ගැනීමේ ශක්තියද යථාර්ථ හැඟීම ද ඔහුට අහිමිවන්නේය. එවැනි මිනිසෙක් ස්ථිර වශයෙන්ම මුළාවී යන අතර නිවැරදි මාර්ගයෙන් ඉවත්ව ගමන් කරන්නේය.

අල්ලාහ් ගේ සමීපත්වය දියුණුවේ මූලයයි.

ඉස්ලාමය , බලයෙහි සහ අංග සම්පූර්ණත්වයෙහි ප්‍රභවය වන්නාවූද ලෝකයේ සියලු සළකුණු සහ බලයන් අඛණ්ඩව පවත්වාගෙන යන්නා වූ ද දෙවියන් වහන්සේ තම අනුගාමිකයන්ට හඳුන්වා දෙයි. ඔහුගේ ඥානය, අධිෂ්ඨානය, බලය අන් සියල්ලක්ම ඉක්මවා පවතින්නේය. ලෝකය පාලනය කිරීමෙහි කිසිම හවුල් කරුවෙක් ඔහුට සහාය වන්නේ නැත. වයෝවෘද්ධභාවය, දුර්වලත්වය, අවශ්‍යතාවය, දෝෂ සහිත බව, , විනාශයට පත්වීම සහ මරණය යනාදියට ඔහුව අභිබවා යා නොහැක; තවද ඔහු අති ශ්‍රේෂ්ඨ බලයයි; අති ශ්‍රේෂ්ඨ ඥානයයි; අති ශ්‍රේෂ්ඨ සමෘධියයි; අති ශ්‍රේෂ්ඨ පරිපූර්ණත්වයයි. එවැනි දෙවියන් වහන්සේ ගැන මුස්ලිම්වරුන් විශ්වාසය කරන අතර සමීපවීමෙදී මුස්ලිම්වරුන් ඔහු කෙරෙහි ඉලක්ක කර ගත යුතුය. මෙය දියුණුවේ ඉතා වැදගත් අභිරහස ද මිනිසාගේ ශුද්ධවූ ශිෂ්ඨාචාරය ද වන්නේය. ඒ මන්ද යත්:

මූල ධර්මයන්ට අනුකූලව, අසීමිත බලයක්, අපරිමිත ඥානයක්, අති ශ්‍රේෂ්ඨ අධිෂ්ඨානයක් සහ පරිපූර්ණ සමෘධියක් ගැන සිතේ මෙනෙහිකිරීම, මිනිසා මනෝමය ක්ෂිතිජයන් සහ අභ්‍යන්තර සූක්ෂ්ම ඥානය වඩාත් පුළුල් කරන අතර ඔහුට උතුම්වූ ද උදාර වූ ද මනුෂ්‍යත්වයේ ජීව සාරය ළඟා කර ගත හැකිය... මෙම විශිෂ්ඨ ජීව සාරය, උත්සාහය සහ ක්‍රියාකාරිත්වය සමග සම්මිශ්‍ර වූ විට මිනිසාට සෞභාග්‍යයේ සහ පරිපූර්ණත්වයේ දෙරටු විවර

වනු ඇත. එමනිසා ඕනෑම මුස්ලිම්වරයෙකුගේ යුතුකම වන්නේ මෙම අසීමිත බලයෙහි, ඥනයෙහි, කරුණාවෙහි පුළුල් විෂය ක්ෂේත්‍රය දැන ගැනීමයි.

මිනිසාගේ දෙවන යුතුකම වන්නේ මෙම පරිපූර්ණ ප්‍රභවය දෙස පිය නැගීම ද හැකි පමණ ඔහුට සමීප වීම ද වන්නේය. ඕනෑම මුස්ලිම්වරයෙකුගේ විනීත ශිෂ්ඨභාවයේ තරාතිරම අල්ලාහ් කෙරෙහි ඔහුගේ සමීපත්වය සම්බන්ධයෙන් ඇගයීම් කළ හැකිය. අපට විද්‍යාව, බලය, යුක්තිය, කරුණාව ස්වභාව ධර්මයේ අභිරහස් ගැන අප සොයා ගන්නා බොහෝ දේ, ලෝකයේ යථාර්ථය පිලිබඳව අප දන්නා බොහෝ දේ, පරම ඥානය සහ ඥානයේ ප්‍රභවය එනම්; අල්ලාහ් කෙරෙහි අප ළඟා වන ප්‍රමාණය යනාදී සෑම දෙයක් තුළින්ම අපට අල්ලාහ්ට සමීප විය හැකිය. ඒක දේවවාදී සමාජයක, බලය සහ ගරුත්වය අභිබවා යා හැකි තරමට අපි දිව්‍ය බලය සහ ගරුත්වය වැඩි කිරීම සඳහා ස්වාභාව ධර්මයේ පවතින බලයන් අභිබවා යා හැකි තරමට අපි දිව්‍ය බලය කෙරෙහි සමීප වන්නෙමු. යුක්තිය, සාධාරණත්වය වර්ධනය කිරීමට සහ පොදු ජනතාවගේ සමාජ අයිතිවාසිකම් වලට නව උද්යෝගයක් ලබාදීමට අපි වෙහෙසෙන තරමට නිර්මාපකයාණන්ගේ පරම යුක්තියට වඩාත් ආසන්නයේ සිටින්නෙමු. අවසාන වශයෙන් ජනතාවට අප පිරිනමන අනුග්‍රහයේ සහ සේවයේ තරමට අපි මහා කාරුණික අල්ලාහ් ගේ සමීපත්වයට වඩාත් ළඟාවන්නෙමු.

එනිසා, අල්ලාහ් කරා සමීප වන ගමන සම්බන්ධයෙන් දිව්‍ය පිළිවෙළෙහි ප්‍රතිඵල කුසල ක්‍රියා කිරීමට සහ පරිපූර්ණත්වය ළඟා කර ගැනීමට දරණ ශ්‍රේෂ්ඨ අඛණ්ඩ උත්සාහයකදී විද්‍යාමාන වේ. අනෙක් අතට අඥාන, දුර්වල, අවශතාවලින් යුත්, දූෂිත, පටු මනසිකත් යුත්, චපල සමාජයක් අල්ලාහ්ට බොහෝ ඈතින් පවතින්නේය. එවැනි සමාජයක ජනතාව කිසි දිනක ඔවුන්ව අල්ලාහ් ගේ ප්‍රියත්වයට ලක් වූ සේවකයන් ලෙස සැළකිය නොහැකිය. ඊට හේතුව අල්ලාහ් අඥාන බවින් දුර්වලත්වයෙන්, අවශ්‍යතාවලින් සහ නොහැකියාවෙන් ස්වාධීන වන බැවිනි.

ගුරුවරුන්ගේ අදහස්

ධර්ම දේශක ගුරුවරුන් විසින් ඒක දේවවාදය පිළිබඳ දෙන ලද පිළිතුරු හා දේවධර්මවාදය ඉගැන්වීමේ ක්‍රමයන් පිළිබඳ ඔවුන්ගේ යෝජනා වලින් මෙම පරිච්ඡේදයේ පිටු ආවරණය කෙරේ.

ප්‍රශ්නය: අල්ලාහ් ගේ පැවැත්ම තහවුරු කිරීම සඳහා ඔබ තෝරාගෙන ඇති ක්‍රමයන් මොනවාද?

පිළිතුරු දුන් ගුරුවරුන්ගේ සංඛ්‍යාව : 149

පිළිතුරු නොදුන් ගුරුවරුන්ගේ සංඛ්‍යාව : 6

දෙවියාණන් ගේ පැවැත්ම තහවුරු කිරීම සඳහා ඔවුන් සඳහන් කළ ක්‍රමයන්.

1. ක්‍රමික පිළිවෙළෙහි තර්කනය (මුළු සංඛ්‍යාව 76)

(අ) මිනිසා සහ ඔහුගේ ව්‍යුහය නිර්මාණය කිරීමේදී උපයෝගී කොට ගෙන ඇති ක්‍රමික පිළිවෙළ - ස්වසන ඉන්ද්‍රියයන්, ආහාර ජිර්ණ පද්ධතිය , රුධිර සංසරණ පද්ධතිය, ප්‍රජනන පද්ධතිය යනාදියෙහි ක්‍රමික පිළිවෙළ සර්වඥ වූ සංවිධායෙකුගේ පැවැත්ම පිළිගන්නා වූ ද , අඟවන්නා වූද වන්නේය.(මුළු සංඛ්‍යාව 33)

(ආ) සෞර ග්‍රහමණ්ඩලයේ සහ ආකාශ වස්තුවල ක්‍රමානුකූල චලනය (22)

(ඇ) විශ්වයේ පොදු යුක්තිධර්මතාවය සහ එහි පවතින්නාවූ සුහද සහයෝගිතාවය (21)

2. හේතුඵලත්වයේ මූලධර්මය (49)

(අ) ඕනෑම සිද්ධාන්තයකට හේතුවක් තිබිය යුතු අතර ලොවේ කිසිම දෙයක් මේ රීතියට ව්‍යාතිරේඛයක් නොවන්නේය. අපි සාමාන්‍යයෙන් ප්‍රතිඵලය තුළින් හේතුව සොයා ගන්නෙමු. ලෝකය යන සිද්ධාන්තය ගැන අප නිරීක්ෂණය කිරීමේ ප්‍රතිඵලය ලෙස අපගේ අවධානය මැවුම්කරුවාණන් වූ අල්ලාහ් කෙරෙහි යොමුවන්නේය.(මුළු සංඛ්‍යාව 40)

(ආ) හේතු දමය බෙහෙවින්ම එහි මූලය, හේතුවල මූල හේතුවෙහි සොයාගන්නා අතර විෂම චක්‍රය සහ පසුගමනය දෝෂදර්ශනයට ලක්වේ.(9)

3. මනුෂ්‍ය ස්වභාවය ඔප්පු කිරීම:

ප්‍රසාදයේ සහ කාරුණිකත්වයේ උල්පත වන මැවුම්කරුවාණන් කෙරෙහි අවධානය යොමු කිරීම මිනිසාගේ සහජ අවශ්‍යතාවයකි. (32)

4. අවශ්‍යතාවය සහ භාව්‍යතාවය ප්‍රදර්ශනය කිරීම:

අප ලොවේ දකින සෑම දෙයක්ම භාව්‍ය වන්නේය. එනම් කිසිම දෙයක ස්වීයව තමා විසින්ම පැවැත්මක් ලබා නොගන්නේය. ස්වීය පැවැත්මක් ඇත්තා වූ ද , එය මත අනෙකුත් පවතින දේවල් රැඳී පවතින්නා වූ ද, එහි අධිෂ්ඨානය සහ කරුණාව සොයා ලුහුබැඳ යන්නා වූද ලොවේ සියල්ලක්ම දෘශ්‍යමාන වන්නා වූද (ලෝකයේ පැවැත්මෙ) නිශ්චිත හේතුවක් ලෝකයේ පැවැත්මට තිබිය යුතුය.(20)

5. චලනය ප්‍රදර්ශනය වීම:

මුළු මහත් විශ්වයම චලනය වෙමින් පවතින්නේය. ඒ සඳහා පොළඹවන මූලාරම්භයෙකු, එනම්; අල්ලාහ් අවශ්‍ය වන්නේය. (14)

6. සම්භාවිතාවය ගණනය කිරීම:

කිසිම ප්‍රපංච සිද්ධාන්තයක් විද්‍යාමාන වීමෙ තත්ත්වයන් අහඹු ලෙස ආකස්මිකව සිදුවිය නොහැක. ඊට හේතුව, සම්භාව්‍යතා මූලධර්මය අනුව යම් නිශ්චිත තත්ත්වයක් අහඹු ලෙස ඇතිවීම බොහෝ විට අසම්භාව්‍ය වන්නේය. එනම සම්භාවිතාවය ශූන්‍යයට ආසන්න වන්නේය. (10)

7. දිව්‍ය කරුණාවෙ සාධනය :

ලෝකයේ ප්‍රපංච සිද්ධාන්තයන් සහ සිදුවීම් සංවිධානය කිරීමෙහි අපි ඥනාන්විත අරමුණක් හා සැළැස්මක් දකින විට, ඒවායේ විද්‍යාමානත්වයෙහි යම් නිශ්චිත කරුණාවක් හා අරමුණක් තිබෙන බව ද ලෝකය සැළැස්මකින් හා ගණනය කිරීමකින් තොරවූවක් නොවන බව ද තේරුම් ගනිමු. එම නිසා නියත ගණනය කිරීම් සහිත ලෝකය නිර්මාණය කළ සැළසුම්කරුවෙක් සිටිය යුතුය. (10)

8. අසම්පූර්ණ පැවැත්මක්; පරම, පරිපූර්ණ පැවැත්මක් ඔප්පු කිරීමෙ හොඳම සාධකය වන්නේය. මිනිසා තමා අසම්පූර්ණ හා

අවශ්‍යතාවලින් පෙළෙන බව තේරුම් ගනිමින් ස්වාධීන අධිෂ්ඨානයක් ඇති කර ගැනීමට ද පරිපූර්ණත්වය ළඟා කර ගැනීමට කැමැත්තක් දක්වන්නේය. එම නිසා ඔහුගේ අවධානය එහි සංවිපාකය වශයෙන් පරම පැවැත්ම, පරම පරිපූර්ණත්වය වන අල්ලාහ් කෙරෙහි යොමුවන්නේය. (6)

9. වඩාත් හොඳ සමාජ ක්‍රමය: අල්ලාහ් කෙරෙහි වූ විශ්වාසයේ ප්‍රතිඵලය ලෙස ගොඩ නැඟෙන්නේය.(6)

10. අභ්‍යන්තර සදචාරයන් පිළිගැනීම : අල්ලාහ් කෙරෙහි වූ විශ්වාසය මත පදනම් වේ. (4)

11. ලෝකය නිර්මාණය කරන ලද්දකි. වරෙක මේ ලොව නොපැවතුණු අතර පසුව එය පැවැත්මක් ලබා ගත්තේය. එමනිසා එයට හේතුවක් හා නිර්මාපකයෙක් අවශ්‍යය. (4)

12. අරමුණු නිෂ්ප්‍රභා වීම : ඇතැම් විට මිනිසා යමක් කිරීමට මනා සූදානමකින් සිටී. ඔහුගේ අධිෂ්ඨානය සහ චේතනාව තිබුණ ද එකී දේ ඉෂ්ඨ නොවේ. මෙයින් අන් සැමට වඩා ශ්‍රේෂ්ඨ අධිෂ්ඨානයක පැවැත්ම තහවුරු වන්නේය. (3)

13. අපි ඇතැම් විට අසාමාන්‍ය අවස්ථා නිරීක්ෂණය කරමු: නිදසුනක් ලෙස සුවකළ නොහැකි අසාධ්‍ය ලෙඩෙක් ප්‍රාතිහාර්යාත්මකව සුවය ලබයි. මෙයින් සියලු හේතුන් වලට සහ සාමාන්‍ය තත්ත්වයන්ට වඩා ශ්‍රේෂ්ඨ වූ දෙවියන් වහන්සේ ගේ පැවැත්ම තහවුරු වන්නේය. (1)

ධර්ම උපදේශක ගුරුවරුන් විසින් හඳුන්වා දුන් පරිදි දේවවාදය ඉගැන්වීමේ ක්‍රම:

1. පන්ති කාමරයේ තිබෙන වස්තු පෙන්වමින් සහ ප්‍රත්‍යක්ෂ උදාහරණයන් ගෙනහැර දැක්වීම තුළින්: නිදසුනක් ලෙස අපට ශිෂ්‍යයන්ගෙන් ප්‍රශ්න කළ හැකිය. කළුලෑල්ල හෝ ඒ මත ඇඳී ඇති රේඛාව ස්වයම පැවැත්මක් ලබාගත හැකිද? ඒ අයුරින්ම අපට මෙස, පුටු, කාමර, ගොඩනැගිලි යනාදී අනෙකුත් වස්තූන් ගැන ද ශිසුන්ගෙන් ප්‍රශ්න කළ හැකිය. එවිට අපි, මෙසේ අසමු: මේ සෑම

දෙයක්ම, නිර්මාණකරුවෙකු විසින් තනන ලද්දක් නම් කෙසේද විශ්වය ස්වාධීනව නිර්මාණය වූයේ?

2. ශිෂ්‍යයන්ට (ඔවුන් ගේ තේරුම් ගැනීමේ හා බුද්ධියේ මට්ටම අනුව) ජලය, වාතය යනාදී ස්වාභාවික දයාදයන් ගැන මතක් කිරීම මගින්: ඔවුන්ගේ ජීවිතය සහ පහසුව ඒවා මත රැඳී ඇති බවද, පෙන්විය යුතුය. මෙ අයුරින් අපට ශිෂ්‍යන්ගේ අවධානය සහ ලැදිකම සියලු දයාදයන් හී හිමිකරුවා වන අල්ලාහ් කෙරෙහි යොමු කරවිය හැකි අතර මැවුම්කරුවාණන්ට ආදරය කිරීමට ද උන්නඳු කරවිය හැකිය.

3. නිර්මාණයෙහි යන්ත්‍රණය සහ සංවිධානය කෙරෙහි ශිෂ්‍යයින්ගේ අවධානය යොමු කිරීම තුළින් (ශිෂ්‍යයන්ගේ තේරුම් ගැනීමේ හා බුද්ධියේ මට්ටමට අනුපාතිකව): විශේෂයෙන්ම මිනිසා සහ ඔහුගේ අවයවයන්, දවස, අන්ධකාරය සහ ශිෂ්‍යයන්ගේ එදිනෙද ජීවිතය සබැඳුණු අනෙකුත් දේ පිළිබඳව:

4. ''අල්ලාහ් දැන ගැනීම '' යන විෂය පිළිබඳව ශ්‍රේෂ්ඨ විද්‍යාඥයන් හා ගවේෂකයින් ගේ අදහස් හා කියමන් ඉදිරිපත් කිරීම තුළින්

5. මෝටර් රථ, ගුවන් යානා, ගුවන් විදුලි යන්ත්‍ර, යනාදී සොයා ගැනීම් පිළිබඳ මෙසේ ප්‍රශ්න කළ හැකිය. මේවා චින්තනය: සැළැස්ම සහ ගණනය කිරීමෙහි මැදිහත් වීමකින් තොරව නිෂ්පාදනය කරනු ලැබ තිබේද? පසුව අපිට ජීවීන් සහ ශාක වල විෂය ක්ෂේත්‍රයෙන් තෝරාගත් නිදසුන් සාකච්ජා කළ හැක. මේ ජීවීන් සහ ශාක අල්ලාහ් ගේ අධිෂ්ඨානයට අනුකූලව මවා ඇති බව නිගමනය කළ හැකිය.

7. අසන්නන්ට තේරුම් ගැනීමට හා ඒවායේ පිළිතුරු තහවුරු කර ගැනීමට සහාය වන ප්‍රශ්න ඇසීම මගින්: නිදසුනක් ලෙස අපට, මෙසේ ඇසිය හැකිය. සතුන් සහ ශාක ස්වාධීනව නිර්මාණය වී ඇත්තේද? එසේ නැතිනම් මැවුම් කරුවාණන් වන අල්ලාහ් ඒවා මැව්වේද?

8. සරල කථාන්තර කීම මගින්: වයෝවෘද්ධ කාන්තාවක් නූල් කටිමින් සිටියාය. ඇයගෙන් ඇය අල්ලාහ් දැනගත්තේ කෙසේදැයි

ඇසූවිට ඇය තම වැඩ නැවත්වූවාය. නූල් කටින යන්ත්‍රයේ චක්‍රයද නැවතුණේය. එවිට ඇය මෙසේ පැවසුවාය. ඇය චක්‍රය කරකැව්වේ නැත්නම් එහි කැරකවීම ද නතර වන්නේය. එසේ නම් කෙසේද විශ්වය පොළඹවන්නෙකු නොමැතිව කැරකවෙන්නේ?

තවද රජු සහ රජුගේ අවධානය අල්ලාහ් කෙරෙහි යොමුකිරීමට අවශ්‍ය වූ ඇමතිවරයාගේ කථාවද පැවසිය හැකිය. රජු සිරිත් පරිදි දඩයමේ යන ප්‍රදේශයෙහි මණ්ඩපයක් ඉදිකරණ ලෙසට ඇමති නියෝග කළේය. රජු ගොඩනැගිල්ල දුටු විට එය ඉදිකළ තැනැත්තා ගැන විමසීය. ඇමතිවරයා කිසිවක් නොදන්නා බව අඟවා මෙම මණ්ඩපය ඉබේම අහඹු ලෙස නැනුනු දෙයක් විය හැකි යැයි යෝජනා කළේය. රජු විමතියට පත්වී එය එසේ සිදුවිය නොහැකි යැයි කීවේය. එවිට ඇමතිවරයා, කුඩා ගොඩනැගිල්ලක් ඉබේම අහඹු ලෙස විද්‍යාමාන විය නොහැකි නම් අති විශාල වූ විශ්වය ඉබේම අහඹු ලෙස විද්‍යාමාන වන්නේ කෙසේ දැයි පිළිතුරු දුන්නේය.

9. වක්තෘන් වහන්සේලාගේ, ශ්‍රේෂ්ඨ ආගමික උතුමන් ගේ සහ මිනිස් සමාජයේ නායකයන්ගේ ජීවිතය, සදචාරය, ආත්ම පරිත්‍යාගය සහ කාරුණිකභාවය ගැන පවසා එවැනි කාරුණිකභාවයක් ඇතිවන්නේ අල්ලාහ් කෙරෙහි වූ විශ්වාසය හේතුකොට ගෙන බව අවධාරණය කිරීම තුළින්.

10. කුඹියා, මීමැස්සා, වේයා යනාදී ඇතැම් කෘමීන්ගේ ජීවිතය වටා පවතින ගුප්තවූ ප්‍රහේලිකාව පැහැදිලි කිරීම:

11. (ශිෂ්‍යයින්ගේ දැනුමේ හා තේරුම් ගැනීමේ තරාතිරමට අනුපාතිකව) තාරකාවන්, චක්‍රවාටයන් සහ ආකාශ වස්තූන් හි පවතින ක්‍රමානුකූල පිළිවෙළ පැහැදිලි කිරීම.

12. ශුද්ධවූ කුර්ආනයේ ක්‍රමයන් උපයෝගී කරගැනීම, සියලු පංති වල ජනයින්ගේ තේරුම් ගැනීම සඳහා ඉතාම ස්වාභාවික, පොදු හා සුදුසු වන්නේය. විශ්වයේ ක්‍රමික පිළිවෙළ හා මිනිසා නිර්මාණය කිරීම පිළිබඳ වූ කෙටි පාඨයන්ගෙන් සමන්විත කාණ්ඩයක් අපට තෝරාගෙන පරිවර්තනය කොට පැහැදිලි කළ හැකිය.

දේවධර්මය පිළිබඳ ගුරුහවතුන්

අල්ලාහ් යනුවෙන් ඇඟවෙන සත්තාව, වෙනත් කිසිම දෙයකින් උත්පත්තියක් ලබා නොගත් අතර ඔහුගේ පැවැත්මේ මූලාරම්භයාද, ඔහුම වන්නේය. එමනිසා ඔහු මූලාරම්භ වූයේ කොහි සිටද? ඔහුව ඉපද්දුවේ කවුරුන්ද යන ප්‍රශ්නයන් හාස්‍ය ජනක හා මෝඩ වන්නේය.

☆ ☆

සුවිශාල වූ චක්‍රවාටයක් වුවද ඉලෙක්ට්‍රෝනික අන්වීක්ෂයකින් පමණක් බලාගත හැකි වන අසීමිත ලෙස කුඩාවූ අංශුවක් වුවද මෙ සැම දෙයකම රීතිය, ගණනය කිරීම සහ අරමුණ ප්‍රකාශණය වී ඇත. මෙම අපූරු, ක්‍රමික පිළිවෙළ; අධිෂ්ඨානශීලී විධිමත් පාලකයා එනම් අල්ලාහ් පිළිබඳ තහවුරු කරන ප්‍රත්‍යක්ෂ සාක්ෂියයි.

☆ ☆

බුද්ධිමත් මිනිසෙකු භෞමික හා ආකාශ වස්තු දෙස බලා එතරම් විශාල ප්‍රමාණයක් වූ ග්‍රහලෝක හා ආකාශ වස්තු ඒවාහී අපූරු සැලැස්මෙහි ද එතරම් විශාල ප්‍රභේදයන්ගෙන් සමන්විත සතුන් ඒවාහි වෙනස් වූ සතුන්, ශාක සහ නිර්මාණයක් වූ ලෝකයේ අනෙකුත් බොහෝ අභිරහස් ද නිරීක්ෂණය කරන්නේ නම් විශ්වය නිර්මාණය කරන ලද්දක් බව ද එය නිර්මාපකයාණන් විසින් පාලනය කරනු ලබන බවට ඔහුට සම්පූර්ණයෙන්ම ඒත්තු ගැන්වෙන්නේය. ඔහු සියලුම නිර්මාණයන් හි දෙවියාණන් වන අතර ඔහු වැඳුම් පිදුම්, ආදරය හා දයකත්වය ලැබීමට යෝග්‍ය වන්නේය.

ලෝකයේ නිර්මාපකයාණන් වශයෙන් ද සියලුම නිර්මාණයන් හි ආරක්ෂකයා වශයෙන් ද අල්ලාහ් කෙරෙහි විශ්වාස කිරීම මිනිසාගේ සහජ ස්වභාවයෙන් කොටසකි. ඔහුව මිනිසා ඔහුගේ හෘද සාක්ෂිය තුළින්ම, වෙනත් කෙනෙකුගේ ඉගැන්වීමකින් තොරවම දැන ගනු ඇත. නිර්මාණය කරන ලද ජීවියෙකුට ස්වභාවයෙන්ම ඔහුගේ පැවැත්ම හෝ නොපැවැත්ම ප්‍රිය කරන නිපදවන්නෙකු හෝ නිර්මාපකයෙකු සිටිය යුත්තේමය.

මෝටර් රථ, රෙදිපිළි හෝ ගුවන් යානා නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් සැලැස්මක් හා නිර්මාපකයෙක් නොමැතිව නැතිය හැකිද? ඉංජිනේරුවන්ගේ සහ විශේෂඥයින්ගේ මැදිහත්වීමක් තිබුනේ නම් මිස කර්මාන්ත ශාලාවේ කිසිම කාර්යයක් ඉටුකළ හැකිද? මෙවැනි සම්භාවිතාවයන් සිදුවිය නොහැකි නම් ද එම සිදුවීම් වල සම්භාවිතාවය අපට පිළිගත නොහැකි නම් ද මුළුමහත් විශ්වය පිළිබඳ ව ද එම තීරණයට ම අදල කරගෙන පවත්වාගෙන නොයන්නේ ඇයි? එසේ කිරීමෙන් පහත සඳහන් ආකාරයට නිගමනය නොකරන්නේ මන්ද? එනම්: එවැනි සුවිශාල වූ අපූරු සංවිධානය ව්‍යුහයකටද ඥනාන්විත හා ප්‍රබල නිර්මාපකයෙකු සිටින්නේය. ඔහු පිටුපසින් සිටිමින් ඒවා මෙහෙය වන්නේය.

විශ්ව පැවැත්ම එහි නොපැවැත්ම හා සමාන වූයේ නම්, එනම්: පැවැත්මක් ලබාගැනීම සහ ලබා නොගැනීම යන අවස්ථා දෙකේදීම එකම තත්ත්වයක් පැවතියේ නම් අපි මෙම පැහැදිලි ප්‍රශ්නයට මුහුණ දෙමු. පළමු අවස්ථාව එනම්: පැවැත්මට ප්‍රමුඛත්වය දෙනු ලැබ ඇත්තේ ඇයි? සංවිපාකයක් වශයෙන් අප ජීවත්වන ලෝකය පැවැත්මක් ලබාගත්තේ ඇයි? සියලු ජීවීන්ගේ පැවැත්මේ සිට නොපැවැත්ම දක්වා ප්‍රිය කරන මූලාරම්භයක් ජීවීන්ට තිබෙන බව ද මේ මූලාරම්භකයා අල්ලාහ් වන බව ද දැන ගැනීම සාධාරණ නොවන්නේද?

කලින් නොපැවතුණු, සහ පසුව පැවැත්මක් ලබාගත් සියලු දේ පැවැත්මක් ලබාගැනීම සඳහා ඔවුන්ගේ හැකියාව හෝ ඉල්ලීම හේතුවෙන් පැවැත්මක් ලබා නොගත්හ. හේතුවක් නොමැතිව කිසියම් හෝ දෙයක් පැවැත්මක් ලබානොගන්නේය. සියලු හේතූන් මූලාරම්භවන්නේ සියලු හේතූන්හි මූල හේතුව වන අල්ලාහ් ගෙනි. ඔහු සියලු හේතූන්, ඵලයන්, ක්‍රියාවන් සහ ප්‍රතික්‍රියාවන් මවන්නේය. පාලනය කරන්නේය;

★ ★

පැවැත්මේ මූලාරම්භය වන ප්‍රධාන සහ මූල හේතුව අන් දෙයකින් පැවැත්මක් ලබා නොගත් හෙයින්, එහි මූලාරම්භය සඳහා වූ මූල හේතුව ගැන අපට අවධානය යොමු කළ හැකිය. පැවැත්මේ මූලාරම්භය අල්ලාහ් වන අතර එය පිරිනැමුවේ ඔහුය.

ඥානවන්ත මිනිසෙකු යම් වස්තුවක් දකින සෑම විටකම මේ ප්‍රශ්න තුනම ඇසීමට බැඳී සිටින්නේය.

1. එය කුමක්ද? එය කුමකින් සාදනු ලැබ ඇත්තේද?

2. එය කුමක් සඳහා සාදනු ලැබ ඇත්තේද? එහි ප්‍රයෝජනය කුමක්ද?

3. එහි නිර්මාපකයා කවරෙක්ද?

වයස අවුරුදු 4ක් හෝ 5ක් වන ළමයින් පවා ඇතැම් විට ඔවුන්ගේ දෙමව්පියන් ගෙන් විමසා ප්‍රශ්න කරති. මේ කුමක්ද? එහි ප්‍රයෝජනය කුමක්ද? එය සෑදුවේ කව්ද? යනාදී වශයෙනි. මෙම අප්‍රමාණවූ සළකුණු හෙවත් දෘෂ්ඨාන්තයන් දෙස බැලීමෙන් අල්ලාහ්; ලෝකයේ නියම නිර්මාපකයාණන්; අපට පහසුවෙන් පිළිගත හැකිය.

★ ★

බැලු බැල්මට අචල ලෙස පවතින පෘථිවිය ඇත්ත වශයෙන්ම චලනයවෙමින් පවතින්නේය. (එයට ඇත්ත වශයෙන් නොයෙකුත් වෙනස් වූ චලනයන් පවතින්නේය.) විකිරණයන් හි අනතුරුදායකත්වයෙන් පෘථිවිය වටා ඇති නොයෙකුත් වායූන්ගෙන් සමන්විත ඝන වායුගෝලය, පෘථිවි වාසීන් ආයුධ සන්නද්ධ ආරක්ෂකයෙකු ලෙස ආරක්ෂා කරන්නේය. මෙවැනි ක්‍රමික පිළිවෙළක්, උපක්‍රමයක් ස්ථාපිත කළ තැනැත්තා පිලිබඳව අපි අපගෙන්ම ප්‍රශ්න නොකරමුද?

★ ★

ලෝකයේ වැඩි කොටසක් ජලයෙන් ආවරණය වී ඇත. ජලයේ සහ තෙතමනය අවශ්‍ය වන විශාල භූමි භාගයෙන් පෘථිවියේ සෑමතැන විසිරී ඇත්තේය. ජීවය අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා සාගරයේ සිට අවශ්‍ය තරම් ජලය හා හුමාලය භූමි ප්‍රදේශයට ගෙන ඒම සඳහා මුල පුරන්නේ කුමන පූර්ව සැළැස්මක්ද?

★ ★

පරිඝනක යන්ත්‍රය සොයාගත් තැනැත්තා, මනුෂ්‍ය මොළයෙහි ව්‍යුහය ඔහුගේ සොයා ගැනීමට වඩා සියගණන් වාරයක් සංකීර්ණ බව පිළිගනී. සීමිත ගණන් කිරීම් පමණක් කළ හැකි මෙම යන්ත්‍රය, සැළසුම්කරුවෙකු ගේ මැදිහත්වීමකින් තොරවී නිෂ්පාදනය කරනු ලැබිය නොහැකිය.(මේ කරුණ සම්බන්ධයෙන් නිෂ්පාදනයට අවශ්‍ය වන සියලුම මූල ද්‍රව්‍යයන්, අමු ද්‍රව්‍යයන් නිතරම ස්වභාව ධර්මයෙහි පැවතියේය) මනුෂ්‍ය ශරීරය භෞතික හා රසායනික ගුණාංගයන්ගෙන් යුක්තව පවතින්නා සේම නිර්මාණයන්ගෙන් සමන්විත ලෝකය ඥනාන්විත, සර්ව බලධාරීවූ සැළසුම්කරුවෙකු නොමැතිව පැවැත්මක් ලබාගත් බව අප තර්ක කරන්නේ කෙසේද?

(අප අල්ලාහ් වශයෙන් හඳුන්වන) සාධාරණ විනිශ්චයකරුවෙකු නොමැත්තේ නම් ජනතාවගේ ක්‍රියාවන්, සදචාරය, යහඵල දීම, විපාක දීම යනාදිය අර්ථ ශූන්‍ය දෙයක් වනු ඇත. එමනිසා සමාජ අන්තර් ක්‍රියාවන් විශ්වාසය තැබිය නොහැකි හා සාධාරණ ක්‍රියාදමයක අවතීර්ණ නොවන්නේ වනු ඇත.

☆ ☆

වස්තුවක් පැවැත්මක් ලබාගැනීමෙ හෝ නොගැනීමෙ සම්භාවිතාවයක් ඇත. යම් දෙයක් යම් නිශ්චිත ආකාරයක පැවැත්මක් ලබා ගෙන ඇත්තේ එය නිශ්චිත වශයෙන්ම මැවුම්කරුවාණන්ගේ ක්‍රියාවෙනි. එම නිසා නිර්මාණයන්ගෙන් සමන්විත ලෝකය එහි මුළු මහත් විශාලත්වය සමඟ එසේම වන්නේය. ලෝකය ස්වාධීනව නිමවනු ලැබ චලනයක් ලැබ ගැනීමට නොහැකිය. එයට නිර්මාතයෙකු සිටිය යුතුය.

☆ ☆

අල්ලාහ් වශයෙන් පෙන්නුම් කෙරෙන්නේ පැවැත්මෙ සාරයයි. තමාගේ පැවැත්ම ස්වීයව ඇති කර ගත නොහැකි වන්නාවූ ද නොයෙකුත් හැඩ වලින් ද විවිධ ලක්‍ෂණ වලින් ද යුක්තව නිර්මාණය කරනු ලැබ ඇත්තා වූ ද මුළු මහත් නිර්මාණ සම්භාරයෙහි දෘශ්‍යමානත්වය කෙරෙහි, තම පැවැත්ම තමා විසින් ඇති කර ගත්තාවූ සත්තාවක් වන අල්ලාහ් ගේ බලපෑමක් මෙතෙක් නොතිබූ බව සහ වර්තමානයේද නොතිබෙන බව අපට පිළි ගත හැකිද?

☆ ☆

අල්ලාහ් කෙරෙහි සත්‍යයෙන්ම විශ්වාස කරන තැනැත්තා අල්ලාහ් විසින් නිර්මාණය කරන ලද ලෝකයේ සුචරිතය හා කාරුණිකත්වය කරා මිසක් ඉදිරියට ගමන් නොකරන්නේය. එවැනි විනිශ්චිත තීරණයක්, ඔහුගේ ආත්ම වර්ධනය පිටුපස ඇති වැදගත් වූ මෙහෙයුම් බලය පමණක් නොව තනි පුද්ගල හා සමාජයීය වශයෙන් සාමය සහ සමෘද්ධිය ළඟා කර ගැනීමේ එකම මාර්ගය ද වන්නේය.

☆ ☆

භාජනයක් හෝ ආයුධයක් හෝ වෙනත් යම් මිනිසාට ප්‍රයෝජනවත් වස්තුවක් ලෙස හැඩ ගන්වන ලද ගල් කැටයක් අප ස්වභාව ධර්මයේ හෝ කෞතුකාගාරයක දුටු විට අප මනසට වහාම ඇතිවන අදහස වන්නේ එම භාණ්ඩය යම් කෙනෙකු විසින් සාද තිබිය යුතු බවත් එය යම් නිශ්චිත ප්‍රයෝජනයක් සහ අරමුණක් සඳහා සාද ඇති බවත්ය.

දැන් අප අපේම ශරීරයේ විවිධ අවයවයන් දෙස සහ ලොවේ අනෙකුත් ජීවීන්ගේ අවයවයන් දෙස බලා සියුම්ව කල්පනා කර බැලූ විට අපට වහාම දැකිය හැකි දෙයක් වන්නේ, මේ සෑම අවයවයක්ම යම් විශේෂිත අරමුණක් සඳහා සකසා ඇත්තේ කෙසේද යන්නද ඒවා අරමුණු කර ගත් අදහස ඉටුකිරීම සඳහා ඒවාහී ගුණාංගයන් පැහැදිලිව අනුකූල වන්නේ කෙසේද යන්නද වේ. එමනිසා අපි විශ්වය ඥනවන්ත මැවුම්කරුවාණන් එනම් අල්ලාහ් විසින් නිර්මාණය කරන ලද බව නිගමනය කරමු.

☆ ☆

මිනිසා, අල්ලාහ් අවබෝධ කරගනියි; ඔහු ගැන කල්පනා කරයි; ඔහු ගැන විශ්වාසය කරයි; තවද ඔහු කෙරෙහි බලාපොරොත්තු තබා ගනියි. නමුත් මිනිසා භෞතික හා ලෞකික කටයුතු වල නියැළී සිටින විට ඔහුගේ මැවුම්කරුවාණන්ව නොසළකා හැරිය හැකිය. කෙසේ වෙතත් ඔහු භූමිකම්පාවක්, ලැව් ගින්නක් වැනි මහා විනාශයක් හෝ සුව කළ නොහැකි රෝගයකට මුහුණ දෙන විට ඔහු, ඔහුගේ තත්ත්වය දන්නා වූ ද, ඔහුට කාරුණික වන්නාවූද, ඔහු විශ්වාසය තබා ඇත්තා වූද අදෘශ්‍යමාන වූද බලවේගයකට අභියාචනා කරයි. එම බලය අල්ලාහ්ය.

☆ ☆

සූර්යයා, චන්ද්‍රයා සහ ප්‍රභාමත්වූ තාරකාවන් ගේ වටාපිටාව සහ බාහිර හෙළිදරව්වීම නිරීක්‍ෂණය කිරීමෙන්, ආකාශ වස්තූන් සියල්ල මවනු ලැබ ඇති බව ආබ්‍රහම් තර්ක කළේය. ආකාශ වස්තූන්, පැවැත්මක් ඇති ලෝකයේ නිර්මාපකයන් විය නොහැකි අතර ඒවා ද සර්ව බලධාරී සත්තාවකගේ බලපෑමට ලක් වන බව ඔහු ජනතාවට සිහිපත් කළේය. එමනිසා මුළු මහත් නිර්මාණ සම්භාරයෙහි මූලාරම්භකයා සහ සියලු චලනයන් හී හේතුව වන මැවුම්කරුවාණන් ගේ පැවැත්මක් තිබිය යුතුය.

☆ ☆

තාක්‍ෂණයේ මූල ධර්මය වශයෙන් ද පවතින නියතිවාදයේ මූලධර්මය අනුව නිශ්චල වස්තුවක් එය බාහිර බලයකට අනුව නිශ්චල වස්තුවක් එය බාහිර බලයකට ලක්වන තෙක් අචලව පවතී. එමනිසා අපි, චලනය මූලාරම්භ කරන බලවේගයන් පිටුපස ඇති ප්‍රාරම්භක මූලපුරන්නා කවුරුන් දැයි සොයා ගත යුතුය.

මිනිසා, ඔහුගේ මැවීම මෙන්ම ස්වභාව ධර්මයේ අනෙකුත් ජීවීන්ගේ මැවීම් ගැන සියුම්ව සිතින් විමසා බැලීමෙන් මෙම සුවිශාල සහ අභිරහස් සංවිධාන ව්‍යුහය, සීමිත බලයක කෘතියක් නොවන බව අවබෝධ කරගනී. මැවීම් සහ ලෝකයේ මෙහෙයවීම පැහැදිලි කිරීම සඳහා එකම විසඳුම සර්ව බලධාරීවූ දෙවියන් වහන්සේ ගේ පැවැත්ම කෙරෙහි විශ්වාසය තැබීමයි.

☆ ☆

නොපවතින්නාවූ ඕනෑම දෙයක්; එහි දෘශ්‍යමානත්වය සඳහා අවශ්‍ය කෙරෙන තත්ත්වයන් සහ හේතූන් එක් රැස්වූ විගස පැවැත්මක් ලබාගන්නේය. ඩෙකාර්ට් මෙසේ පැවසුවේය.' මම පැවැත්මක් ලැබ සිටින අතර මාව, මම නිර්මාණය නොකෙළෙමි. අනෙකුත් සියලු ජනතාවද මා මෙන්මය. එමනිසා ප්‍රබල සත්තාවක එනම් අල්ලාහ් ගේ අධිෂ්ඨානය අපව මැව්වේය.

ශුද්ධවූ කුර්ආනය, අපගේ වටාපිටාව, විශේෂයෙන්ම මැවීම් මනුෂ්‍ය ශරීර යාන්ත්‍රණයේ ව්‍යුහය සහ ඒවාහී ක්‍රමික පිළිවෙළ සිහිගන්වමින් අපව අල්ලාහ් දැන ගැනීම කෙරෙහි මෙහෙය වන්නේය.

ඇත්ත වශයෙන්ම ශරීරයන්, සූර්යයාගේ සහ චන්ද්‍රයාගේ චලනයන්, මිනිසාගේ වර්ධනය සහ අප ජීවත්වන ලෝකය පිළිබඳ විස්තරයක් කෙරෙහි අපගේ අවධානය යොමුකරවමින් එය මෙස් සඳහන් කරයි..''කල්පනා කරන ජනයාට, ඇත්ත වශයෙන්ම මෙහි නිමිති සළකුණු තිබෙන්නේය.''(13:3)

නිවසක් සහ එහි කුඩා ගෙවත්ත දුටු විට අපි අනායාසයෙන්ම එය සැදූ සහ සකස් කළ පුද්ගලයා ගැන සිතමු. නිර්මාණයන්ගෙන් සමන්විත ලෝකය දෙස බැලීමෙන් අපි, එය ඒවාහි ස්ථාපිත ක්‍රමික, නියත පිළිවෙළ සමඟ නිර්මාණය කළ බලධාරී අධිෂ්ඨානය ගැන නොසිතමුද?

الإستراتيجيات العامة لمؤسسة عصر الظهور

- الحرص على ضمان استقلالية المؤسسة وعدم انضوانها تحت أي تيار سياسي أو حزبي تحاشياً من المحسوبية أو الدخول في إستقطابات المرجعيات الدينية.
- مد جسور التعاون مع كافة الجهات والفعاليات واللجان التي تشاطرها في نفس النشاط والتطلعات وذلك في اطار القواسم المشتركة ونقاط الإلتقاء.
- الإبتعاد عن الصدام والتجريح والإثارات البغيضة وتجنب الإساءة للأديان وتكريس مبدأ التسامح الذي دعا إليه الإسلام.
- التركيز على الشريط الإسلامي كوسيلة فعالة ومؤثرة ومناسبة للعمالة الوافدة.
- عدم الترويج لأي شخصيات دينية أو تيارات سياسية أو اقتحام دهاليز السياسة على أن يكون جُل إهتمام المؤسسة منصب في إتجاه أهدافها الإجتماعية والتبليغية.

اللغات المتوفرة:

- الإنجليزية - الأندونيسية - الفلبينية- البنغالية - التاميلية - السنهالية - الهندية الأوردوية.

من نحن؟

مؤسسة إجتماعية تبليغية ترتكز نشاطاتها في دعوة الجاليات الأجنبية إلى الإسلام وفق مدرسة أهل البيت (ع) في إطار منظومة دعوية حضارية وضمن نظام مؤسسي متقن.

لماذا هذا الإسم (مؤسسة عصر الظهور)؟

لم يقع الإختيار على هذا الإسم من باب حتمية ظهور الإمام المهدي أرواحنا فداه في هذا العصر فإن لله عز وجل البداء والأمر كله، فلربما تقتضي مشيئة الله عز وجل أن يتأخر ظهوره في زمن لاحق لزماننا، ولكن جاءت هذه التسمية من باب الرجاء والتمني والترقب لظهوره الشريف في هذا العصر بعد تراكم علامات الظهور وتسارع وتيرة الأحداث الدالة و (الله العالم) على قرب ظهوره المبارك الأمر الذي يشحذ هممنا ويفجر طاقاتنا لنشر الثقافة الإسلامية المستقاة من أهل بيت العصمة (ع).

لماذا هذه المؤسسة؟

جاءت فكرة إنشاء هذه المؤسسة بعد الشعور بوجود فجوة واسعة لم تردم في مجال تعريف الجاليات الأجنبية بالإسلام وفق مذهب أهل البيت (ع) وتحسس واقع الدعوة الخجول في أوساطنا الإجتماعية والدينية إثر بروز حالة من التراخي في اتجاه حركة ترجمة وطباعة الكتب والإصدارات المنوعة باللغات الأجنبية فضلا عن تقييد حركة الدعوة في مجالات محددة وضيقة لا تنسجم مع حجم التحديات والتطلعات.

أهداف المؤسسة:

١ - تعريف الجاليات الأجنبية بالإسلام وفق مدرسة أهل البيت (ع).

٢ - تنمية الحس الدعوي والتبليغي لدى العوائل الكويتية وتشجيعهم على دعوة العمالة الوافدة إلى الإسلام.

٣ - تعريف أرباب الأسر بحقوق وواجبات الخادم وتعزيز القيم الإنسانية والأخلاقية بين الخادم والمخدوم.

٤ - الحد من مشكلات العمالة الوافدة الناتجة عن الجهل بالعادات والتقاليد الكويتية.

٥ - تقوية إيمان الشرائح المستضعفة ودرء الشبهات العقائدية عنهم.